# ගිජුලිහිණියා



ත්‍රාස - 07

# ජේම්ස් බොන්ඩ් - 2

5371

Scanned by CamScanner

## කතුවරයාගේ වෙනත් පොත්

ජේම්ස් බණ්ඩා 019 (අංක - 01)
ඩ්‍රැකියුලාගේ මනාලියෝ
තව ඩොලර් කීපයක් සඳහා
බදුල්ල එක්ස්ප්‍රස්
ඩ්‍රැකියුලා සිටුවරයා
සැඩ සුළඟ
එළිවන යාමය
කළුකපා එලිය
අන්ධකාරයේ කුමරයා ඩ්‍රැකියුලා
අග්නි වර්ෂා
ෆ්‍රැන්කන්ස්ටින්ගේ ශාපය
බැංකු හොරා
අලුගෝසුවාගේ හෝරාව
වනාන්තරයට අධිපති ටාර්සන්
ටාර්සන් සහ නැතිවුන අධිරාජ්‍යය

## *1 වන පරිච්ඡේදය*

**බ්‍රි**ගේඩියර් "M" මේසය යටි පැත්තේ තිබූ රහස් බොත්තමක් තද කල විගසින් විශ්මයජනක ලෙස බිත්තියේ පසෙකින් විවර වූ ෆයිල් කැබිනට්ටුවෙන් එක් ෆයිලයක් තෝරා මේසය මත තැබිය. උපැස් යුවල පැළඳගත් හෙතෙම සුපරීක්ෂාකාරිව ෆයිලයේ අඩංගු ලිපි ගොනුව පිටුවක් පාසා පෙරලමින් බලන්නට විය.

ඒ ලිපි ගොනුව හා සම්බන්ධ පුද්ගලයා ගැන හිතන විට එම්ගේ හිතට ආඩම්බරයක් දැනෙයි. එහෙත් ඒ සමගම සිත් තැවුලක්ද නිතැතින්ම ඇති වෙයි. ලංකා රාජ්‍ය ආරක්ෂක අංශයේ ඇති විශේෂ රහස් ඔත්තු සේවයේ ප්‍රධානියා හැටියට තමාට මෙතෙක් කල් කීර්තිමත්ව, රටට ජාතියට හතුරුකම් කරන්නට ආ විදේශීය බලවේගයන්ට එරෙහිව අහිත සටන් කොට ජය ගැනීමට හැකි වූයේ තමාගේ උපාය ඥානය, දක්ෂතාවය හෝ සටන් කිරීමේ හැකියාව පමණක් මුල් කොට නොවන බව හේ දනියි.

ශ්‍රී ලංකා රහස් ඔත්තු සේවයේ ප්‍රධානියා ලෙස හැම මෙහෙයක්ම සංවිධානය කලේ තමා වුවද විවිධ මෙහෙයන් සඳහා විශේෂයෙන් පුහුණුව ලැබූ ඔත්තුකරුවන් එම්ගේ 00 අංශයේ සේවය කලහ. අති දක්ෂ වරපුරුෂයන් වූ මොවුන් නිසා නොවේ නම් බ්‍රිගේඩියර් එම්ට මෙතරම් දස්කම් කල නොහැකි වනු ඇත.

එම්ගේ දක්ෂතම ඔත්තුකාරයන් අතුරෙන් ප්‍රධානියා ජේම්ස් බණ්ඩාය. 019 යනුවෙන් හැඳින් වූ මේ නිළධාරියා අමුතුම දිවි පෙවතක් ගෙන ගිය, ඔහුටම සීමිත ලොවක ජිවත් වූවෙකි.

අනෙක් තැනැත්තා අවි නිෂ්පාදක "Q" ය. ඔත්තු සේවයට කිව්ගෙන් සිදුවුනේ අනල්ප සේවයකි. ඔහුගේ විශ්මය ජනක අවි ආයුධ හා ආම්පන්න නොතිබෙන්නට බ්‍රිගේඩියර්ගේ හොඳම ඔත්තුකාරයා වන බණ්ඩාගේ ජීවිතය පවා හානිවන්නට ඉඩ තිබිණි. කිව් එතරම් දක්ෂ විද්‍යාඥයෙකි.

එම්ගේ සිත්ගත් අනිත් තැනැත්තා නම් මොහොතකට කලින් බ්‍රිගේඩියර් අතට ගත් ෆයිලය අයිති තැනැත්තා වන ජිමී කොරයාය. ජිමීගේ නම පවා සංවිධානයේ අයට හැරෙන්නට අනෙක් කාහටත් අභිරහසකි. ඔහු බ්‍රිගේඩියර්ගේ කිසියම් කර්තව්‍යයක යෙදී සිටින බව අනික් ඔත්තුකරුවන් දැන සිටි නමුදු ඒ කුමන කර්තව්‍යයක්ද යන්න හරිහැටි කිමට කිසිවෙක් දැන සිටියේ නැත.

ඒ කර්තව්‍යය දැන සිටියේ බ්‍රිගේඩියර් සහ ජිමී කොරයාත් පමණි. එය ඒ තරම් රහසිගතය.

ජිමී කොරයා තලතුනා වියෙහි පසු වූ පුද්ගලයකි. ස්ථූල දේහයකින් යුත් මොහුගේ මුහුණේ නිරන්තරයෙන්ම ප්‍රියජනක පෙණුමක් විය. ඔහුගේ මුව නිතරම අඩ සිනා රැල්ලකින් සැරසී තිබිණි. ඔහු කාගේත් හිතවත් මිතුරෙක් වූ අතර කාටත් පෙන්වූයේ දයාවකි.

කෙසේ වෙතත් ජිමී කොරයා බ්‍රිගේඩියර් එම්ගේ 00 අංශයේ විශේෂ නිලයක් දැරූ ප්‍රබල රහස් ඔත්තුකාරයෙක් විය. එම් ඔහු හැඳින්වූයේ "**ගිජුලිහිණියා**" යනුවෙනි.



ගිජුලිහිණියකු ගොදුරක් දුටු විට එය කරා පියාසර කරමින් කැරකෙන්නේ යම්සේද කොරයාද තමා වෙත පැවරුණු මෙහෙය අවසාන වනතුරු අස්වැසිල්ලක් නොලබන්නෙකි.

ඔත්තුකාරයෙකු ඒක පුද්ගලයෙක් නොවේ. ජීවිත ගණනාවක් එකට එක්ව සෑදුන ඔත්තුකාරයාට ඇත්තේ එක මුහුණක් නොවේ. මුහුණු දහස් ගණනකි. එය ඔහුගේ දක්ෂතාවයයි. ජිමී කොරයා ගැන කතා කරන විට ඔහුටද මුහුණු දහසක් ඇති බව අවිවාදයෙන් පිළිගත යුතුය.

යුද සේවයෙන් අස්වූවාට පසු 00 අංශයට එක් වූ කොරයා අවුරුදු පහළොවක් තරම් දිගු කාලයක් අප්‍රසිද්ධියේම 00 අංශයට සේවය කොට තිබිණි. එය ඔහුගේ ජිවන වෘත්තියයි. තමා ඔත්තුකාරයෙකු බව කිසිවකුට නොහැඟෙන්නට කටයුතු කිරීමට තලතුනා වියෙහි පසුවූ කොරයා පොහොසත් විය.

බ්‍රිගේඩියර් එම්, ජිමීගේ ෆයිලය වසා මදක් කල්පනාකාරිව ඉන්නා විට මේසය මත වූ නිල් පැහැති ටෙලිෆෝනය හැඬවිණ.

"හලෝ සිකියුරිටි සෙක්ෂන්!"

"ස්පිකිං 00 සෙක්ෂන්, රෙඩි!" එම්, රිසීවරයට කිය.

"සර් මිස්ටර් ජිමී කොරයා ඇවිත් ඉන්නවා" විමසීම් පුවරුවේ සිටි තරුණිය ඉන්ටර්කෝමය තුලින් කිවාය.

"එයාට එන්න දෙන්න ඇතුලට" එම්, රිසීවරය පහත හෙලා මේසය මත තිබූ ෆයිලය පසෙකින් තැබිය.

මෙතෙක් වේලා විමසීම් පුවරුව ලඟ සිටි කාරුණික පෙනුමැති මිනිසා තරුණියට ආචාරශීලී බවක් දක්වමින් පියගැට පෙළ දිගේ නැග සේවන මහලට ඇතුළු විය.

කොරිඩෝරයක් දිගේ ගිය හෙතෙම ගොඩනැගිල්ලේ රහස් ස්ථානයක පිහිටි බ්‍රිගේඩියර්ගේ කාමරය ඉදිරියට ගොස් එක්වරක් පමණක් දොරට තට්ටු කළේය. එය ඔහුටම විශේෂ වූ සංඥාවකි.

"එන්න ඇතුලට!"

බ්‍රිගේඩියර්ගේ කටහඬ ගැඹුරුය. විධානාත්මකය. පැහැදිලිය.

කොරයා වීදුරු දොර පස්සට තල්ලු කරගෙන කාමරයට ඇතුළු විය. ඇතුළුවනවාත් සමග දොර වැසී ගියේය.

"ගුඩ් මෝනිං ජිමී!" බ්‍රිගේඩියර් සුබ පැතිය.

"මෝනිං සර්!"

බ්‍රිගේඩියර් මෙතෙක් වේලා මෙනෙහි කරමින් පසු වුනේ මොහු ගැනය. ජිමී කොරයා එතරම් අමතක කළහැකි එසේ මෙසේ පුද්ගලයෙක් නොවේ. ලංකා රාජ්‍ය ආරක්ෂක දෙපාර්තමේන්තුවට ඔහුගෙන් සිදු වූ අප්‍රකට, එහෙත් වැදගත් සේවය අනල්පය.

"කොහොමද සුවදුක් ජිමී! තමුසෙ හොඳ සනීපෙන් ඉන්නවද?"

"ඔව්! ඒත් ටිකක් වයසට ගිහින්. කොහොම වුනත්



මගේ ජීවිතේ දිහා බලන කොට මම පුදුම වාසනාවන්තයෙක් සර්!'

බ්‍රිගේඩියර් සිනාසුනේය. කලාතුරකින් දක්නට ලැබෙන ඒ සිනාව කොරයාට ජීවා දුලබ් ද්‍රව්‍යයකි. ජිමී කොරයා උපැස් යුවල යටින් ඒ සිනා මුහුණ දෙස බලා සිටියේ එනිසා විය හැක.

බ්‍රිගේඩියර් හිස සලා වෙරුට් වර්ගයේ සුරුට්ටුවක අග ගිනියම් කර ගත්තේය.

"ඒක වාසනාවටයි කියලා හිතන්න අමාරුයි ජිමී. ජිමී මෙපමණ කාලයක් හොඳ සේවයක් ඉටු කළේත් ඒ තරම් කාලයක් ජීවත් වුනෙත් දක්ෂකම නිසා. දක්ෂකම මේ කාලේ මිනිස්සුන් අතර දුර්ලභ දෙයක්. ඒක කලාතුරකින් මිනිහෙකුට පිහිටන දෙයක්"

ජිමී සැනසුම් සුසුමක් හෙලිය.

'ඒක ඇත්තක් සර්! දැන් හැදෙන තරුණයන්ට ඉවසීමක් නැහැ. ඒ ගොල්ලෝ නිතරම බලාපොරොත්තු වන්නේ බලයෙන් ඉක්මනින් වැඩක් අවසාන කරන්න. ඒ නිසා ඒ අයගේ ආයුෂ බොහොමත්ම කෙටියි'

ජිමී, තම සගයා දෙස සිනුණු බැල්මක් හෙළුවේය.

'මේ තරම් හොඳ සේවයක් කරල ඉක්මනින්ම විශ්‍රාම යාම මට ප්‍රහේලිකාවක් ජිමී. ඒත් මේක ජිමීගෙම කැමැත්තෙන් කරන ඉල්ලීමක් නිසා මට ප්‍රතික්ෂේප කරන්නත් බැහැ'

'ඔව් සර්! මම මගේ කැමැත්තෙන්මයි විශ්‍රාම යන්නෙ.

ඒත් මේ රජ්ජාව කරන හැම කෙනෙකුටම විශ්‍රාම ලැබීමේ වාසනාව පෑදෙන්නෙ නැහැ. අකාලයේම මැරිල යනව. සියෙට එක් කෙනෙක් නැත්නම් දෙන්නෙක් ඕන නම් විශ්‍රාම ලබන්න තරම් වාසනාවන්තයෝ"

"ජිම්ගෙ කතාවෙත් ඇත්තක් තියනවා. මෙම අංශයේ කිසිම කෙනෙක් මීට ඉස්සරවෙලා පෑංෂන් ගිහින් නැහැ"

"අකාලයේ පරලොව ගියා මිසක්!"

එම්, අසුනෙන් නැගිට්ටේය. සිරුවෙන් සිටගත් ඔහු තියුණු දෙනෙත් කොරයා වෙත යොමු කලේය.

"ජිම් තමුසෙ දන්නවනේ මේ රජ්ජාවෙ හැටි. දීර්ඝ කාලයක් සේවය කලාට අපි ලක්‍ෂ ගණන් මුදල් තමුසෙට දෙන්න යන්නෙ නැහැ. නමුත් මේ තරම් දීර්ඝ කාලයක් තිස්සේ තමුසේ අපේ රහස් ඔත්තු සංවිධානයට කළ සේවය මම හැම විටම අගේ කොට සලකනවා!" යි පැවසූ බ්‍රිගේඩියර් තලතුනා වියෙහි පසුවූ තැනැත්තාගේ සුරත තදකොට අල්වා ගත්තේය.

"ජිම්! අපි තමුසෙගෙ පැන්ෂන් එක වශයෙන් සෑහෙන මුදලක් දෙනවා. ඒ හැරෙන්නට මගේ ගණනෙ අමතර මුදලක් තමුසෙ කියන ඕනෑම බැංකුවක තැන්පත් කිරීමට මම ලෑස්තියි. ඒක නව වයසට යනකොට පොලියත් එක්ක තමාට ලබා ගන්න පුළුවන්"

එම්, ජිම් කොරයාගේ පිටට තට්ටු කරමින් පැවසුවේය.

"සර්! මට කරපු උපකාරවලට මම ඔබ තුමාට සදා ණයගැතියි. දැන් ඉතින් මේ මුදලත් අරගෙන මට



නිවි සැණසිල්ලේ මගේ අවසාන කාලෙ ගෙවන්න පුළුවනි. බාහිර කරදරවලින් තොර, කදුරට නුවර එළියේ ඉඳල හැතැප්ම හතරක් ඈතින් තියන ගම්මානයකයි මගේ අවසාන කාලෙ ගත කරන්න මම බලාපොරොත්තු වෙන්නෙ. එතකොට තමා මගේ හිතට සැනසීමක් දැනෙන්නෙ"

"බොහොමත්ම අගෙයි ජිම්...! අවසාන කාලෙ සැනසීමෙන්, සැපෙන්, සුවයෙන් ගත කරන්න ලැබේවා කියා මම එක හිතින්ම ප්‍රාර්ථනා කරනවා. සමහර විට අපි නැවත වරක් මුණ ගැහෙන්න ඉඩ තියනවා...නේද?" බ්‍රිගේඩියර් පැවසීය.

"සර්! නුවර එළියේ නිවාඩුවකට ආවොත් සීතාඑළිය පැත්තෙ එහෙම එන්න. මම පදිංචියට යන්නේ එහාටයි. ගුඩ්බයි සර්!"

"ගුඩ්ලක්! ගුඩ්බයි!! ජිම්...!" බ්‍රිගේඩියර් කොරයාට සුභ පැතුවේය.

දීර්ඝ කාලයක් තිස්සේ රැකියාව කළ තැනින් ඉවත්ව යන සේවකයකු තම හාම්පුතා දෙස කෘතඥපූර්වක බැල්මක් හෙලන්නාක් වැනි බැල්මක් බ්‍රිගේඩියර් වෙත හෙලූ කොරයා කායාලයෙන් පිටවිය. ඔහු ඉතා ශාන්ත අන්දමින් පිටගැට පෙල බැස පහළ මාලයට ගොස් මහ මාවතට අවතීර්ණව කුලී මෝටර් රියකට නැංගේය.

කොරයා කාමරයෙන් පිටවී ගියවිට බ්‍රිගේඩියර් සුසුමක් හෙලීය.

"ඒ ගියේ නොම්මර එකේ මිනීමරුවෙක්! ඔහුගේ සේවය මින්පසු 00 අංශයට ලැබෙන්නෙ නැහැ!" යි ඔහු තමාටම කොඳුලමින් මේසය මත වූ ෆයිලය අතට ගත්තේය.

ෆයිලය මත කලු පැනකින් කතිරයක් සටහන් කළ බ්‍රිගේඩියර් එහි කෙළවරක ජිම් කොරයා සේවයෙන් විශ්‍රාම ලැබූ දිනය සටහන් කොට ෆයිලය යලි කැබිනට්ටුවේ තැම්පත් කලේය.

කලින් විවෘත වූවාක් මෙන් බොත්තම තද කල සැණෙකින් ෆයිල් කැබිනට්ටුව අතුරුදහන් විය. ඒ වෙනුවට එහි දක්නට ලැබුනේ සිමෙන්ති වලින් තැනූ බිත්තියකි.

බ්‍රිගේඩියර්ගේ සිතුවිලි තවමත් කොරයා වෙතම රැඳී තිබිණි. ඔහු දැන සිටි ඉතා දක්ෂ කුලියට මිනීමරන්නා ජිම් කොරයාය. රැකියාවට මිනීමරණ මෙවැනි තිස්පණ අප්ගෝසුවන් සොයා ගැනිම පහසු කාර්‍යයක් වුවද ජිම් ඉතා සන්සුන් ලෙස කිසිම හෝඩුවාවක් නොතබා මිනී මරන්නෙකි. අවුරුදු ගණනාවක්ම ඔහු රාජ්‍ය රහස් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඔත්තු සේවය වූ 00 අංශය වෙනුවෙන් රාජකාරි සඳහා මිනී මැරුවේය. ඒ එක මිනීමැරුමකුදු කෙසේ සිදුවිද? මිනීමරුවා කවුද යන්න මේ වනතුරු කිසිවෙකු දැන සිටියේ නැත. දැන සිටියේ දෙදෙනෙක් පමණි. ඒ දෙදෙනා නම් නියෝගය දුන් බ්‍රිගේඩියර් එම් සහ නියෝගය පැළිපැද ක්‍රියාවට පරිවර්තනය කළ ජිම් කොරයාය.

"ජේම්ස් බණ්ඩා කෙතරම් දක්ෂ වුවත් ජිම් මෙන් උපත් මිනී මරන්නෙක් නොවෙයි. ඒ නිසා ජිම් කොරයා නැතිවීම මට විශාල පාඩුවක්" බ්‍රිගේඩියර් තමාටම කොඳුලා ගත්තේය.



## 2 වන පරිච්ඡේදය

ජිම් කොරයා නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි සීතාඑළිය නම් කුඩා ගම්මානයේ පදිංචියට ගියේය. නිබඳ මීදුමෙන් වැසුණු කඳුපේලි වලින් වට වූ මේ සොඳුරු ගම්මානය නිවි සැනසිල්ලේ දිවි ගෙවීමට කදිම ස්ථානයකි. ජිම් නිවි සැනසිල්ලේ දිවි ගෙවීමට කදිම ස්ථානයකි. ජිම් කොරයාට දැන් අතිරේක ආදායමක් නැතත් විශ්‍රාම වැටුපෙන් සුව පහසු දිවියක් ගත කල හැකිය.

ගම්මානයේ කුඩා, එහෙත් පියකරු නිවසක් මිලදී ගත් ඔහු ප්‍රථමයෙන්ම එය මනාව සකස් කර ගත්තේය. විවාහකයකු නොවූ ඔහු තනිකඩයෙකුට ඔබින පරිදි එහි සෑම දෙයක්ම සූදනම් කලේය.

මෙහි පැමිණීමෙන් ප්‍රථම මාස තුන නොදැනුවත්වම ගෙවී ගියේ නිවස අලුත්වැඩියා කිරීමටත් බඩුබාහිරාදිය නිසියාකාර අන්දමින් පිලියෙල කිරීමට සහ ගෙදයනේ මල්පැල සිටුවීමටත්ය. ඒ හැරෙන්නට ඔහු එලවලු පාත්ති කිපයක්ද සකස් කලේය.

දැන් කොරයා ගත කරන්නේ පාළු නිහඬ දිවියකි. උදේ තින්දෙන් පිබිදෙන ඔහු සේවකයා විසින් දෙනු ලබන කිරි වීදුරුව පානය කොට මල්පැල හා එලවලු කොටුවට වතුර ඉසින්නට පටන් ගනී. ඉන්පසු ඒවාට සාත්තු කිරීමටත්, ඒවායේ සිටින කෘමීන් විනාශ කර දැමීමටත් කාලය යොදවයි.

මේවාට කාලය මිඩංගු කරද්දී ඔහුට වැඩි පාලුවක් නොදැණුන නමුදු මාස තුන පසුවත්ම ජිම් කොරයාට මහා පාලුවක් දැනෙන්නට විය. මල් පාත්ති ලස්සණ මලින් බරවී තිබේ. එළවලු කොටුවද සරුවට වැඩීගෙන එයි. එහෙත් දැන් ඒවාට වැඩි සාත්තුවක් අවශ්‍ය නොවන හෙයින් ජිමී කොරයාගේ දිවිය කම්මැලිකමට යොමු වී ගොස්ය.

"මහ මූසළ පාළුවක්...! මෙහෙම ඉන්න ගියොත් ඕනෑම මිනිහෙක් පිස්සු වැටෙනවා. ඒත් මට ආපහු නගරෙට යන්න නම් බැහැ. නගරේ බාහිර කරදර වැඩියි. මොනව කරන්නද? මේකෙම ඉදිමු මැරෙන කල්! මට ඕනා කරන්නෙත් සැනසිල්ලේ මැරෙන්න!"

මෙසේ කල්පනා කරමින් පසුවන අතර කොරයාට තවත් අදහසක් පහළ විය.

"සමහර විට මම මගේ අත්දැකීම් පොතක් වශයෙන් පළකළත් ඒකෙ තියෙන දේවල් කවුද විශ්වාස කරන්නෙ? කිසිම එකෙක් විශ්වාස කරන එකක් නැහැ. මටත් ඕන නැහැ ඒ අදුරු පිළිකුල් දේවල් මතක තියා ගන්න"

කොරයා පුදුම ගතිගුණ ඇත්තෙකි. ඔහු කිසිදාක මත්පැන් පාවිච්චි කලේ නැත. එපමණක්ද නොව ධූමපානයෙන්ද සම්පූර්ණව වැලකී සිටියේය. කිසිවෙක් විශ්වාස නොකළ හෙතෙම පුද්ගලික දිවියේදී කිසිවෙකුට හිංසාවක් නොකළේය. කෙනෙකුගේ දියුණුවට ඊර්ෂ්‍යා නොකළ හෙතෙම තම කාලය සේවය වෙනුවෙන් කැපකර සිටියෙකි.

"එක අතකින් මම හරි මෝඩයෙක්! අනිත් මිනිස්සු වගේ මටත් විනෝද්ංශයක් තිබුණ නම් කොච්චර හොඳද?"



දැනගත්දා සිටම ඔහු දත් එකම විනෝද්ංශය මිනී මැරීමය.

කොරයා දිග ඈණුමක් හැරියේය. පාලුව මුලු ගම්මානයම වසාගෙන සිටී.

"පාලුව යන්නත් එක්ක කප්පාදුකර දමන්න ඕන අර ක්‍රෝටන් පදුරු ටික" යි කියමින් ඔහු කප්පාදු කරන කතුර ගෙන මල් පදුරු ක්‍රමාණුකුලව හැඩයකට කපන්නට පටන් ගත්තේය.

මෙසේ ගස් කප්පාදු කරමින් පසුවන හවස් භාගයක ඔහු මුණ ගැසීමට අමුත්තන් දෙදෙනෙක් පැමිණියහ. ඔවුන් දිග වැහිකබා ලා කලු හිස්වැසුම් පැළඳ ගත් ජවසම්පන්න පුරුෂයන් දෙදෙනෙකි.

අමුත්තන් දෙදෙන තමා කරා ලඟාවනු දුටු නමුදු කොරයා මල්ගස් කප්පාදු කිරීම නතර නොකළේය.

"මිස්ටර් ජිමී කොරයා.....! අපි මේ ලංකාව පුරාම ඇවිද්දා ඔබව හොයා ගන්න. ඇයි මිස්ටර් මේ විදියට හැංගිලා අප්‍රසිද්ධව ජීවත් වෙන්නෙ?" අමුත්තන් දෙදෙනාගෙන් පළමුවැන්නා ඇසීය.

කොරයා අතු කප්පාදු කිරීම නවතා උපැස් යුවල සකසා ගත්තේය.

"තමුසෙලා එහෙනම් මාව හොයා ගත්තා? හොඳයි මාව මුණ ගැහෙන්න ආපු කාරණේ?" යී අසමින් කොරයා යාන්තමට සිනාසුනේය.

සිනාසෙන විට කොරයා තුල අමුතු වේශයක් ඇති

විය. මේ මිනිසුන් දෙදෙනා දුටු මොහොතේ පටන් කොරයාගේ පරණ පුරුදු ත්‍රාසය ගතපුරා තලියමින් පැතිර ගියේ ඔහුගේ කිසිදු අණුබලයක් නොමැතිවය.

"අපි ඔබට හිතවත්, කොටින්ම කියනවා නම් අපි යාළුවෝ...! අපි කරන්නෙත් මිස්ටර්ගෙ රස්සාවටම කිට්ටු ඊකියාවක්. තේරුණාද?" දෙවැන්නා සඳහන් කළේය.

"තමුසෙලගෙ ඇස්වලටම පේනවනේ මම දැන් නාකි මිනිහෙක්. විශ්‍රාම ලබාපු මම මෙහාට වෙලා යාන්තම් ජීවිතේ ගෙනියනවා"

"ඒවා කියලා හරියන්නේ නැහැ මිස්ටර් කොරයා, පැන්ෂන් ගියාට ඔය අත පය තවමත් හොඳට වැඩ කරනවා නේද? සල්ලි හම්බු කරන්න මේ වගේ අවස්ථාවක් තවත් නම් ලැබෙන්නෙ නැහැ"

"ඒ මොකද?"

"තවත් නාකි වෙනකං හිටියොත් හැරමිටිය වත් හරිහැටි වාරුකර ගන්න බැරිවෙනවා"

"ඉතින්, තමුසෙලා මෙතරම් දුර මාව හොයාගෙන එන්න කාරණාව?" ඔහු යළි සැක මුසුව ඇසුවේය.

"ඒක මෙතන කියන්න සුදුසු නැහැ. යමු කන්තෝරු කාමරේට"

තිදෙනාම නිවසේ දකුණුපස පිහිටි කන්තෝරු කාමරය තුලට වැදුනහ.

"මිස්ටර් කොරයා මොනව කිව්වත් අපට වැඩක්



නැහැ. නමුත් අපි ආපු වැඩේනම් කොහොම හරි ඉෂ්ටකරලා දෙන්න ඕන"

"මොකක්ද ඒ වැඩේ?"

"ඒක මහ බරපතල රාජකාරියක්! ඒ වගේම අතිශයින් රහසිගතයි! පොඩ්ඩක් වැරදුනොත් අපි ඔක්කොම අවසානයි!!"

කොරයාගේ දෙනෙත්වලට පැහැපත් බවක් එකතු විණ. ඒ මොහොතේ ඔහු තුල වූ කුසීත භාවය අතුරුදහන් වී ගොස් තිබිණි.

"මොකුත් ඔත්තු බලන වගේ එකක්ද?"

"ඒ අංශෙට තමයි අයිති. ඒත් ඊට වැඩිය වැඩේ බරපතලයි"

"මං මුලින්ම කිව්වනෙ. මම ඒ රස්සාවෙන් පැන්ෂන් අරගෙනයි ඉන්නෙ කියලා. මට මේ නිස්කලංක ජීවිතේ මගේ පාඩුවේ ගත කරන්න ඉඩදීලා වැඩේ වෙන කෙනෙකුට බාර දුන්නොත් හොඳයි" කොරයා කීය.

"මේ වැඩේ කරන්න මුලු ලංකාවෙම ඉන්නෙ දෙන්නයි. එක් කෙනෙක් තමයි බ්‍රිගේඩියර් එම්. අනික් තැනැත්තා තමයි මිස්ටර් ජිමී කොරයා"

"ඉතින් බ්‍රිගේඩියර්ට කියලා...!"

අමුත්තන් දෙදෙනා සාවඥ ලෙස සිනාසුනහ. "බ්‍රිගේඩියර්ට මේ ගැන කියන්න ගියොත් අපට පණ පිටින් එලියට එන්න ලැබෙයිද?" එක් තැනැත්තෙක් කීය.

"අපිට විශ්වාස කරන්න පුළුවන් එකම මිනිහා මිස්ටර් ජිමී කොරයා විතරයි" වඩාත් තරබාරු පුද්ගලයා කටහඬ අවදි කලේය.

කොරයා මද වේලාවක් කල්පනා කරමින් සිටියේය.

"හ්ම්! එහෙනම් කියනවා බලන්න"

"මිස්ටර් කොරයා, සී. අයි. ඒ. එක ගැන අහල තියනවා නේද?"

ජිමී කොරයා එකවරම තිගැස්සුනේය. ඒ අකුරු තුන සඳහන් වනවාත් සමග ඔහුගේ පෙණුම වෙනස් විය. භීතියේ සේයාවක් ඔහු තුලින් විද්‍යාමාන විය. අමුත්තන් දෙදෙනාද මද වේලාවක් ඔහු දෙසම නෙත් රඳවා ගෙන සිටියේ ඒ වෙනස තේරුම් ගත් නිසා විය හැක.

"මම දන්නවා..! මේ රටේ හැම කෙනෙකුටම වැඩිය සී. අයි. ඒ සංවිධානෙ ගැන. නමුත් මම වැඩ කලේ බ්‍රිගේඩියර් එම්ට. නමුසෙලා දන්නවා බ්‍රිගේඩියර් සටන් කරන්නෙ සී. අයි. ඒ. එකත් එක්ක බව. සී. අයි. ඒ. එකට විරුද්ධව කල විශේෂ වැඩ සටහන් ඔහු බාරදුන්නෙ මටයි" කොරයා තරමක ගෞරවයෙන් කීය.

"අපි ඒ හැම දෙයක්ම දන්නවා මිස්ටර් කොරයා. අපේ ඉතාම දක්ෂ ඔත්තුකාරයෝ හතර පස්දෙනෙක්ම පරලොව යැව්වෙ ඔබ බවත් අපි දන්නවා. ඒ බ්‍රිගේඩියර්ට සේවය කල කාලේ. ඒ නිසා ඒකට අපේ කිසි අමනාපයක් නැහැ. නමුත් දැන් මිසටර් කොරයා අපටත් වැඩ කරන්න ඕනේ"

"සී. අයි. ඒ. එකට?" කොරයා විශ්මයෙන් ඇසීය.



"ඔව්! මිස්ටර් කොරයට ඕන තරම් අපි සල්ලි ගෙවනවා. ඒ වගේම අපේ සංවිධානෙ ආරක්ෂාවත් සලසනවා!"

"මගේ ආරක්ෂාව සලස ගන්න මම දන්නවා. මෙච්චර කලක් ජීවත් වෙන්න ලැබුනෙත් ඒ නිසාමයි!"

"එහෙනම් මෙන්න මේකයි වැඩේ. රුසියාවෙ ඉඳලා ඇවිත් ඉන්නවා ඉතා බලගතු මිනිහෙක්. මිනිහගෙ නම උස්ටිනොව්. එයා රුසියාවෙ වෙළඳ අමාත්‍යංශයේ උසස්ම නිළධාරියෙක්! මිනිහා ගිය සුමානෙ ලංකාවට ආවා. ඒ නිකමට නෙමෙයි. ශ්‍රි ලංකාවත් එක්ක විශාල වෙළඳ ගිවිසුමක් අත්සන් කරන්න. ශ්‍රී ලංකාවෙ තේ, රබර්, රුසියාවට පටවන්නත්, ඒ වෙනුවට රුසියාවෙ යුද්ධ ආයුධ ශ්‍රී ලංකා යුධ හමුදාවට දෙන්නත්, ගිවිසුමක් ගහන්න"

"ඒක හොද අදහසක් නේ. මේ රටට යුද්ධ ආයුධ ලැබෙන එක බොහොම හොද වැඩක්. ඒ හැරත් අපේ තේ, රබර් රුසියාව වගේ බලගතු රටක් ගන්න එකත වීම අපේ රටේ වාසනාවක්!"

ජිමී කොරයා සන්සුන් ලෙසින් කීවේය.

"ඒ මිස්ටර් කොරයාට පේනහැටි! නමුත් සී. අයි. ඒ එකට, එහෙමත් නැත්නම් ඇමෙරිකාවට ඒක පේන්නෙ අනිත් අතට! රුසියාව, ලංකාවට මේ විදියෙ ආධාරයක් කරන එක ඇමරිකාවට විශාල පාඩුවක්. අනාගතයට ලොකු තර්ජණයක්. ලංකාව වැනි ආසියාකරයේ කුඩා රටවල් රුසියාවත් එක්ක සම්බන්ධකම් පවත්වන එකෙන් ඇමෙරිකාවෙ බලය හීන වෙනවා. ඒ නිසා මේ ගිවිසුම ඇති කරන්න කොහෙත්ම ඉඩ දෙන්න බැහැ. ඊට ඉස්සර වෙලා ඔය උස්ටිනෝව් මරල දාන්න ඕන"

"මට රුසියාවත් එක්ක පෞද්ගලික කෝන්තරයක් නැහැ. ඒ වුනත්.....!"

ජිමී කොරයා යමක් කීමට සූදානම්ව නැවත කල්පනා කරන්නට විය.

"මේ වැඩේ කලොත් අපේ සංවිධානය රුපියල් ලක්ෂයක් ගෙවනවා! අත්පිට මුදල්!" අමුත්තන්ගෙන් කෙනෙක් මතක් කලේය.

මදක් කල්පනාකිරි වූ ජිමී කොරයා තීරණයකට එළඹියාක් මෙන් හිස සැලීය.

"හොඳයි! මම වැඩේ කරන්නම්. වැඩේ කරන්න ඉස්සර වෙලා මුළු ගාස්තුවෙන් භාගයක් ගෙවන්න ඕනේ"

"අපි ලෑස්තියි!" කී අමුත්තා අත් බෑගය විවර කොට නෝට්ටු මිටි කීපයක් ගෙන මේසය මත තැබීය.

නොබෝ වේලාවකින් අමුත්තන් දෙදෙනා පිටව ගියහ. ඉන්පසු ජිමී කොරයා සැප පුටුවේ දිගාවී කල්පනා කරන්නට වූයේය.

විශ්‍රාම ලැබූ නමුදු ඔහුට පෙර මෙන්ම සෘජුව සේවය කිරීමට හැකියාවක් තිබේ. දක්ෂ කමත් ඇත. මෙසේ අලසව ගෙතුලට වී සිටිනවාට වඩා යහමින් මුදල් සෙවීමේ මගක් ඉබේම පැදී තිබෙන බවක් ඔහුට හැඟෙයි. ඉන් තිසි එල ගැනීම ඔහු සතු කාර්‍යයකි.

අමුත්තන් දෙදෙනා විසින් දෙනු ලැබූ උස්ටිනෝව්ගේ ගමන් බිමන් හා නැවතී සිටි හෝටලය පිළිබඳ විස්තර අඩංගු ෆයිලය කොරයා කීපවිටක්ම කියවා ඔහු මරා



දැමීමට සුදුසු යෝග්‍ය ස්ථානයක් පිළියෙල කර ගැනීමට වෙහෙසුනේය. මීට පෙර ඔහු මීට වඩා උසස්, එමෙන්ම භයානක පුද්ගලයන් පරලොව යවා තිබේ. මොහු වෙළඳ අමාත්‍යංශයක නිළධාරියෙක් පමණි. එහෙත් ජිමී තුල කුකුසකට ඇතිවූයේ ඔහු රුසියන් කාරයෙකු වීමය.

රුසියානුන් සමග ගැටීම එතරම් පහසු නොවන බව ඔහු පළපුරුද්දෙන්ම වටහා ගෙන තිබූ දෙයකි.

සැනෙකින් ජිමී කොරයා තුල වූ පාළු ගතිය මග හැරින. තරුණයෙකු මෙන් කඩිසර ගතියක් ඔහුට දැනෙන්නට විය.

"හ්ම්! කැම්බල්පාක් එකේ කොමියුනිස්ට් පාක්ෂිකයන් පවත්වන පිළිගැනීමේ උත්සවය තමයි මේකට කියාපු තැන. දේශපාලන උණුසුමත් තියනවා. වැඩේට කියාපු තැන!" කොරයා තමාටම තොල් මතුරා ගත්තේය.

පසුවදා කොරයා තමාට සුපුරුදු ඇඳුම් කට්ටලයෙන් සැරසුනේය. අළු පැහැති යුරෝපීය ඇඳුම් කට්ටලය ඔහුගේ ශාන්ත තළතුනා පෙනුම ඔප මට්ටම් කලේය. බැලූ බැල්මට කෙනෙකුට ඔහු පෙණුනේ වැදගත් මහත්මයෙකු හැටියටය. එසේත් නැත්නම් ව්‍යාපාරිකයෙකු ලෙසය.

පිළිගැනීමේ උත්සවයට ප්‍රබල ප්‍රචාරයක් දී තිබුණි. වාමාංශික පුවත් පත් උස්ටිනෝව් ගැන ඉහළින් වර්ණනාකර තිබූ බැවින් පිළිගැනීමේ උත්සවයට විශාල ජන සංඛ්‍යාවක් පැමිණ සිටියහ. ජිමී කොරයා හම් බෑගයකුත් අතින් එල්ලා ගෙන වේදිකාව අසල වූ මිනිසුන් අතරට එක් විය.

කොරයාගේ හැඩහුරු කම් ඔහුගේ රැකියාවට විශේෂ ආධාරයක් විය. ඒ රුව ගැන මිනිසුන් කිසි

විටෙක විශේෂ සැලකිල්ලක් දැක්වූයේ නැත. මිනිසුන්ට එය ඔහුට ඔහුගේ රුව මතක හිටියේවත් නැත. එය ඔහුට උත්පත්තියෙන්ම ලැබී තිබුණු වාසනාවකි.

විනාඩියෙන් විනාඩියට රැස්වීම් භූමිය ජනතාවගෙන් පිරෙන්නට විය. උස්ටිනෝව් ඇතුළු පිරිස තවම වේදිකාවට ළඟා වූයේ නැත. පිළිගැනීමේ කොමිටියේ සාමාජිකයන් පමණක් ඒ මේ අත යමින් යුහුසුලුව අමුත්තා පිළිගැනීමට කටයුතු සංවිධානය කරමින් පසුවූහ.

රතු පැහැ ධජ හැමතින්ම ලෙල දෙමින් තිබිණ. උස්ටිනෝව්ගේ ගෙලට පැළඳවීමට සූදානම් කොට තිබූ රතු කානේෂන් මල්මාලය වේදිකාව මත වූ මේසය මත තිබිණි. ඒ දෙස නෙත් යැවූ කොරයාගේ මුවගට උපහාසය කැටි සිනාවක් එක්විය.

ඒ රතු කානේෂන් මල්මාලය උස්ටිනෝව්ගේ මලගම සඳහා ප්‍රයෝජනයට ගත හැකි බව ඔහු සිතිය.

පිරිස කොතරම් නොඉවසිලිමත් වූවද, ජිමී කොරයා පමණක් ඉතා සන්සුන් ලෙස සිටියේය. ගෙවියන හැම තත්පරයක්ම ඔහුට බෙහෙවින් වැදගත්ය. ගෙවන්නට තිබෙන කාලය ඊටත් වඩා වැදගත්ය.

නොබෝ වේලාවකින් රතිඤ්ඤා වෙඩි පුපුරන හඬ ඇසෙත්ම පිරිස තවත් නොඉවසිලිමත්ව ඉස්සී බලන්නට වූ නමුදු කොරයා තමන්ගේ පාඩුවේ වේදිකාව දෙසට නෙත් යොමා ගෙන පසුවිණ.

විනාඩි කිපයක් ඇතුලත රැස්ව සිටි මහ ජනතාවගේ ප්‍රීති ඝෝෂා මධ්‍යයේ සෝවියට් නියෝජිතයා වේදිකාව කරා කැඳවා ගෙන එනු පෙණිනි. ඔහු වේදිකාවට නගිත්ම



පිරිස නැගූ ඔල්වරසන් හඬ සවන් බිහිරි කරවන සුළුය.

"රුසියාවට ජයවේවා....! වැඩ කරන ජනතාවට ජයවේවා....!"

"ඇමරිකන් අධිරාජ්‍යවාදය භංගවේවා....! යැංකි මිණීමරුවන් ලෝකයෙන් අතුගා දමව්.....!"

යනාදි සටන් පාඨ පිරිස අතරින් නැඟෙන්නට වූහ.

උස්ටිනෝව් වේදිකාවට ඇතුළුවත්ම උත්සව කොමිටිය විසින් රතු කානේෂන් මල්මාලාව පළඳවා ඔහු ගාම්භීර ලෙස පිළිගනු ලැබූහ. පිළිගැනීමේ කතාව අවසාන වූ පසු උස්ටිනෝව් අසුනෙන් නැගී මයික්‍රොෆෝනය වෙත ලඟා විය.

ඔහු මහ ජනතාවට දෑත් එක්කොට "ආයුබෝවන්!" කියා සිංහල පිලිවලට ආචාර කරත්ම අසල සිටි ජිමී කොරයා සූදනම් වූයේය.

උස්ටිනෝව් සිංහල භාෂාවෙන්ම මහ ජනතාවට "සහෝදරවරුණි!" කියා ආමන්ත්‍රණය කරත්ම මහත් ප්‍රීතියෙන් ජනතාව ඔල්වරසන් දෙන්නට වූහ. එහෙත් උද්වේගය කොරයාට සුපුරුදු දෙයක් නොවේ. ඔහු ඉතා ශාන්ත දාන්ත අන්දමින් අතින් එල්ලා ගෙන තිබූ බෑගය මදක් ඉහලට ඔසවා එහි රහස් තැනක තිබූ බොත්තමක් තද කලේ කිසිවකුට නොපෙනෙන, නොහැඟෙන අයුරිනි.

මිනිසුන්ගේ ප්‍රීති ඝෝෂා හඬ කොතරම් වීද යත් බෑගය තුල රඳවා තිබූ සයිලන්සරය සවිකළ ස්වයංක්‍රීය ගිනි අවියෙන් නිකුත් වූ සිහින් වෙඩි ශබ්දය කිසිවෙකුටත් නෑසිනි.

හිටිහැටියේම උස්ටිනෝව් පපුව අල්ලා ගෙන වේදිකාව මැදට ඇලවී ගෙන යන්නට විය.

"ආහ්....!" යන්න ඔහුගේ මුවින් ගිලිහුනි.

උස්ටිනෝව් පපුව අල්ලා ගෙන පසෙකට ඇලවී යත්ම ජනතාව භීතියට පත්වූහ. මෙතෙක් වේලා ඇසුණු ජයඝෝෂා නාදය වෙනුවට භීතිය මුසු කෑ මොර ගැසීම් හඬ සතර අතින්ම ඇසෙන්නට විනා. පිරිස කෑ ගසමින් වේදිකාව දෙසට තෙරපෙන්නට වූහ.

"දෙයියනේ.....! මේ මොන අපරාධයක්ද?"

"මේ මිනීමරුවා ලහම ඇති! උෟට පැනල යන්න ඉඩ දෙන්න එපා..! උෟ අහුවුනොත් මෙතනම මරල දාමු!"

කුපිත වූ පිරිස වහසි බස් දොඩමින් කලබලයෙන් ඒ මේ අත දුව පැන්නාහ. ජිමී කොරයා සන්සුන්ව ඔවුන් දෙස බලා සිටි අතර ඔහු ක්ෂණිකව කල්පනා කිරීමට විය. වහාම පසුපසට හැරුණු හෙතෙම කලබලයෙන් තෙරපෙන සෙනඟ දෙසට ඇඟිල්ලක් දිගු කොට පෙන්වීය.

"අර.....! අර....!! අන්න අර පැත්තට තමයි ඒ මිනිහ දුවගෙන ගියේ. උගේ අතේ පිස්තෝලෙකුත් තිබුණා" ඉන්පසු ඔහු කෑ ගැසීය.

"ඔව්! ඔව්!! අපි ඒ පැත්තට දුවමු! වරෙල්ලා!" යි ඒ අසල සිටියෙකු එය අනුමත කර කෑ ගසත්ම, කලබල වූ පිරිස ඒ අනුව ඉවක් බවක් නොමැතිව දුවන්නට වූහ. පිරිස නොදන්නා නොහඳුනන මිනිසෙකු පසුපස හඹා යන අතර ජිමී කොරයා සන්සුන් ලෙස අඩ සිනාවක් පාමින් ආපසු හැරුනේය.



විනාඩි කීපයක් ඇතුලත කුලී රථයක නැගුණු කොරයා කැම්බල් උද්‍යානයෙන් පිට වී දුම්රිය පොලට පැමිණ නුවරඑළියට යෑම සඳහා තිබූ දුම්රියට ඇතුල්විය.

"වැඩේ නම් ඒ තරම් අමාරුවුනේ නැහැ!" දුම්රිය ධාවනය වන අතර පළමුවැනි පංතියේ මැදිරියකට වී සිටි කොරයා කල්පනා කලේය. කලකින් මෙවැනි මෙහෙයක් කිරීමට ලැබීමෙන් ඔහු ලැබූ ප්‍රීතිය, ත්‍රාසය අසීමිතය.

පැය කීපයකින් ඔහු නැවතත් ඒ ශාන්ත සුන්දර කඳුකර පරිසරයටම පැමිණියේය. ඔහුගේ සිතට මහත් අස්වැසිල්ලක් දැනිණ.

"කොච්චර ශාන්ත පරිසරයක්ද? මොලේ වෙහෙසා වැඩ කරන කෙනෙකුට ජීවත් වෙන්න නියම පැත්ත මේක තමයි" ඔහු නිවහනට ගොඩවදිමින් තමාටම කොඳුලා ගත්තේය.

ගෙට ගොඩවදින විට රාත්‍රී නමය වැදෙනු ඇසෙත්ම කොරයා වහා රූපවාහිණී යන්ත්‍රය ක්‍රියාත්මක කලේය.

රුසියාවේ සිට මෙහි පැමිණ සිටි වෙළඳ දූත පිරිසේ නායක ව්ලැඩිමීර් උස්ටිනෝව් අද දහවල් සාහසිකයකු විසින් වෙඩි තබා මරුමුවට පත් කරනු ලැබීය. සාහසිකයා පලා ගොස් ඇති බැවින් ශ්‍රී ලංකා රහස් පොලිසිය මුළු රටම පීරමින් ඔහු අල්ලා ගැනීමට වෙහෙසෙයි.

නිවේදකයා මේ වැකිය ප්‍රකාශයට පමුණුවත්ම ජිමී කොරයාගේ මුවගට සිහින් සිනා රැල්ලක් නැඟිණි.

## 3 වන පරිච්ඡේදය

**වි**ලැඩිමීර් උස්ටිනෝව් මහතාගේ අබිරහස් මරණය රටවැසියන් අතර මහත් ආන්දෝලනයක් ඇති කලේය. මෙය දේශපාලන මිනීමැරුමක් වශයෙන් හංවඩු ගැසූ වාමාංශික පුවත් පත් මිනීමරුවා අල්ලා දෙන හැටියට රහස් පොලීසියට අභියෝග කළහ. මෙවැනි හිරිකිත, නින්දිත අපරාධවලට ඉඩ නොදී මෙරටට පැමිණෙන විදේශීය අමුත්තන්ගේ ජීවිත ආරක්ෂා කර දෙන ලෙස දන්වමින් නිර්දය ලෙස විවේචන කොට තිබිණ.

උස්ටිනෝව්ගේ මරණය ගැන ශ්‍රී ලංකා රහස් පොලීසිය දිවා රෑ නොතකා වෙහෙසෙමින් මිනීමරුවා අල්ලා ගැනීමට යුහුසුළු වූ නමුදු එහි බරපතල වගකීම් රැඳුනේ ශ්‍රී. ලංකා රාජ්‍යාරක්ෂක දෙපාර්තමේන්තුවේ විශේෂ 00 අංශය වෙතය. රජයෙන් විශේෂ නියෝගයක් බ්‍රිගේඩියර් එම් වෙත යවනු ලැබුයේ වහාම මේ සම්භාවනීය අමුත්තාගේ මරණයට තුඩු දුන් කරුණු ගැන සොයා බලන ලෙසය.

බ්‍රිගේඩියර් එම් පුවත් පත්වල පලව තිබූ වාර්තා කියවා උස්ටිනෝව්ගේ මරණය සිදුවූ ආකාරය දල වශයෙන් තේරුම් ගත්තේය.

අනතුරුව ටෙලිෆෝනය අතට ගෙන නොම්බරයක් කරකැවීය.



"හලෝ 00 සෙක්ෂන්.... කෝලින්....!" රිසීවරය තුලින් ඔවුන් කතා කරන හඬ ඇසිණි.

"සර්! මේ ජේම්ස් බණ්ඩා කතා කරනවා"

"ඕ.... කේ.... ජේම්ස් වහාම මෙහාට එන්න!"

"ඉයස් සර්!"

සංවාදය එතෙකින් නැවතිනි. විනාඩි කිපයක් ගතවත්ම කඩවසම් පුරුෂයෙක් බ්‍රිගේඩියර්ගේ කාර්යාලයට ඇතුලු විය. ඒ පුරුෂයා කදිම ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියේය. ඔහු ගමන් කලේ මල්ලව පොර කාරයකු මෙන් කය ඍජුව තබා ගෙනය.

බ්‍රිගේඩියර්ගේ මේසය ඉදිරිපිට අසුන් ගත් හෙතෙම මද සිනා රැල්ලකින් බ්‍රිගේඩියර්ට සංග්‍රහ කලේය.

"සර් මොකද හදිසියෙන්ම?"

"අර රුසියන්කාරය මරාදාලා ජේම්ස්!"

"මම නකමට හිතුව!"

"උස්ටිනෝව්ගෙ ජීවිතේ ගැන ලංකාණ්ඩුවට වග කියන්න සිද්ධවෙලයි දැන් තියෙන්නෙ. හරිම අපරාධයක් නේ කරල තියෙන්නෙ"

"ඇයි සර්..... ඒ රුසියන් කාරයත් එක්ක රුසියන් රහස් පොලීසියෙනුත් කීප දෙනෙක් ඇවිල්ලා හිටිය නේද?"

"ඔව්! ලංකාවෙ රහස් පොලීසියෙනුත් කීප දෙනෙක්ම

කවර්කලා. ඒත් මිනීමරුව මේ හැම කෙනෙකුටම වඩා දක්ෂ කෙනෙක් බවයි පෙනෙන්නෙ"

"පළපුරුදු කාරයෙකු අතින් කෙරුන වැඩක් වින්තිය මටත් තේරෙනවා.... සර්! සී. අයි. ඒ. එක මේ පිටුපසින් ඇතියි කියල සැක කරන්න බැරිද?"

"මොනව වුනත් මේක දේශපාලන මිනිමැරුමක්!"

"ලෝකෙ හැම රටකම වගේ වැදගත් දේශපාලන නායකයින් මරා දමන්නෙ මේ මිනීමරු සී. අයි. ඒ එකයි. එහෙම සංවිධානයකට මේ වගේ පොඩි රටකට ඇවිත් මිනීමරණ එක අමාරු දෙයක් නොවෙයි"

"ජේම්ස් මේක කරවන්න ඇත්තෙ සී. අයි. ඒ සංවිධානය වුනාට මේ වැඩේ බාරදෙන්න ඇත්තෙ ලංකාවෙ ඉන්න නියෝජිතයෙකුට..!"

"සර්! අපි උන් ඔක්කොම පරලොව යැව්වා"

සරදම් ලෙස බ්‍රිගේඩියර් සිනාසුනේය.

"එකෙක් මරණකොට සී. අයි. ඒ එක තවත් දහස් ගණනක් නියෝජිතයො ඇති කරනවා. සල්ලි බලෙන්......"

"මේක විසඳන්නත් ඕන. ඒත් කිසිම හෝඩුවාවකුත් නෑ" බණ්ඩා හිස සලමින් මතක් කලේය.

එම් මොහොතක් කල්පනාකාරි විය.

"ජේම්ස් දන්නවද අර කොල්ලුපිටියෙ තියෙන **"ඇලෝමා"** කියන නයිට් ක්ලබ් එක......!"



"මම අහල පුරුදුයි. ඒත් ගිහින් නැහැ"

"එතනට ඇතුල් වෙන්න පුළුවන් සාමාජිකයන්ට පමණයි. ඒකෙ කෙරෙන වැඩ කටයුතු සැක සහිත නිසා ගිය සුමානෙ මම 015 එහාට යැව්ව. ගිහින් මෙම්බර් කෙනෙක් වෙන්නයි කියල. 015 මෙම්බර් ෂිප් කාඩ් එකක් ලබාගත් බවත්, ඉදිරි කාලය ඇතුළත ඔක්කොම තොරතුරු දන්වනවයි කියල මට කෝඩ් මෙසෙජ් එකක් එවලා තිබුණා. නමුත් පුදුමෙට වාගෙ ඊට පස්සෙ මිනිහගෙන් කිසිම ආරංචියක් නැහැ. ගෙදර ගිහිලත් නැහැ"

"ඒක පුදුමයක්. 015 දක්ෂ ඩිකෝයි කෙනෙක්"

"මටත් තේරුම් ගන්න බැරි ඒකයි ජේම්ස්. මිනිහ හැමදාම රෑට මෙසෙජ් එවන්න 015 පොරොන්දු වුනා"

"දැන් කීදවසක් ගත වුනාද?"

"හරියටම අදට දවස් පහයි. ජේම්සුත් ගිහින් මේ කලබ් එකේ මෙම්බර් ෂිප් එක ලබා ගන්න උත්සාහ ගන්න. මම හිතනවා ඔය උස්ටිනෝව්ගේ මරණයට ඔය ක්ලබ් එකත් මොන අන්දමකින් හරි සම්බන්ධ කමක් තියනවයි කියලා"

"ඒක සැකයක්ද සර්?"

"නැහැ! ඊයේ අපේ ඉන්ටෙලිජන්ට් සර්විස් එකේ ඔෆිසර් කෙනෙකුට මහ පුදුම වැඩක් වෙලා තියනවා" බ්‍රිගේඩියර් එම්, බණ්ඩා වෙත මොහොතකට තියුණු බැල්මක් හෙළුවේය.

ජේම්ස් අසා සිටියේය.

"අපේ ඔෆිසර් ඊයේ රෑ ගෝල්ෆේස් පිට්ටනිය ලඟ කවර් එකේ ඉන්න කොට එක පාරටම ඈත ඉඳල මිනිහෙක් දුවගෙන ඇවිත් තියනවා අන්ධකාරෙම. ඒ මිනිහ දුවගෙන ඇවිත් තියෙන්නෙ අපේ ඔෆිසර් දැකල නෙමෙයි. පස්සෙන් එලවගෙන ආපු කීප දෙනෙකුගෙන් බේරෙන්න. හදිසියේම වාගේ මිනිහ අපේ ඔෆිසර්ව දැකල තියනවා. එතකොටම කොහෙන්දෝ ආපු වෙඩි පහරකින් වැදිල අර මිනිහ බිම ඇද වැටිල තියනවා. ඒ මිනිහගෙ පණ යන්න ඉස්සර වෙලා බොහොම අමාරුවෙන් බෙල්ලට ඇඟිල්ල දික් කරලා තියනවා"

"මරු විකාරේ වෙන්න ඇති?"

"නැහැ! බෙල්ලෙ තිබුණු යමක් පෙන්වන්න" එම්, බණ්ඩාගේ වරද නිවරද කලේය.

"මොනවද තිබුණෙ? රත්තරන් චේන් පොටක් වෙන්න ඇති"

"රත්තරන් චේන් පොටක් නෙවි ජේම්ස්.....! කළුපාට කුරුල්ලෙක්! පච්ච කොටාපු කළුපාට කුරුල්ලෙකුගෙ රූපයක් ඒ මිනිහගෙ බෙල්ලේ දකුණු පැත්තේ කොටල තිබිල තියනවා. මිනිහ තවත් මොනවාදෝ කියන්න සැහෙන්න උත්සාහ අරගෙන තියනවා. නමුත් එතකොටම අර වෙඩි තියාපු උන් ඉස්සරහට දුවගෙන ඇවිත් නැවත වෙඩි තැබූ නිසා අපේ ඔෆිසරුත් වෙඩි තබමින් මග හැරල ගිහින් තියනවා. පැය කාලෙකින් ආපසු ඇවිත් බලන කොට මැරිච්ච මිනිහත් නෑ. ඌ පස්සෙ එලවගෙන ආපු මිනිස්සුත් අතුරුදහන් වෙලා"

"ඉතින් මේ සිද්ධිය කොහොමද ඇලෝමා ක්ලබ් එකට සම්බන්ධ වෙන්නෙ?"



"අපේ ඔෆිසර් මේ සිද්ධිය මට [illegible] කුරුල්ලෙ[illegible] සංවිධානයක් ගැන. ඒත් එකෙ නායකයා කව්ද, මූලස්ථානය කොතැනක පිහිටා තිබෙන්නක්ද කියල අද වෙනතුරු කිසිම තොරතුරක් නෑ....!"

"එහෙම නම් සර්..! කොහොමද මේක ඇලෝමා ක්ලබ් එකට සම්බන්ධ වෙන්නෙ?"

"මම සැකයටයි ජේම්ස්ට කියන්නෙ. ඔය ක්ලබ් එකේ ඉස්සරහ වතුර මලක් තියනවා. වතුර විහිදෙන්නෙ පොකුණ මැද්දෙ අඹාල තිබෙන කළු කුරුල්ලෙකුගෙ කටින්. අන්න ඒකයි මගේ සැකයට හේතුව. සමහරවිට ඒක මේකට සම්බන්ධ නොවන්නත් පුළුවන්"

"මම ඇලෝමා ක්ලබ් එකට යන්නම්. ගිහින් මෙම්බර් කෙනෙක් වෙන්න බලන්නම්"

"ඒ එක්කම උස්ටිනෝව්ගෙ මර්ඩර් එක ගැන හොයන්නත් ඕන"

"තැන්ක් යූ සර්....!"

ජේම්ස් බණ්ඩා සුපුරුදු සැහැල්ලු ගමනින් ගොස් විදුලි සෝපානයට ඇතුළු විය

**** **** **** **** ****

පසුවදා රාත්‍රි හතහමාරට පමණ මෝටර් රථයට නැගුණු ජේම්ස් බණ්ඩා ඔහුගේ පකිස්තානු ජාතික සගයකු මුණ ගැසීම සඳහා වැල්ලවත්තේ එක්තරා පටු මගක පිහිටි දෙමහල් හෝටලයක් කරා ගියේය. විනාඩි කීපයකින්

අණතුරුව ඔහු අගනා ඇඳුම් කට්ටලයකින් සැරසුණු පකිස්තානු ජාතික මිත්‍රයාත් කැටුව වින් රථයට නැග ගාලු පාරට වැටී ධාවනය කරන්නට විය.

රිය කොල්ලුපිටියේ ජනාකීර්ණ පෙදෙසක උයනක් මැද පිහිටි තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිරියේ නතර විනි. ගොඩනැගිල්ල ඉදිරියේ වූ තැන්නේ දැකුම්කළු මෝටර් රථ විශාල සංඛ්‍යාවක් නවතා තිබිණි. තැන්න මැද වතුර මලකි. දිය යට විදුලි බුබුලු සවිකොට තිබුණෙන් ජලය අමුතුම පැහැයක් අනුව දිස්වෙමින් තිබිණි.

බණ්ඩා සිය මිතුරාත් කැටුව සමාජ ශාලාව තුලට ගමන් ගත්තේය. එහෙත් සමාජ ශාලාවේ අභ්‍යන්තරයට ඇතුළුවන කොරිඩෝරයේදී කවුන්ටරයක් මැද සිටි හැඩි දැඩි පුරුෂයෙක් ඔවුන්ට නතර වන ලෙස අතක් ඔසවා සන් කලේය.

"මෙම්බර්ස් ඔන්ලි සර්......!" හැඩි දැඩි මිනිසා ඉංග්‍රීසියෙන් කීය.

ජේම්ස් බණ්ඩා දෙනෙත් යටින් හැඩි දැඩි මිනිසා දෙස බලා සිටියේය. අණතුරුව කබා සාක්කුවට අත යවා යමක් ගෙන ඇඟිලි දෙක අතරට තබා තදකොට මිනිසා දෙසට දිගු කලේය.

මිනිසා එයට නැඹුරුව එහි නම්මරය දෙස බැලීය. ඉන්පසු එක් අතක් දිගු කොට ආචාර කලේය.

"යූ කැන් ගෝ සර්!"

බණ්ඩා මිතුරාත් කැටුව සමාජ ශාලාව තුලට ගමන් කලේ අමුත්තක් නැති ආකාරයෙනි.



හිස් අසුන් දෙකක වාඩිගත් පසු බණ්ඩා සිය තියුණු නෙත් සහල ශාලාව කරා යැවීය. තමා මින් පෙර කිසිම දිනක දැක පුරුදු නැති ස්ත්‍රී පුරුෂයන් කමින් බොමින් කතා කරමින් විනෝදයෙන් පසුවන අන්දම ඔහුට පෙනේ. එහි සිටි ස්ත්‍රීන් හැම කෙනෙක්ම පාහේ ඉතාමත් සුරූපී අභිරූපිකාවන් යැයි කිව හැක. බණ්ඩාගේ කෑදර සිත ඒ ගැහැණුන් කිප දෙනෙකු වෙතම ඇදී ගියේ ඔවුන්ගේ රූමත් කම නිසා විය හැක.

වේටර්වරයකු පැමිණි විට ජේම්ස් බණ්ඩා විස්කි ගෙනෙන්නැයි ඇනවුම් කළේය. විනාඩි කිපයකින් ඔවුන් විස්කිවල රස බලන්නට වූහ.

නොබෝ වේලාවකින් ඔවුන් සිටි මේසය කරා පැමිණියේ රූමත් තරුණියකි. ඈ මල්බර සිනහවකින් දෙදෙනාට සංග්‍රහ කොට ඉතිරිව තිබූ අසුනේ වාඩි ගත්තාය.

"මම ඉන්දිකා..... මිස්ටර්ල.....?" ඈ පැහැදිලි ඉංග්‍රීසි බසින් කිවාය.

බණ්ඩා ඉක්මන් නොවීය.

"මම... හෙක්ටර් වීරකෝන්! මේ මගේ පකිස්තානු මිත්‍රයෙක් ජගත් සිං!"

"අඳුන ගන්න ලැබීම සන්තෝෂයක්!"

කිසිදු ඇණවුමක් නොමැතිව වේටර් තැන ලඟට පැමිණියෙන් බණ්ඩා තරුණිය බීමට කැමති මොනවාදැයි විනාලේය.

"ෂෙරි!" ඈ මුතුවන් දසන් දක්වමින් කිවාය.

බණ්ඩා තරුණියගේ හිසේ සිට පාදාන්තය දක්වා බැල්මක් හෙළිය. පැරිසියේ මෝස්තර සඟරාවක් තුලින් කළඑළි බට රූමතියක මෙන් ඕ ලස්සණය. හැඩ වැඩය. ඇගේ දික් වූ දෙපා ඕනෑම පුරුෂයකුගේ හදවත් කුල්මත් කරවන සුළුය.

වේටර්වරයා ෂෙරි වීදුරුව ගෙනැවිත් තබා ගිය පසු ඈ වරින් වර එය දෙතොල් අතරට ලංකරන්නට වූවාය. ඇගේ දෙනෙත් මදක් චංචලය. ඈ යටැසින් බණ්ඩා දෙස බැලුවාය.

"මිස්ටර්ලා මීට ඉස්සෙල්ල මම දැකල පුරුදු නැහැ"

"අපි සින්ඩිකේට් එකට අලුත් මෙම්බර්ස්ලා"

"ඕ... අයි... සී...!"

"කවද්ද මෙම්බර් ෂිප් එක ලැබුණෙ?"

"ගිය සුමානෙ"

"ගුඩ්! මෙයත් මෙම්බර් කෙනෙක්ද?" ඈ නලල් තලය රැළි නංවාගෙන ඇසුවාය.

"නැහැ! ඒත් සින්ඩිකේට් එකට හිතවත්. පකිස්තානෙ ඉඳල ආව හිතවතෙක්. මෙහේ බිස්නස්වලට"

ඈ මුවගට ලංකල ෂෙරි වීදුරුව මදක් පහත් කොට විමැසුම් සහගත බැල්මක් හෙලුවාය. බණ්ඩාගේ මිත්‍රයා දෙස!

"බිස්නස්! මොන විදියෙ බිස්නස්ද?"



"ජෙම් බිස්නස්!"

"ඕ...හෝ..!" ඈ හිස දෙවරක් සලා ඉතිරි ෂෙරි ස්වල්පය එක හුස්මට ගිල දැම්මාය.

බණ්ඩා තරුණිය තේරුම් ගත්තේය.

"මිස් ඉන්දිකා, ඔයා දන්නව වගෙයි ජෙම් බිස්නස් ගැන?"

"මම ටිකක් විතර මැණික් ගැන දන්නව. ඇයි මිස්ටර් හෙක්ටර් මෙයාව අපේ බොස් ලඟට එක්ක ගියේ නැද්ද?"

"මම බොස්ව වැඩිය අඳුරන්නෙ නැහැ!"

"මට පුළුවනි. මිස්ටර් කාල් එදිරිසිංහ ඉන්නෙ උඩ තට්ටුවෙ ඔෆිස් කාමරේ. ගිය සුමානෙත් එයා ලොකු ජෙම් බිස්නස් එකක් කලා"

"ගුඩ් නිව්ස්! එහෙනම් අපි උඩට යමුද?" බණ්ඩා යෝජනා කලේය.

"ඉන්න, මම ගිහින් කාල් මුණ ගැහිල එනකන්. එක පාරටම අමුත්තො මුණ ගැහෙන්න එයා වැඩිය කැමති නැහැ" යි පවසමින් තරුණිය අසුණින් නැගිට ගොස් කඩිසර ගමනින් තරප්පු පෙළ නගින්නට වූවාය.

විනාඩි කීපයකින් ආපසු පැමිණි ඈ බණ්ඩාට අතින් සංඥාවක් කලාය. උඩට පැමිණෙන ලෙස. බණ්ඩා නොපමාව මිතුරාත් කැටුව ඇය පසු පසින් උඩු මහළට නගින්නට විය.

ඉන්දිකා ඔවුන් දෙදෙනා ඔප දැමූ දොරකින් යුත් කාමරයක් තුළට කැඳවා ගෙන ගියාය. කාමරය මැද තිබූ මේසය ඉදිරියේ තළතුනා වියෙහි වූ පුරුෂයෙක් විශාල මේසයක් අසළ වාඩිගෙන සිටියේය. ඔහු ඔවුන්ගේ පැමිණීම බලාපොරෝතුවෙන් සිටියේය.

තරුණිය අමුත්තන් දෙදෙනා කාල් එදිරිසිංහට හඳුන්වා දුන්නාය. එදිරිසිංහ ඔවුන් දෙස නෙත් කොණින් බැල්මක් හෙලුවේය.

"මිස්ටර් බිස්නස් කරන්නෙ ඉන්දියාවෙද?" ඔහු පකිස්තානු ජාතිකයාගෙන් උනන්දුවකින් ඇසීය.

"හොංකොං වල!"

"දැන් බඩු තියනවද බලන්න?"

"ඔව්! හොඳ බඩු. බොම්බායේ ඉදල ගෙනාපු රූබීස්" යි කී බණ්ඩාගේ මිතුරා බඩතුරේ සඟවා ගෙන තිබූ කිසියම් පොදියක් අතට ගත්තේය.

ඔහු පොදිය මේසය මත තබා ඉතා පරිස්සමින් දිග හැරියේය. පුළුන් කැබලිවල ඔතා තිබූ දිළිසෙන මැණික් කැට කිපය දෙසට කාල් එදිරිසිංහගේ සැලකිල්ල යොමු වී තිබිණි.

පකිස්තානු ජාතිකයා නියම මැණික් ගල් හොරෙකු මෙන් කතාව ඇරඹුවේය.

"මේ මැණික් වලට හොංකොංවල ලොකු මාකට් එකක් තියනවා. මෙනන රුපියල් ලක්ෂ පණහක බඩු. හොංකොං කාරයො ඉන්දියාවෙ, ශ්‍රී ලංකාවෙ බඩු ගන්න



හුඟාක් කැමැතියි.... බලන්න! මේක අරන් බලන්න කොයි තරම් දිස්නයක් තියනවද කියල!" යි පවසමින් ඔහු එක් රතු කැටයක් එදිරිසිංහ අත තැබීය.

එදිරිසිංහ රතු කැටය ගෙන එක් ඇසක් වසා අනෙක් ඇස ලඟට ලංකලේය. විනාඩියක් ඒ දෙස බලා සිටි හෙතෙම යලි රතු කැටය මේසය මත තැබුවේය.

"මේවා ජේනුයින් බඩු!" ඔහු රතු කැටය අඟනා එකක් බව ඒත්තු ගත්තාක් මෙන් පැවසීය.

"මේව අනිද්දට හොංකොං වල!" ජගත් සිං මතක් කලේය.

මොහොතක නිහැඩියාවක් පැවතිණි. එදිරිසිංහ දිගු කල්පනාවලියක වෙලී සිට, එක්වරම බණ්ඩා වෙත හැරුනේය.

"මා ළඟත් තියනවා බඩු ටිකක්. හොංකොං වලට යවන්න. තමුසෙගෙ යාළුවට පුළුවන්ද ඒක ගිහින් දෙන්න" ඔහු තරමක පහත් හඬින් විමසීය.

බණ්ඩා තම මිතුරා දෙස ප්‍රශ්නාර්ථයෙන් යුතු බැල්මක් හෙලීය.

"මගේ ගාස්තුව ගෙවනව නම්, ඕනැම දෙයක්"

"අපි හොඳට ගෙවනවා. ඒත් අපි තමුසෙව විශ්වාස කරන්නෙ කොහොමද?"

"මගේ රස්සාව මේක. මම මාසෙකට දෙපාරක් ලංකාව හරහා යනවා"

"අපේ සින්ඩිකේට් එක දෙගිඩියාවට වැඩ කරන්නෙ නැහැ මිස්ටර් හෙක්ටර්. විශ්වාසය තියන්න පුළුවන් අයට පමණයි මේ වගෙ වැඩ බාර දෙන්නෙ"

"මට මිනිහව ගැරන්ටි කරන්න පුලුවන්"

"තමුසෙගෙ මෙම්බර්ෂිප් නම්බර් එක"

"819....!"

එයම ප්‍රතිරාවය කල එදිරිසිංහ ඒ නොම්මරය මේසය මත තිබූ දින පොතක සඳහන් කලේය.

"මම තමුසෙගෙ ගාස්තුව හරියට ගෙවනවා. මගේ බඩු ටික හොංකොංවල ඉන්න අබ්දුල් කරිම් කියන මර්චන්ට්ට බාර දෙන්න ඕන"

"මට පුළුවන්. අබ්දුල් කරිම් තමයි එහෙ ඉන්න ලොකුම මැණික් වෙළෙන්දා" පකිස්තානු ජාතිකයා මතක් කලේය.

"හැබැයි තවත් එකක්! තමුසෙගෙ පිටිපස්සෙන් අපේ මිනිහෙකුත් හොංකොංවලට එවනව!"

"ඒකට මගේ විරුද්ධ කමක් නැහැ"

"ප්ලයිට් එක තියෙන්නෙ කීයටද?

"හෙට රෑ දොළහමාරට, කටුනායකින්"

"හරි! මිස්ටර් ජගත් සිං, නොවරදවාම හෙට රෑ හතහමාරට මෙහාට එන්න"



"ඔව්! එහෙම නම් වැඩේ හරි නේද?"

බණ්ඩා මිතුරාත් කැටුව පහලට ගමන් කොට නැවතත් විස්කි වීදුරු දෙකක් ඕඩර් කලේය.

මත්පැන් පානය කරමින් පසුවන විට බණ්ඩාගේ උකුසු ඇස් නිරායාසයෙන්ම බාර් එක දෙසට යොමු විය. බාර් එකට යාබද බිත්තියේ සවිකොට තිබූ කණ්නාඩියේ කිසියම් ඡායාවක් දුටු හෙතෙම එක් වරම තිගැස්සුනේය.

කෙසඟ පෙණුමැති මිනිසෙක් සෙමින් සෙමින් තමා කරා ලඟාවන අන්දම ඔහු කණ්ණාඩිය තුලින් දුටුවේය.

බණ්ඩා සන්සුන් විය. මිතුරාට මේ බවක් දැන්වුවහොත් ඔහු කලබලයට පත්වනු ඇත. එවිට සිහින් මිනිසාගේ කිණිසි පහරට මිතුරා ලක්වනු නොඅනුමානය. එබැවින් ඔහු එය නුදුටුවාක් මෙන් සිටියේය. එහෙත් ඔහුගේ නෙත් සහල වීදුරුව තුලින් ඉවත් නොවිණි.

විනාඩි කීපයක් ගත විය. විදුලි සැරයක් වැදුනාක් මෙන් බණ්ඩා මත්පැන් වීදුරුව පසෙකට විසි කරමින් අසුණින් ඉවතට පැන්නේය. ඉවතට පනිනවාත් සමග ඔහු තමා පසුපස කිණිස්ස එල්ල කොට ගෙන සිටි මිනිසාගේ අත තරයේ අල්ලා ගත්තේය.

කෙසඟ මිනිසා කිණිස්ස බණ්ඩාගේ යටි බඩට තබා තද කිරීමට උත්සාහ දැරූ නමුදු, බණ්ඩාගේ අයෝමය ග්‍රහණය දැඩි විය. තම මිතුරා හදිසියේම පැටලුන මේ මර උගුල දෙස විදේශිකයා විශ්මිතව බලා සිටියේය.

කෙසඟ මිනිසා එක්වරම දකුණු පය ඔසවා බණ්ඩාගේ දෙපාවලට පහරක් දුන්නෙන් ඔහු පසෙකට

තල්ලුවී ගියේය. බණ්ඩා යලි කෙලින්වීමට පෙර අකුණු සැරයක් මෙන් ඔහු කරා පහත් වූ මිනිසා කිණිස්ස බණ්ඩාගේ පපුවටම එල්ල කලේය.

එය ඒ ආකාරයෙන්ම කිණිස්ස පහත් වුනි නම් දැනට බණ්ඩා ජීවතුන් අතර නැත. දෛවයේ බලමහිමය හෝ වාසනාව නිසා හෝ වේවා බණ්ඩාගේ දකුණු පය මොහොතකින් ඉදිරියට එසවිණි.

එය වේගවත් දරුණු කරාටේ පහරකි!

මිනිසා අත තිබූ කිණිස්ස පසෙකට විසිවී ගොස් ඉවතකට වැටිණි. බණ්ඩා ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට නොපසුබට විය. විවිධ සටන් ක්‍රම ප්‍රගුණකල ඔහු හිටි හැටියේම පිම්මක් පැන කෙසඟ මිනිසාගේ ඇලපතට පා පහරක් දුන්නේය. ඒ පහරින් මිනිසාගේ ඇටකටු කීපයක් දෙදරන්නට ඇත. පහරේ වේගවත්කම කොතරම්ද යත් මිනිසා මොහොතක් නිහඬව සිට හිස සැලුවේ සිහි එලවා ගැනීමට විය හැක.

එහෙත් ඒ පහරින් ඔහු ප්‍රකෝප කරවනු ලැබීය. දරුණු තුවාල ලත් ව්‍යාඝ්‍රයකු මෙන් මාරාන්තික බැල්මක් හෙලූ හෙතෙම යලි සටනට එක්වුනේ බණ්ඩා මරා දැමීමේ චේතනාවෙනි.

සමාජශාලාවේ සිටි කවුරුත් භීතියෙන් යුතුව සටන දෙස බලා සිටියහ. එහෙත් කිසිවෙක් ඔවුන්ගේ සටන නැවැත්වීමට ඉදිරිපත් වූයේ නැත.

මේ අතර සෝපාන පථය කෙලවරට පැමිණි ඉන්දිකා මොහොතක් සටන් වැදී සිටින මිනිසුන් දෙස බලා උස් හඬින් මුර ගෑවාය.



"ඕක වහාම නවත්තනවා!"

එහෙත් එය සටන් කල දෙදෙනාට ඇසුණු බවක් නොපෙනිත.

දැන් දෙදෙනා අතර පැවතුනේ මාරාන්තික සටනකි. එහෙත් ජේම්ස් බණ්ඩා වමතින් යටිබඩට ගැසූ මාරක පහරින් කෙසඟ මිනිසා අඩපනව බිම ඇද වැටුණි. බණ්ඩා පුටුවක් ඔසවා බිම වැටී සිටි මිනිසාගේ හිස පොඩිකර දැමීමට සූදානම් වනවාත් සමග සෝපානය කෙලවරට පැමිණි කාල් එදිරිසිංහගේ ගොරෝසු කටහඬ ශ්‍රවණය විය.

"මිස්ටර් හෙක්ටර් දානව ඔය පුටුව පැත්තකට!"

ඒ කටහඬේ ගැබ් වූ ස්වරය ඕනෑම එඩිතර කෙනෙකු යටත් කරවන සුළුය.

බණ්ඩා එස වූ පුටුව සෙමින් පහත් කලේය.

කාල් එදිරිසිංහ කය ඍජුව තබාගෙන සීරුවෙන් පහලට බැස ඔවුන් සිටි තැනට ලඟා වී බණ්ඩා දෙස විමසිල්ලෙන් බැලීය.

"මොකද්ද මේ කලබලේ?" ඔහු බණ්ඩාගෙන් විමැසුවේය.

"මේක, මාව මරන්න හැදුවා"

"හේතුවක් නැතුව!"

"ඇත්තටම කිසිම හේතුවක් නැහැ"

එදිරිසිංහ හිස සැලුවේය. "මගේ ක්ලබ් එකට එන කිසිම කෙනෙකුට හිරිහැරයක් වෙන්න මම ඉඩ දෙන්නෙ නැහැ. මේ සිද්ධියට මට බොහොමත්ම කණගාටුයි මිස්ටර් හෙක්ටර්!"

බණ්ඩා ඊට තැකීමක් නොකලේය.

"මීට පස්සෙ මෙතැන ඉන්න මිනිස්සුන්ට හොඳට හැසිරීම උගන්වනව මිස්ටර්"

"මාව වරදවා තේරුම් ගන්න එපා. මෙයා මගේ මිනිහෙක් නෙවි"

"කාගෙ වුනත් කමක් නැහැ. මීට පස්සෙ මේ වගේ වැඩ කරන්න ආවොත් බෙල්ල කඩනවා"

බණ්ඩා සහ ඔහුගේ පකිස්තාන් ජාතික මිතුරා කාල් එදිරිසිංහට සුභ රාත්‍රියක් වේවායි පතා සමාජ ශාලාවෙන් පිටවූහ. ඔවුන් මෝටර් රථයට ඇතුළු වෙත්ම එදිරිසිංහ බිම වැටී සිටි මිනිසා දෙස රෞද්‍ර බැල්මක් හෙලීය.

"කාළකන්ණි පෙරේතයො.....! බාර දෙන වැඩක් හරියට කරන්න දන්නෙ නැහැ. ඒකට මොකද ගාස්තුව නම් නියම විදියට ඕනෑ" යි ගුගුලේය.

බිම වැටී සිටි මිනිසා මහත් අමාරුවෙන් නැගිට්ටේය.

"බොස්.....! ඌට පරාණ හතක් තියෙනවා. මම කිණිස්ස උස්සන කොටම ඌ කොටියෙක් වගේ මගේ ඇඟට කඩා පැන්නා....."

"දැන් ඉතින් කතා කරල වැඩක් නැහැ. ඌ හිටියටත්



වැඩිය හොඳින් ගියා" යි පැවසූ එදිරිසිංහ ඇඟිල්ලක් දිගු කොට තට්ට හිසක් ඇති මිනිහෙක් ගෙන්වීය.

"ගොලිවොග්.... මූව ගිහින් කළුවර කාමරේට දාපන්. සුමානයක් යනකන් කිසිම දෙයක් කන්න දෙන්න එපා. බොන දේ විතරයි. කාළකණ්ණි!" යි කියමින් ආපසු නැරි උඩුමහලට ගමන් කලේය.

කාමරය තුල සිටි ඉන්දිකා, එදිරිසිංහ ඇතුළු වූවාට පසු නොසන්සුන් නාවයකින් කතා කරන්නට වූවාය.

"බොස් ඒ ජේම්ස් බණ්ඩමයි කියලා හොඳටම විශ්වාසද?"

"ඇයි නැත්තෙ? ඒ ජේම්ස් බණ්ඩ තමයි. මිනිහ මෙතෙන්ට ආවෙ හොඳකට නම් නෙවෙයි"

"එකත් එකටම අර ටයර් ෆැක්ටරියේ ඇති වූ ගින්න ගැන ඉන්කුවයර් එකටද දන්නෙ නැහැ"

"ඒක දැන් පහුගියා වැඩියි ඉන්දු. මන් හිතන්නෙ අර රුසියන් කාරයගෙ මිණීමැරුම ගැන ඔත්තු බලන්න තමයි බණ්ඩා මෙහෙ ආවෙ"

තරුණියගේ මුහුණේ සැක මුසු පෙණුමක් ඇති විය.

"කිසිම දේකට බය වෙන්න එපා ඉන්දු. බණ්ඩා ක්ලබ් එකට ඇතුළු වෙන කොටම මට නිවුස් එක ආරංචි වුනා. ඉන්කුවයර් එකේ ඉන්න විලීගෙන්. ඌ ඇවිත් තියෙන්නෙ අපේ හිටපු මෙම්බර් කෙනෙකුගෙ කාඩ් එක පෙන්නල"

"මොනව! කවුද ඒ ද්‍රෝහියා...?"

"ඌ මැරිල දැනට මාස තුනක් වෙනව. ඌට කටට වෙඩිතියලා මැකලම් පාරේ මරල දාලා තිබුණා. දැන් මට තේරෙනව ඒකත් බණ්ඩගෙ වැඩක් විත්තිය. හොඳයි හෙට රෑ මම බණ්ඩට පාඩමක් උගන්වන්නම්. ඒක නොවෙයි. ඉන්දුට බැරිද බණ්ඩත් එක්ක යාළුවෙන්න"

"මට බැරි දෙයක් නැහැ!"

"හැබැයි ඌත් එක්ක යාළු වුනොත් දන්නවනේ?" එදිරිසිංහ යටැසින් ඇය දෙස බැල්මක් හෙලිය.

"ඒවායින් මට කමක් නැහැ. සී. අයි. ඒ. එකෙන් මට හොඳට ගෙවනතුරු මම සේවය කරන්න බැඳී සිටිනවා"

"එහෙනම් මම දෙන්නම් ප්ලෑන් එක. හෙටත් බණ්ඩා මෙහාට ඒවි. එතකොට අනිත් හරිය ඉන්දිකාට බාරයි" ඉන්දිකා මේසය මත වූ විදුරුවේ ඉතිරිව තිබූ විස්කි ස්වල්පය ගිලදමා දුම් වැටියක් දල්වා ගත්තාය.

මිතුරා වැල්ලවත්තෙන් බැස්ස වූ බණ්ඩා නැවතී සිටි හෝටලයට යන විට රාත්‍රී දොළහමාරට පමණ ඇත. මෝටර් රථය ගරාජයට ඇතුළු කල ඔහු හෝටලය පසෙක පුටුවකට වී නිදි කිරමින් සිටි මුරකරුවාගේ පිටට තට්ටු කරමින් උඩුමහල කරා නගින්නට විය.

ඔහු තම කාමරය ඉදිරියට පැමිණ මදක් නැවතී දොරගුල දෙස බලා සිටියේය. මොහොතකින් ඔහු ඊට නැඹුරුවී විමසිල්ලෙන් බැලීය. හැන්දෑවේ මෙතනින් පිටවී යද්දී ඔහු දොරගුලේ අලවා තැබූ කෙස් ගස දැන් දක්නට නොමැත.



අඩ සිනාවක් මුවගට නගාගත් බණ්ඩා දොර විවෘත කොට ගෙන කාමරයට ඇතුළු විය. ඔහු ප්‍රථමයෙන් ගියේ මල්පෝච්චිය වෙතය.

මල්පෝච්චිය පුරවා තිබූ ඉටිමල් සියල්ල ඉවත් කල බණ්ඩා එතුලින් කුඩා කැසට් රෙකෝඩරයක් එලියට ගත්තේය. එහි බොත්තමක් තදකල පසු බණ්ඩා සාවධානව ඊට සවන් දී සිටියේය.

ප්‍රථමයෙන් දොරක් විවෘත කරන හඬක් ඇසිණි. ඒ සමගම දෙදෙනෙකුගේ පාවහන් හඬ ශ්‍රවණය විය.

කාමරය තුල එහා මෙහා සක්මන් කරමින් ලාච්චු විවෘත කරන ශබ්දත්, පෙට්ටි අවුස්සන ශබ්දත් ඊලඟට ඇසිණි.

"මූ නම් හරි අමාරුකාරයෙක් තමයි. ෆයිල් එක අහුවෙන තැනක තියන එකක් නැහැ!"

"නැහැ..... එරික්.....! මූ හිතන එකක් නැහැ අපි මෙතනට රේඩ් එකක් දේයි කියල"

"මුගේ වැඩ හරි තීව්.... මේ බලපන් ජෝ මේන් කෙල්ලකගේ මිනිස්කර්ට් එකක්"

"බණ්ඩා ලස්සණ කෙල්ලන්ට හරි කැමතියි! අනුමානයක් නැහැ ඌ ඊයෙ රෑ ලස්සන කෙල්ලක් මෙතෙන්ට ගේන්න ඇති"

"ඌ කවදහරි මැරෙන්නෙත් කෙල්ලෙකුගෙ අතින්. හා.... හා ඉක්මන් කරපං ජෝ. ඔකා කොයි වෙලාවෙ ඒවිද කියන්න බැහැ"

ඉන්පසු රෙකෝඩරය තුලින් ඇසුණේ පාවහන් ගැටෙන හඬ පමණි. නොබෝ වේලාවකින් කාමරයේ දොර වැසී යතුරු කරකැවෙන හඬින් පසු දැඩි නිහඬතාවයක් රජයන්නට විය. බණ්ඩා වහා කැසට් රෙකෝඩරය ක්‍රියා විරහිත කොට කාමරයේ අස්සක් මුල්ලක් නැර පිරික්ෂා කර බලන්නට විය. මෙසේ අවුස්සන විට ඔහුගේ පොත්ගුලේ සඟවා තිබූ කුඩා මයික්‍රෆෝනයක් ඔහුට අසුවිය.

බණ්ඩා මයික්‍රෆෝනය අතට ගෙන පරීක්ෂා කර බලා යමක් තේරුම් ගත්තේය. තමා නැති අතර මිනිසුන් දෙදෙනෙක් කාමරයට ඇතුළුව යමක් සොයන්නට වෙහෙසී ඇත. කිසිවක් සොයා ගැනීමට නොහැකි වූ ඔවුන් හිස් අතින් නොයා තම රහස් දැන ගැනීමට මයික්‍රොෆොනයක් සඟවා ගොස් තිබේ.

බණ්ඩා මයික්‍රෆෝනයේ ක්‍රියාකාරී කොටස් ඉවත් කර දැම්මෙ මෙවැනි සූක්ෂම යන්ත්‍ර පාවිච්චි කොට තිබූ පලපුරුද්ද අනුවය.



## *4 වන පරිච්ඡේදය*

**කො**ළඹ කුරුඳුවත්තේ රොස්මීඩ් පෙදෙසේ පිහිටි දැකුම්කලු මැදුරකි. මෙහි කලකට පෙර ජීවත් වූයේ මැදුර අයිතිකරු වූ නමුදු ඔහු රටහැර ගියේ මැදුර කුලියට දීමෙන් පසුය. දැන් එහි පදිංචිව සිටින්නේ ඇමෙරිකන් ජාතිකයෙකු වූ ජෝන් ස්මිත් මහතාය.

ජෝන් ස්මිත් මෙහි පැමිණියේ ලෝකයේ රටවල් ගණනාවකම කරක් ගැසීමෙන් පසුවය. ඔහු රටකට පය තැබූ දිනයක් ඇද්ද ඒ රටටත්, රටවැසියන්ටත් කණ කොකා ඇඬුවේ එදාය.

ස්මිත් ගිය රටක අවුරුද්දකට හෝ දෙකකට වඩා පදිංචි වී නොසිටියේය. ඔහු ඒ රටේ සිටි කාලය ඇතුළත ඒ රටේ රාජ්‍ය විප්ලවයක් ඇතිවෙයි. එසේත් නැත්නම් එහි ජනාධිපති හෝ අගමැති මරු මුවට පත්වෙයි. රටේ අභ්‍යන්තර කැරලි කෝලාහල ඇතිවෙයි. එසේත් නැත්නම් විශාල ව්‍යාපාර ගින්නෙන් දා අළුවෙයි.

එහෙත් මේ කිසිවකින් ජෝන් ස්මිත්ට නම් හානියක් සිදු නොවේ. ඔහු හිටියාටත් වඩා හොඳින් ඒ රටින් පිට වී වෙනත් රටකට යයි. ඔහු ඒ රටට ගොස් නොබෝ දිනකින්ම වැඩ අරඹයි. පෙරසේම රටේ වියවුල් හා අපරාධ සංඛ්‍යාව දිනෙන් දිනම ඉහළ නගියි.

ස්මිත්ගේ එත්පොහොසත් කම් ඒ සමගම තරවෙයි. ඔහු සිනා මුසු මුහුණින් යුතුව ඒ රටින්ද හොර රහසේම අතුරුදහන්වී යයි.

ජෝන් ස්මිත් උපන්නේ ඇමෙරිකාවේ බෲක්ලින් නගරයේය. ලෝක ප්‍රකට අපරාධකරුවන් ඉතිහාසයට එක්වුන මිණීමරුවන් බිහිකල මේ අපූරු [illegible]නාල ලෝක නගරය ස්මිත්ටද නිජබිම විය. මුඩුක්කුවක උපත ලද ස්මිත් ගැටවරයෙක් වනතුරුම ඒ කලබලකාරී අනුකම්පා විරහිත වාතාවරණයෙහිම හැදුනේය. වැඩුනේය. ගැටවර වියට පැමිණෙන විට ඔහු විසින් කරනු ලැබූ හොරකම් හා සැහැසිකම් වෙනුවෙන් දෙවරක්ම චරිත ශෝධනාකාරයෙන් එළියට පැමිණියේ නැවත නොඑන බවට එහි පාලකයාට පොරොන්දුවකුත් ඇතිවය.

"ස්මිත්! උඹට වයසට වඩා මොළයක් තිබෙනවා. ඇයි ඒ මොළේ මේ වගේ පහත් වැඩ කරන්න යොදවන්නෙ. ලොන්ඩරියකට කඩා පැන එහි තිබූ මුදල් හා ඇඳුම් හොරකම් කිරීම, සාප්පුවකට පැන මුදල් කොල්ල කෑම නුඹට විරුද්ධව තිබුණ චෝදනා මේවයි. අතීතය සම්පූර්ණයෙන්ම අමතක කරල යහපත් පුරවැසියෙක් වීමට උත්සාහ ගන්න. මීට පස්සෙ ඔය මුහුණ මේ චරිත ශෝධනාගාරය තුලදී දකින්න මම කැමති නැහැ" යි චරිත ශෝධනාගාරයේ වෝඩ්න් තැන ස්මිත් නිදහස් වී යාමට පෙර සඳහන් කලේය.

"තැන්ක් යූ වෝඩ්න්! මම හොඳ මිනිහෙක් වෙන්න උත්සාහ ගන්නවා. මම මෙතෙන්ට කවදාවත් ආපහු එන්නෙ නැහැ" .පවසමින් පිළිතුරු වශයෙන් කිය.

ස්මිත් ප්‍රධාන දොරටුවෙන් පිටව යන අන්දම වෝඩ්න් බලා සිටියේ මුහුණේ අඩ සිනා රැල්ලක් රඳවාගෙනය.



ජෝන් ස්මිත් නමැති ඒ ගැටවරයාට තිබුණේ ඔහුගේ වයසේ අනිත් ගැටවරයන්ට නොමැති කපටි මොළයකි. හේ උපායෙහි දක්ෂය. කථාවෙහි චතුරය දෙඩීමෙහි ව්‍යක්තය.

හැකියාවන් රාශියක්ම සහජයෙන්ම පිහිටා තිබුණු මේ ගැටවරයා යහපත් අය ඇසුරට වැටුණහොත් ඔහු ඉක්මණින් දියුණුවට පත්වනු ඇතැයි වෝඩ්න් කල්පනා කලේය.

චරිත ශෝධනාගාරයෙන් පිට වී ආපසු බෲක්ලින් වලට පැමිණි ජෝන් ස්මිත් සතියක් පමණ ගෙදරට වී අලසව කාලය ගත කලේය. වීථියට යාමට හිත කොතරම් බලකලද ඒ හැම විටෙකම වෝඩ්න් තැනගේ අවවාදය ඔහු මෙල්ල කරනු ලැබීය. තුන්වන වතාවටත් චරිත ශෝධනාගාරයට ගියහොත් වෝඩ්න් තැනගෙන් කිසිම අනුකම්පාවක් නොලැබෙන බව ඔහු දැන සිටියේය.

සතිය ගෙවීයත්ම ජෝන්ගේ පැරණි කණ්ඩායමේ හිතවතෙක් ඔහු සොයා පැමිණියේය. චරිත ශෝධනාගාරයෙන් පැමිණි පසු ජෝන් හොඳටම වෙනස්ව ඇති බව දුටු මිතුරා විමැතිය පල කලේය.

"ඒයි ජෝන්! උඹ බයගුල්ලෙක්! බය මිනිහට බෲක්ලින්වල ජීවත් වෙන්න බැහැ!" යි ජෝන්ගේ මිතුරා වූ ජෙරී පැවසුවේය.

"මට බැහැ ජෙරී...... වෝඩ්න්....!"

"ආ..!ජෝන් උඹට ආයෙමත් වෝඩ්න් ලඟට යන්න ඕන නැහැ. උඹ දැන් නියම තරුණයෙක්. තරුණයො චරිත ශෝධනාගාරවලට යවන්නේ නැහැ. එක්කො සිංසිං

බන්ධනාගාරයට එහෙම නැත්නම් විදුලි පුටුවට" යි පැවසූ ජෙරි සිනාසුනේය.

"සිං සිං එකත් විදුලි පුටුවත් දෙකම එකයි!" ජෝන් පැවසුවේය.

"ජෝන් හොඳටම බයවෙල. ඒයි මේ බලාපන් අපට මීට පස්සෙ ඔය පොඩි වැඩ කරන්න උවමනාවක් නැහැ. ලොකු වැඩ කරන්න චාන්ස් එකක් පෑදිල තියනවා. හම් උඹ කැමතිද අහන්න. එහෙනම් ඊට ඉස්සරවෙලා සිගරැට් එකක් විසිකරපන් මෙහාට"

"ඊයෙ ඉඳල සිගරැට් එකක් බොන්න වත් තඹයක් නැහැ ජෙරි"

අධික දුම්පානය නිසා කහවන් ගැසුණු දත් පෙළ විදහා සිනාසුන ජෙරි "ඒක තමයි මම උඹට කියන්නෙ බයේ ගෙදරට වෙලා හිටියොත් හෙට අනිද්දා වෙනකොට බඩගින්නේ මැරෙන්නයි වෙන්නෙ. උඹේ නාකි අම්මට බැහැ හැමදාමත් උඹට කන්න දෙන්න. කල්පනා කරපන්!" යි පැවසූ ජෙරි සාක්කුවෙන් මිල අධික සිගරැට් පැකැට්ටුවක් එළියට ඇද්දේය.

ජෝන් කෑදර ලීලාවෙන් සිගරැට් පැකැට්ටුව දෙස බලා සිටියේය. ජෙරි මීට පෙර මේ වර්ගයේ සිගරැට් බොනවා ඔහු දැක නැත. ජෙරි සිගරැට් වැටියක් දල්වා ගෙන ඉතිරි පැකැට්ටුව ජෝන් වෙත විසි කලේය.

"ඔක්කොම උඹ ගනින්!"

"කොහෙන්ද ජෙරි මේවා?" ජෝන් සැක මුසුව විචාලේය.



"මම සල්ලි දීල ගත්තා"

"මේවා හුඟාක් ගණන් සිගරට්! කොහෙන්ද උඹට ඔච්චරටම නාස්ති කරන්න සල්ලි?"

"මම වැඩ කරනවා! ඒවට හොඳට ගෙවනව!"

"රස්සාව හොඳද?"

"නරකක් නැහැ. අපට උවමනාවටත් වැඩිය ගෙවනව නම් රස්සාව මොකක් වුනත් මොකද?"

"මොකක්ද එතැන නම?"

"නම මාෆියා සංවිධානය.....!" යි පැවසූ ජෙරි නිහඬව මිතුරා දෙසම නෙත් රඳවා ගෙන සිටියේය.

මාෆියා යන වචනය සඳහන් වෙත්ම ජෝන් විදුලි සැරයක් වැදුනාක් මෙන් තිගැස්සුනේය.

ජෝන් ස්මිත් මුව අයාගෙන මිතුරා දෙස බලා සිටියේය. අදහාගත නොහැකිවාක් මෙනි.

"ජෙරී....! උඹ කියන්නෙ බොරු" මද වේලාවකට පසු ඔහු කීය.

"බොරු නෙවී. මම දැන් මාෆියා එකේ මෙම්බර් කෙනෙක්. උඹත් කැමති නම් මට පුළුවන් මගේ ලොක්කෙකුට අඳුන්වා දෙන්න"

ස්මිත් ප්‍රථමයෙන් මාෆියා සංවිධානයට බැඳීමට කැමති නොවූ නමුදු මිතුරා ගත කරන සැපවත් දිවිය

නිසා පසුව අදහස වෙනස් කලේය. තරුණයෙකු වූ ඔහුට මුදල් අවශ්‍ය විය. හොඳ ආහාරත්, ජැන්ඩියට අඳින්න පළඳින්නත් උවමනා විය. මේ නිසා අන්තිමේදී මාෆියා සංවිධානයට එක්වීමට ඔහු තීරණය කලේය.

මාෆියා සංවිධානය ජෝන්ගේ දක්ෂකම් වලින් හැම ප්‍රයෝජනයක්ම ගත්තේය. ඔහු භයානක අපරාධකාරයෙකු, මිණීමරුවෙකු කිරීමේ ගෞරවය හිමිවන්නේ මාෆියා එකටය.

වසර කීපයක් මාෆියා සංවිධානයේ යාව ජීව සාමාජිකයෙකු වශයෙන් නොයෙකුත් අපරාධවලට සහභාගි වූ ජෝන් ස්මිත් ගැන සී. අයි. ඒ සංවිධානයට ඉව වැටුනේ මේ අවධිය තුලය. ලේ රස ඉව වැටෙන වල් සතෙකුට මෙන් සී. අයි. ඒ. සංවිධානයට මේ භයානක අපරාධකරුගේ අත්වල තැවරුණ ලේ සුවඳ දැනුනේය..

නොපමාව ක්‍රියාත්මක වූ සී. අයි. ඒ. සංවිධානය ඔහුට සාමාජිකත්වයක් දීමටත් හොඳට ගෙවීමටත් තීරණය කලේය.

මාෆියා සංවිධානයේදී අමු අමුවේ මිණී මරන්නටත් මංකොල්ල කෑමත් සේප්පු බිඳින්නටත් ශ්‍රමය යෙදවූ ස්මිත් සී. අයි. ඒ. සංවිධානයට එක් වූ පසු ඔහුගේ තියුණු මොළය යොදවා අති බිහිසුණු කර්තව්‍යයන් රැසක් ක්‍රියාත්මක කළේය. ඒ මගින් ඔහුගේ සහජ හැකියාව තව තවත් ඔපමට්ටම් විය.

සී. අයි. ඒ. සංවිධානයට විරුද්ධව නැගී සිටි ප්‍රබල දේශපාලනඥයන් රැසක්ම හිටිහැටියේම අතුරුදහන් වූයේත් විශාල ව්‍යාපාරවල අයිතිකරුවන් කිහිප දෙනෙක්ම ඔවුන්ගේ සුඛෝපභෝගී කායභ්ාලවලම පපුවට වෙඩිනබා මරාදමා තිබුනේත් ස්මිත් සී. අයි. ඒ. සේවයට එක් වූ පසුය.



එහෙත් ඇමෙරිකාවේ අති බලගතු ඇෆ්. බී. අයි. ආයතනයට ස්මිත් ගැන ඉව වැටී ගියෙන් සී. අයි. ඒ. සංවිධානය ඔහුගේ තත්වය උසස් කොට උතුරු වියට් නාමයට මාරුකොට හැරියේය.

වියට්නාමයේ ඇමෙරිකානුන් ගෙනගිය අමානුෂික යුද්ධය නැමැති අග්නි ජාලාවට ස්මිත් වනා ඇවිලෙන සුළු පැට්‍රල් ආකරයක් වැනි විය.

ජාතික විමුක්ති ගරිල්ලා භටයින් හා සටන් වදින ඇමෙරිකානුන් අතර ජෝන් ස්මිත්ද සිටියේය. ඔහු සිටියේ සංහාරක පිලේය.

මේ හිත්පිත් නැති මිණීමරුවාගේ උපක්‍රම නිසා වියට්නාමයේ සිල්වත් ගුණවත් බෞධ භික්ෂූන් කිහිප දෙනෙක්ම සියදිවි නසා ගත්හ. ඇතැමෙක් පැට්‍රල් ඇඟට දමා ගිණි දල්වා ජීවිත කෙළවර කර ගත්හ. සාමාන්‍ය අහිංසක පුරවැසියන් දහස් ගණනින් පරලොව යැවූයේ ජෝන් ස්මිත්ය.

වියට්නාමයේ සිදුවන අමානුෂික අති බිහිසුණු ප්‍රචන්ඩ ක්‍රියා නිසා ඇමෙරිකානුවන් ලෝකාපවාදයට ලක් වන්නට වූයෙන් සී. අයි. ඒ. ආයතනය ඔහු තවත් රටවල් කීපයකටම යැවිය. ඒ රටවලද පාලන බලය අවුල් කරමින් රට අභ්‍යන්තරයේ වියවුල් ඇති කල ජෝන් ස්මිත්ගේ ඊළඟ තිප්පොළ වූයේ ශ්‍රී ලංකාවය.

ලංකාවට පැමිණි ස්මිත් මෙහි ඉන්නා සී. අයි. ඒ. නියෝජිතයන්ගේ මාර්ගයෙන් කුරුදුවත්තේ බංගලාවක් කුලියට ගෙන එහි ජීවත් වන්නට වූයේය. ඔහු පිටතට පෙන්නුම් කලේ පිටරටවල් සමග වෙළඳාම් කරන විශාල වෙළඳ ව්‍යාපාරිකයෙකු ලෙසය.

දැකුම්කළු මෝටර් රථයකින් ඉදහිට එහා මෙහා ගිය ස්මිත් කල ව්‍යාපාරය කුමක්දැයි කීමට කිසිවෙකු දැන සිටියේ නැත.

සී. අයි. ඒ සංවිධානය එක් නුවනක්කාර වැඩක් කලේය. එනම් ස්මිත්ට ලංකාවේදී ඒකමතිකව තීරණයන් ගැනීමට බලය නොපැවරීමය. කොටින්ම කියතොත් ඒ ලංකාවේ සී. අයි. ඒ නායකත්වය ස්වදේශිකයෙකුටම පැවරීමය. එසේ වීමට ප්‍රධාන හේතුව වූයේ ජෝන් ස්මිත්ගේ දැඩි සැහැසිකමය.

ලංකාවේ සී. අයි. ඒ. සංවිධානයේ ප්‍රධානියා කවරෙක්දැයි දැන සිටියේ ජෝන් ස්මිත් පමණි. නායකයා දෙන අන ලැබුයේ ස්මිත්ය. ඒවා ක්‍රියාත්මක කිරීමට උප නියෝජිතයන්ට අණ දෙනු ලැබුයේ ජෝන් ස්මිත් විසිනි. නායකත්වය අබිරහසක් වශයෙන් තබා ගැනීමට හැමවිටම උත්සාහ කෙරිණි.

ජෝන් ස්මිත් තමා ඉදිරියේ වූ මෙවලමක ස්විචයක් තද කලේය. විනාඩි කීපයක ඇවෑමෙන් කාමරයේ පසුපස දොරක් විවෘත විය. විවර වූ දොර තුලින් හැඩිදැඩි මිනිසුන් දෙදෙනෙක් ඇතුලට පැමිණ ජෝන් ස්මිත්ට ආචාර කර පසෙකින් සිටගත්තේය.

ස්මිත් ඔවුන් දෙස උවමනාවෙන් නොබැලුවේය. ඉවත බලාගෙන කතා කරන්නට වුනේය.

"අජිත්, අද...... බණ්ඩා එනවද?" ඔහු මිනිසුන් දෙදෙනා අතරින් ප්‍රපුල දේහයක් ඇත්තාගෙන් විමසීය.

"බොස්....! බන්ඩා එන එක සිකුරුයි. ඉන්දිකාත් උං එනතුරු බලා ඉන්නවා"



"කොහොමද දන්නෙ?" ස්මිත්ගේ ඊළඟ පැනය නියුණුය.

"උං හිතුව බ්‍රිගේඩියර් අපිට ඇටෙව්ව උගුලෙ අපි අහුවුනා කියල"

"බණ්ඩා කපටිය! අන්තිම මොහොත වෙනකල් බණ්ඩා කරන කියන කිසිම දෙයක් විශ්වාස කරන්න බැහැ"

"මොනව උනත් අපි බණ්ඩා ගැන කවර් එකේ ඉන්නෙ. බඩු ගත්තත් නොගත්තත් අද රෑට උං ඉවර කරනවා!"

"හොදයි...! බැරි වුනොත්?"

"අපි තවත් චාන්ස් එකක් ගන්නව. බණ්ඩා ජීවතුන් අතර ඉන්න එක තමයි අපට තියෙන ලොකුම බාධාව" ස්මිත් එය පිලි ගත්තාක් මෙන් හිස වැනුවේය.

"බණ්ඩා කරදරයක් තමයි. ඒත් උගේ ලොක්ක බ්‍රිගේඩියර් තමයි අපේ ලොකුම හතුරා"

"අපි උං මරන්න ඕන!" යී ස්මිත් කෝපයෙන් කීය.

"බොස්..... බ්‍රිගේඩියර්ගේ ගන් ඩ්‍රෝ එක හරි ෆාස්ට්" මාර්ෂල් නමැත්තා සඳහන් කලේය.

"ඒත් ජිමී කොරයාට වැඩේ බාරදුන්නොත් හරියට හරි" අජිත් පැවසුවේය. ජෝන් ස්මිත් හිස සැළුවේය.

"හ්ම්....... අපි ට්‍රයිකරල බලමු!"

## 5 වන පරිච්ඡේදය

**වි**ලැඩිමීර් උස්ටිනෝවිගේ මරණය සිදු කිරීමට කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරවන පුද්ගලයන් දෙදෙනා කඳුගැටය මැදින් වැටුනු මාවත දිගේ ඉදිරියට එන ආකාරය ජිම් කොරයා ජනේලයේ වීදුරු කවුළුව තුලින් බලා සිටියේය. මෙවර ඔවුන් ගෙන එන්නේ කිනම් මෙහෙයක්දැයි කොරයා සිතන්නට විය.

"මොකද මේ පැත්තෙ! කාටද මේ පාර කණ කොකා අඩන්නෙ?" කොරයා විමසීය.

අමුත්තන් දෙදෙනා එකිනෙකාගේ මුහුණු බැලූහ.

"මිස්ටර් කොරයගෙ පළමුවැනි වැඩේට අපේ බොස් හුඟක් ප්‍රශංසා කලා. අපේ අනික් වැඩත් මිස්ටර්ට කියලම කර ගන්නයි බලාපොරොත්තුව" අජිත් නමැත්තා පැවසීය.

"මම මේ වැඩේ තවත් කරන්න බලාපොරොත්තුවක් නැහැ සහෝදරයා!"

නමුත් මාර්ෂල් දැඩි උනන්දුවකින් යුතුව කතා කරන්නට විය.



"මිස්ටර් කොරයාගේ මුලු ජීවිතේම ගත වුනේ මිනීමරන්න. මිනීමරන එක තරම් විනෝදයක්, ප්‍රීතියක් මිස්ටර්ට තවත් ඇත්තේම නැහැ. එහෙම නේද?"

"ඒත් මම පැන්ෂන් ලබාපු නාකියෙක්!"

"ඒ උනත් ඔය අත්දෙක වගේ, ඔය මොලේ වගේ මොලයක් තවත් ඇත්තේම නැහැ. සී. අයි. ඒ. එකට මිස්ටර් කොරයගෙ සේවය නැතුවම බැහැ!"

"උස්ටිනෝවිගෙ මිනිමැරුම ගැන දැන් රට පුරාම හොයනව. බැරිවෙලාවත් මා ගැන හෝඩුවාවක් ඇති වුනොත් ඔක්කොම ඉවරයි"

"අපිටත් ආරංචියි......! ජේම්ස් බණ්ඩා මේ ගැන හොයනවයි කියල" අජිත් මතක් කලේය.

කොරයාගේ මුහුණේ මෙතෙක් තිබූ පැහැය වෙනස් විය. ඔහු කණස්සලු ගතියෙන් හිස බිමට යොමුකර ගත්තේ කල්පනා කිරීමට මෙනි.

අජිත් නොසන්සුන් වූයේ මෙවිටය.

"මොකද මිස්ටර් කොරයා එක පාරටම වෙනස් වුනෙ?"

"බණ්ඩා හරි දක්ෂයි! බ්‍රිගේඩියර් එම්ගේ හොඳම ඔත්තුකාරයා!"

"ඒ වුනත් මිස්ටර්ට කිව්වු කරන්න බණ්ඩට බැහැ. අපි මේ ආවෙත් බණ්ඩගෙ මේ හොල්මන් කිරිල්ල නතර කරවන්නයි"

කොරයා අමුත්තන් දෙස ප්‍රශ්ණාර්ථයෙන් බැලීය.

"බණ්ඩාගේ ජීවිතයට හානියක් කරන්නද? මම ඒ ඉලන්දාරියත් එක්ක එකම තැනයි වැඩකලේ" කොරයා පැවසීය.

"අපිට බණ්ඩා මරන්න උවමනාවක් නැහැ මිස්ටර් කොරයා. බණ්ඩා මේ වැඩවලට යොදවන බ්‍රිගේඩියර් එම් මරා දැම්මොත් හොඳටම ඇති!"

ජිමී කොරයා එක්වරම කොක්හඬලා සිනාසෙන්නට පටන් ගත්තේය. අමුත්තන් කී දෙය උපහාසයට ලක් කරන්නාක් මෙන් ඔහු සිනාසුනේය.

"බ්‍රිගේඩියර් එම් මරන්න? ඒක විහිළුවක්! ඒක කරන්න පුළුවන්. මිනිහ කවුද?" ජිමී සිනාසෙන අතරම අමුත්තන්ගෙන් පිලිවිසියේය.

අමුත්තන් දෙදෙන පිපිලිසරව කොරයා දෙස බලා සිටියහ. කොරයා මෙසේ පැවසුවේ මන්දැයි ඔවුන්ට තේරුම් ගත නොහැක.

"බ්‍රිගේඩියර් මරණ එක ඒ තරම් අමාරුද? අජිත් පිලිවිසියේය.

"පුළුවන් කමක් තියනවානම් තමුසෙලා මාව හොයා ගෙන එන්නෙ නැහැ"

"අපි ට්‍රයි කලේ නැහැ" මාර්ෂල් කිය.

"ට්‍රයි කරල බලනව. හැබැයි ජීවතුන් අතර ඉන්න තියෙන ආශාව අත්හැරලා!"



"මිස්ටර් කොරයා බ්‍රිගේඩියර් මැරුවොත් අපි උස්ටිනෝව්ගෙ වැඩේටත් වැඩියෙන් දෙගුණයක් ගෙවනවා. සී. අයි. ඒ. එකෙන් මාසිකව වැටුපක් ලැබෙන්නත් සලස්වනවා"

"මට වැටුප් ලැබෙන්නෙ ජීවත්වෙන්න ලැබුනොත්. බ්‍රිගේඩියර් මරන්න ආපු කිසිම කෙනෙක් මේ වනතුරු පණ පිටින් ආපහු ගියේ නැහැ"

"මේ වැඩේ මිස්ටර් කොරයා කරනවද?"

"මට මේ මුලු ලෝකෙම තියෙන සල්ලි දෙනවයි කිව්වත් ඒ වැඩේ කරන්න මට නම් බැහැ. මට බොහොම කණගාටුයි"

අජිත් සහ මාර්ෂල් හිස් අතින් ආපසු ගොස් ජිමී කොරයා බ්‍රිගේඩියර් මරා දැමීමේ මෙහෙය ප්‍රතික්ෂේප කල අන්දම ජෝන් ස්මිත් හමුවී විස්තර කර සිටියහ.

ස්මිත් ඉන් කෝපයට පත්විය. "එහෙනම් කොරයත් බ්‍රිගේඩියර්ට බයයි! ඒ වැඩේ මත් කරන්නම්! මම බෘක්ලින්වල උපන් මිනිහෙක්! හෙට බ්‍රිගේඩියර් ග්‍රෑන්ඩ් ක්ලබ් එකට එනවනෙ?"

"ඔව් බොස්. හැමදාම රාත්‍රි හත හමාරට බ්‍රිගේඩියර් ක්ලබ් එකට එනවා"

"යන්නෙ කීයටද?"

"රෑ නමය හමාරට"

"සිරිතක් වශයෙන් කරනවද?"

"ඒක බ්‍රිගේඩියර්ගෙ පුරුද්දක්. ඒත් ක්ලබ් එකට යන්නෙත්, එන්නෙත් වට රවුමකින්"

"ඊයේ ගිය පාරෙ අද යන්නෙ නැහැ"

"කමක් නැහැ. හෝටලේට එනව නම් ඒ ඇති"

පසුවදා රාත්‍රි ජෝන් ස්මිත් ග්‍රෑන්ඩ් ක්ලබ් එකට ඇතුලුවන විට රාත්‍රි හතට පමණ ඇත. ඔහු බාර් එක අසල මේසයක වාඩි වී වේටරයෙකු ලවා විස්කි ගෙන්වා ගත්තේය.

ඔහු සිටි තැනට ශාලාවේ ඕනෑම කෝණයක් හොඳින් දිස්වෙයි. ඇතුල්වන හා පිටවන අය කෙරෙහි විමසිල්ලෙන් සිටීමටද මෙය කදිම ස්ථානයකි.

විස්කි වීදුරුව දිව ගාමින් දුම්වැටි එකින් එක පුළුස්සමින් සිටි ඔහු බ්‍රිගේඩියර්ගේ අවසානය ගැන සිතන්නට විය. ඔහු මරාදැමූ විට ලංකා රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ කියුම් කෙරුම්ද එකින් එක හමාර වෙයි.

බ්‍රිගේඩියර් ජීවතුන් අතරින් තුරන් වූ විට තමාට මේ රටේ ඕනෑම දෙයක් කල හැකිය. නායකත්වය කෙසේ වෙතත් ජෝන් ස්මිත්ගේ අභිමතාර්තය පරිදි කටයුතු කල හැක. මුදල් හා රූමත් ස්ත්‍රීන්ගේත් අඩුවක් නැතිව යෙහෙන් වැජඹීමට තමාට ඉඩකඩ සැලසෙනු ඇත.

මාෆියා එකේ සිටියදී ප්‍රති විරුද්ධවාදීන් මරා දැමූ අකාරය ජෝන් ස්මිත්ට මතකයට නැගෙයි. දරුණු චිකාගෝවේදී පවා මෙවැනි බිහිසුණු දේ කර පලපුරුද්ද ඇති ඔහුට දැන් අවශ්‍යව ඇත්තේ බ්‍රිගේඩියර්ගේ පැමිණීම පමණි.



හරියටම හතයි තිහ පමණ වනවිට බ්‍රිගේඩියර්ගේ රුව ඉදිරිපස දොරින් ඇතුළු විය. ඉතාමත් සන්සුන්ව ගමන් ගත් "එම්" සමාජශාලාවේ කෙළවරේම අසුනේ වාඩි විය.

වේටර් කෙනෙකු ඉතා යටහත් පහත් ලීලාවෙන් ඔහු කරා පැමිණෙන අන්දමත් බ්‍රිගේඩියර් ඔහුට මොනවාදෝ ගෙන ඒමට කියන අයුරුත් ජෝන් යටැසින් බලා සිටියේය.

මුලු ආසියාවේම වේගවත් වෙඩික්කාරයා වශයෙන් නම් දැරූ එම්ගේ මුහුණට මුහුණලා වෙඩි තැබිය නොහැකි බව මුලු රටපුරාම ප්‍රචලිතව තිබූ මතයකි. එහි සත්‍යතාවය ස්මිත් නොදනී. ඇතැම් විට එය එම් විසින්ම ප්‍රචාරය කරවන ලද්දකැයි ස්මිත් කල්පනා කලේය. කෙසේ වෙතත් සී. අයි. ඒ. සහ යූ. ඊ. ඕ. ආදී භයානක සංවිධාන සමග නිරතුරුවම ගැටෙමින් කාලය ගත කරන එම්ට එවැනි හපන්කම් කල නොහැකි නම් මෙපමණ කල් ජීවත්වීමට නොහැකි බව ස්මිත්ට කල්පනා විය.

එම් විස්කි වීදුරුව තොලගාන අතර දුම්වැටියක් උරන්නට විය. ඒ අතර වේටරයාට සන්කර පහත් හඬින් යමක් කීය.

"හොඳමයි සර්!" වේටරයා පවසනු ස්මිත්ට ඇසින.

විනාඩියකින් වේටර් නැන ආපසු ඇවිත් පුවත්පතක් ඔහුට දී ආපසු ගියේය. ඔහු පුවත්පතේ මුල් පිටුව දෙස නෙත් රඳවාගෙන සිටියේ ශාලාවේ සිටි අනෙක් අය ගැන විමසිලිමත් නොවීමෙනි.

ස්මිත් සූදනම් විය. එම්ගේ අවධානය පුවත්පත කෙරෙහි යොමුවී ඇත. එක් අතක විස්කි වීදුරුවකි. අනෙක්

අතේ පුවත් පතක් තිබෙන විට පහසුවෙන්ම මරාදැමිය හැක. සමාජශාලාවේ සිටි කෙනෙකු තමා මරා දමන්නට ඉදිරිපත් වෙතැයි බ්‍රිගේඩියර් කල්පනා නොකලා විය හැක.

දැන් ජෝන් ස්මිත් අත පොයින්ට් .25 කුඩා පිස්තෝලයකි. පිස්තෝලය මේසය යටින් එම් දෙසට එල්ල කල ස්මිත් නිවැරදිව ඉලක්කය එල්ල කලේය.

විශ්මයකි! ස්මිත්ගේ ඇඟිලිවලින් පිස්තෝලයේ ලිවරය තදවීමට මොහොතකට කලින් ශාලාව තුලින් වෙඩි හඬක් නිකුත් වින. ඒ සමගම පිට පිට දෙවරක්ම වෙඩිහඬ නැගිණ.

එම් මෙතෙක් වේලා නෙත් රඳවා ගෙන සිටි පුවත් පත පසෙකට විසිකර වාත වේගයෙන් පුටුවෙන් ඉවතට පැන්නේ දුම් නගින රිවෝල්වරයකුත් අතැතිවය.

ස්මිත්ගේ වම් බාහුවෙන් ලේ ගලා යන්නට විය. එම් දෙසට එල්ලකල පිස්තෝලය ගිලිහී බිම වැටී තිබිණ. ස්මිත් වේදනාව ගැන නොතකා එක්වරම සමාජ ශාලාවේ ද්වාරය දෙසට දුවන්නට වූ අතර එම් අඩි කීපයක් ඉදිරියට තැබුවේ සන්සුන්වය.

ස්මිත් පසු නොබලාව දුවගොස් නවතා තිබූ මෝටර් රථයකට ඇතුළු විය. ඒ සමගම තවත් පුද්ගලයින් දෙදෙනෙක් ශාලාව දෙසට වෙඩි තබමින් දිව අවුත් ඔහුගේ රථයට ඇතුළු විය.

ඒ අජිත් සහ මාර්ෂල්ය!

මොහොතකින් ස්මිත් මෝටර් රථය මාරාන්තික වේගයකින් පදවා ගෙන යනු දක්නා ලදී.



සතුරන් පලාගිය බව වටහා ගත් එම්, යලි පෙර සිටි ස්ථානයේම අසුන් ගත්තේය. ශාලාව තුල සිටි කිසිවෙක් මේ සිදුවීම ගැන ප්‍රශ්ණ කිරීමට එම් වෙත නොපැමිණීම පුදුමයට කරුණකි. එහෙත් ප්‍රධාන වේටර් තැන පමණක් ඔහු කරා සිරුවෙන් පැමිණියේ අඩ සිනහවකින් මුව සරසා ගෙනය.

"සර්! මිනිහ යන්තම් බේරුණා" වේටර් තැන සරදම් ස්වරයෙන් කිය.

"කවුද මාටින් ඒ?"

බ්‍රිගේඩියර් ප්‍රශ්ණාන්විත බැල්මක් හෙලිය.

"මම අඳුරන්නෙ නැහැ සර්. ඔය මිනිහ මෙහේ ආ පළවෙනි වතාව"

"කීයට විතරද මිනිහ ආවේ?"

"සර් එන්න විනාඩි ගානකට කලින්. ඇවිත් සර් ගැන ඇහුව. මට සැක හිතුනේ ඒ හින්ද සර්. ආපු හැටියෙම මම "මෙනු" කාඩ් එකේ ඒ මේසෙ නොම්මරේ සඳහන් කලේ ඒ හින්දයි"

"මාටින් පත්තරේ ගෙනත් දුන්නෙ නැත්නම් මට මිනිහට වෙඩි තියන්න ලැබෙන්නෙ නැහැ. උගෙ හිතේ මම පත්තරේ බලනවයි කියල. නමුත් මගේ ඇස් තිබුනේ ඌ දිහා"

"කොයි හැටි වෙතත් මගේ ජීවිතේ බේරුවට මාටින්ට බොහොම ස්තුතියි" යි බ්‍රිගේඩියර් එම් කෘතඥ පූර්වකව පැවසීය.

"මම සර්ට කැමතියි. රට ජාතියට කරන සේවය නිසා මට එක වෙලාවකට සර් ගැන ආඩම්බර හිතෙනවා. ඒ නිසාම තමයි මෙතැනට යන එන සැක කටයුතු මිනිස්සු ගැ.ජ. මං සෙවිල්ලෙන් ඉන්නෙ. උන් දන්නව සර් මෙහාට නොවරදවාම එන බව. අනිත් දවසෙ සර්ට හානියක් කරන්න එන එකා මරන්නෙ මම....' වේටරයා උද්වේගයෙන් යුතුව පැවසුවේය.

බ්‍රිගේඩියර් ග්‍රෑන්ඩ් ක්ලබ් එකෙන් පිට වුනේ හරියටම රාත්‍රී නවයකුත් තිහටය. සිරිත් පරිදි ඔහු මාවත් කිපයක් ඔස්සේ ගමන් කිරීමෙන් අනතුරුව නිවසට ලඟාවිය.

මෝටර් රථය ගරාජයට ඇතුළු කල එම් ඉස්තෝප්පුවට ගොඩවිය මැද සාලයේ දොර විවර කොට ගෙන ඇතුළු වනවාත් සමගම එම් විදුලියක වේගයෙන් ආපසු හැරුනේ පිස්තෝලයෙන් වෙඩි තබන අතරය.

එම්ගේ පිටුපසින් පැමිණි තැනැත්තෙක් ලේ විලක් මැද වැතිර පණ අදින්නට විය. වටපිට බලා තවත් සතුරන් නොමැති බව ස්ථිරවම වටහා ගත් එම් ගෙතුලට ගමන් කලේ කණස්සළු ගතියෙනි. ඒ කණස්සළු ගතියට හේතුවක් ඇත. හේතුව මෙසේය.

ම රාත්‍රියකම බ්‍රිගේඩියර් සමාජ ශාලාවේ සිට ආපසු පැමිණ ගරාජයට රිය ඇතුළු කරනවාත් සමගම ගරාජයේ මුල්ලක කොල පැහැති විදුලි බුබුලක් දෙවරක් දැල්වී නිවී යයි. එයින් හැගෙන්නේ ගෙතුල අණතුරක් නැති බවය. එය බ්‍රිගේඩියර් විසින් ඔහුගේ හිතවත් සේවක පියදාසට පුහුණු කරවනු ලැබුවකි.

එහෙත් අද පියදාසගේ සංඥා වලිය නොදැල්වීමෙන් ගෙතුල අණතුරක් ඇතිබව බ්‍රිගේඩියර් කල්තියාම දැන



ගත්තේය. පියදාස ජීවතුන් අතර සිටියා නම් කොල පැහැති විදුලි බුබුල දැල්වීමට කිසිසේත් අමතක නොකරයි. නිවසට ඇතුළු වූ යමෙක් පියදාස මරාදමා තමා ආපසු එනතෙක් අඳුරේ සැඟවී ඉන්නා බව බ්‍රිගේඩියර් තේරුම් ගත්තේය.

ඔහු මැද ශාලාවේ දොර හරිනවාත් සමග ක්ෂණයකින් වෙඩි තබමින් ආපසු හැරුණේ ඒ හේතුව නිසාය. අඳුරට පිටුපා ඉන්නා විට පිටුපස අඳුරේ සැඟවී ඉන්නා තැනැත්තා ඉදිරියට විත් තමාට වෙඩි තබන බව එම් පළපුරුද්දෙන්ම දැන සිටියේය.

ඔහුගේ සිතීම නිවැරදිය. ඒ නැවැරදි සිතිවිල්ල නිසා මෙවන් අවස්ථාවලදී ඔහුගේ ජීවිතය රැකුණේය.

බ්‍රිගේඩියර් එම් කාමරයක් පාසා යමින් පියදාස සෙවූ නමුදු ඔහු පෙණෙන්නට නොසිටියෙන් අවසානයේදී නාන කාමරයේ දොර විවෘත කර බැලීය.

පියදාසගේ මළසිරුර නාන තටාකයේ ගිල්වා තිබෙන අන්දම දුටු බ්‍රිගේඩියර්ගේ හිතට මහත් සංවේගයක් ඉපදිණි.

00 අංශයේ සේවය කල ඔත්තුකරුවෙකු යම්කිසි සතුරෙකු අතින් මිය ගියාට බ්‍රිගේඩියර් දුක් නොවන්නේය. අනෙකක් තබා ඔහුගේ විශේෂතම, දක්ෂ ඔත්තුකාරයා වූ ජේම්ස් බණ්ඩා සතුරෙකු අතින් මිය ගියද ඔහුට මේ තරම් ශෝකයක් ජනිත නොවේ. ඒ මන්ද? ඔවුන් මොහොතින් මොහොත මරණය බලාපොරොත්තුවෙන් ජීවත් වන්නවුන් හෙයිනි.

එහෙත් පියදාස......!

ඔහු අහිංසකයෙකි. අවුරුදු හත අටක් බ්‍රිගේඩියර්ට අවංකව, නිහතමානිව සේවය කල, කාත්කවුරුවත් නැති අසරණයෙකි. එහෙත් ඒ අහිංසකයාට තිබුණේ රත්තරන් හිතකි. මුතු මැණික්වලටත් වඩා අගනා හදවතකි.

මීට ප්‍රථමයෙන් සී. අයි. ඒ. සංවිධානයත් පෞද්ගලික සතුරනුත් පියදාසට අල්ලස් දී බ්‍රිගේඩියර් මරා දැමීමට පෙළඹවීමට උත්සාහ දැරූහ.

ඔහුට දීමට සූදානම් වූ අල්ලස සුළු පටු මුදලක් නොවේ. රුපියල් ලක්ෂයකි. එය සී. අයි. ඒ. සංවිධානයේ අල්ලසයි!

එහෙත් පියදාස ඒ කිසිවකුට තම හාම්පුතා පාවා දීමට ඉදිරිපත් නොවිය. අල්ලස් දීමට ඉදිරිපත් වූ අය ගැන විස්තරත් හැඩහුරු කමුත් ඔහු හාම්පුතාට පසුව විස්තර කලේය.

මෙතරම් අවංක හිතැතියෙක් අකාලයේ මරුමුවට පත්වීමෙන් පහසුවෙන් කම්පා නොවන බ්‍රිගේඩියර් පවා අතිශයෙන් කම්පා විය. පියදාස මිය ගියේ ඔහු කල වරදක් නිසා නොවේ. ඒ තමා වෙනුවෙන්ය යන හැඟීම බ්‍රිගේඩියර් දැන සිටියේය.

මාගෙන් සදහටම වෙන්ව ගිය හිතැතියෙකු දෙස අවසාන බැල්ම හෙලන්නාක් මෙන් පියදාසගේ නිශ්චල මලසිරුර දෙස දිගු වේලාවක් බලා සිටි බ්‍රිගේඩියර් ආපසු හැරී යලි මැද සාලය කරා පැමිණියේ වාවා ගත නොහැකි කණස්සල්ලකින් යුතුවය.

වෙඩි වැදුන දාමරිකයා තවමත් පණ අදිමින් සිටී. බ්‍රිගේඩියර් කෝප සහගතව ඔහු වෙත ලඟා විය.



"කවුද මිනිහො උඹ මෙහාට එව්වේ?"

තුවාල ලත් මිනිසා දෙනෙත් විවර කලේය. කතාකල නැනැත්තා අඳුනා ගත්තේත් ඔහුගේ මුහුණේ භීතිය පලවිය.

මාරයා පෙනි පෙනී සිටි නැනැත්තෙකු වුවද ඔහු මරුවාට බිය නොවිය. එහෙත් බ්‍රිගේඩියර්ට බියවූයේ ඇයි?

"කතා කරපන්....! මාව මරන්න එව්වෙ කව්ද?"

තුවාල ලැබූ මිනිසා මහත් ආයාසයෙන් මුව විවර කලේය. එහෙත් කතා කිරීමට තරම් ශක්තියක් ඒ මොහොතේ ඔහුට නොපෙණුනි.

බ්‍රිගේඩියර් නොයිවසිලිමත් විය. තම හිතෛශී සේවකයා මරාදැමූ නැනැත්තාට එතරම් දයාවක් පෙන්වීම හෝ නොකටයුතුය. ඔහු රිවෝල්වරය අතට ගත්තේය.

"අර අහිංසක කොලුව මරා දැම්ම කාලකණ්ණියා. මම උඹත් ඉක්මණටම පරලොව යවන්නම්" කියමින් රිවෝල්වරය මිනිසාගේ හිසට එල්ල කලේය.

මරුවිකල්ලේ සිටි මිනිසා අධික භීතිය නිසාම කතා කිරීමට අවසන් උත්සාහය දැරිය.

"මම ඒ.... කොලුවට.... වෙඩි තිබ්බෙ නැහැ, සහතිකයි!". ඔහු දුබල හඬින් කීය.

"එහෙනම් කව්ද මිනිහො ඒ වැඩේ කලේ?"

"මාර්ෂල්!"

"කවුද මාර්ෂල් කියන්නෙ?"

"අපේ බොස්ට වැඩ කරන මිනිහෙක්"

"බොස් කවුද?"

"ජෝ....න්.... ස්මිත්.....! " ඔහු අමාරුවෙන් කීය.

බ්‍රිගේඩියර් රිවෝල්වරය එසවිය. පණ අදින මිනිසාගේ හිසට දෙවරක් වෙඩි තැබූ ඔහු ආපසු හැරුණේ සැහැල්ලු සිතිනි.

බ්‍රිගේඩියර් එසේ කලේ අණුකම්පා විරහිතවය.

තුවාල ලත් මිනිසා ජීවත්වුවද ඔහු සදාකාලික පිස්සෙක් වනු ඇත. පිස්සෙක් නැත්නම් ඔහු අංගවිකල වූ කාළකණ්ණියෙක් වනු නොඅනුමානය. තුරඟ තරඟ වලට සහභාගිව අඩපණ වූ අශ්වයෙක් මරා දැමීම සාමාන්‍ය සිරිතය. එමෙන්ම ඔත්තු බැලීමට, කුලියට මිණීමැරීමට යෙදවූ අයද ඒ ආකාරයෙන්ම මරා දැමීම සාධාරණය.

බ්‍රිගේඩියර් නගරයේ ඉහලම අවමංගල්‍යාගාරයට ටෙලිෆෝන් කලේ ඉන්පසුවය.

"මීක් ලියෙන්...... මිණීපෙට්ටියකුත්, රතු කානේෂන් මල්වඩමකුත්...... බගතලේ පාරේ නො. 28ට ගේන්න"

"ඕ... කේ.... සර්....!"

මියගිය පියදාසගේ මළගම චාන් එහෙත් උසස් අන්දමින් පැවැත් වූ බ්‍රිගේඩියර් ඔහුගේ මිණීපෙට්ටිය වල තුලට බහා ලන්නට පෙර එක් පොරොන්දුවක් විය.



"පියදාස අහිංසක උඹ මා නිසා අකාලයේ මිය ගියා. කමක් නැහැ. උපන් සත්වයාට මරණය නියත නිසා මම සැනසෙන්නම්. ඒත් උඹේ මරණය ඉක්මන් කල ඒ ජෝන් ස්මිත්ගෙන් මම පලි ගන්නවා. උඹව වෙඩිතියල මරාදැම්ම වගේම මම උංවත් මරාදාන්න පොරොන්දු වෙනවා" පියදාසගේ මිණීවලට අවසන් පස්මිට දමමින් එම් පැවසුවේය.

**** **** **** **** ****

ජේම්ස් බණ්ඩා සහ ඔහුගේ විදේශීය මිතුරා නියමිත වේලාවට "ඇලෝමා" සමාජශාලාව කරා ලඟා වූහ. කාල් එදිරිසිංහ සහ සුරූපී ඉන්දිකා ඔවුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියහ.

"අපි නියම වෙලාවට ආව" බණ්ඩා පැවසීය.

"ඔව් අපිත් ලෑස්තිවෙලා හිටියෙ" කාල් එදිරිසිංහ සුහද ලීලාවෙන් කීය.

"බඩු ලෑස්තිද?" ඒ බණ්ඩාගේ බෝරා ජාතික මිතුරාය.

"ඔව්.... යමු උඩට!"

උඩුමහලේ එක්තරා කාමරයකදී ඉතා වටිනා මැණික් ගල් කිපයක් කාල් එදිරිසිංහ විසින් පකිස්තාන් ජාතිකයාට දෙනු ලැබිය.

"මේ ගල් ලක්ෂ ගණනක් වටිනවා. මේවා හොංකොං වලදී ඊටත් වැඩි මුදලකට විකුණ ගන්න පුළුවන්. මේව හෙට කොහොම හරි මිනිහට ලැබෙන්න සලස්වන්න ඕන.

බඩු ලැබුනද නැද්ද කියල ඉස්මයිල් නෙව රට ටෙලක්ස් එකක් එවාවි"

මොවුන්ගේ මැණික් ගල් ජාවාරම කොතරම් ප්‍රබල සංවිධානයක් ඇතිව කෙරෙන්නක්දැයි ඒ වචන කීපයෙන් බණ්ඩා තේරුම් ගත්තේය.

මැණික් ගල් පකිස්තාන් ජාතිකයාට දීමෙන් පසු කාල් එදිරිසිංහ ඔහුටත්, බණ්ඩාටත් ඇසෙන සේ පොඩි අනතුරු ඇඟවීමක්ද කලේය.

"මේ බඩු ඉස්මයිල් අතට පත්වෙනකම්ම අපේ මිනිහෙක් තමුසෙව කවර් කරනව. වංචාවක් කලොත් ආයෙත් අපෙන් කිසිම සමාවක් නම් නැහැ"

"එහෙම දෙයක් වෙන්නෙ නැහැ!" පකිස්තාන් ජාතිකයා කීය. බණ්ඩා ඊට මද සිනාවක් පෑවේය.

නොබෝ වේලාවකින් මෝටර් රථයකට ඇතුළු වූ ඔවුන් කටුනායක ගුවන් තොටුපල කරා පිටත් වූහ. කාල් එදිරිසිංහ සහ ඉන්දිකා පසුපස අසුනේත්, බණ්ඩා සහ ඔහුගේ මිතුරා ඉදිරිපස අසුනේත් වාඩිවී සිටියහ.

රථය ගුවන් තොටුපලට පැමිණෙන තුරු කිසිවකු කතා නොකලහ. බණ්ඩා බර සිතිවිල්ලකය. එහෙත් මිතුරා සිනාමුසු මුහුණින් යුතුව මග දෙපස බලා සිටියේය.

ඔවුන් කටුනායක ගුවන් තොටුපල අබියස මෝටර් රථයෙන් බැස්සෝය. පකිස්තාන් ජාතිකයා බණ්ඩාටත් අනෙක් අයටත් සුබපතා ගුවන් මගීන්ගේ ප්‍රවේශපත් පරීක්ෂා කරන ස්ථානය වෙත ගියේ කිසිදු බියක් චකිතයක් නැති අන්දමිනි.



එහෙත් කාල් එදිරිසිංහ හා ඉන්දිකා ගැහෙන හදින් යුතුව ඒ දෙස බලා සිටියහ. නිලධාරීන් ඔහු ලඟ සඟවාගෙන තිබූ මැණික්ගල් අල්ලා ගත්තොත් ඔවුන්ට වන පාඩුව සුළු පටු නොවේ.

එහෙත් නිලධාරියා පකිස්තාන් ජාතිකයා දැඩි පරීක්ෂණයකට ලක්නොකොට යන්නට ඉඩ හැරියේය. ගුවන් යානය ලඟාවීමට තවත් විනාඩි විස්සක් පමණ තිබුනෙන් පකිස්තාන් ජාතිකයා විවේකාගාරයට වී කල් මරන්නට විය.

විනාඩි කීපයක් ඇතුලත ඔහු පිටවීමේ දිශාවට යනු පෙනින.

විනාඩි කීපයක් ගත වූ නමුදු විජාතිකයා ආපසු නොපැමිණියෙන් කාල් එදිරිසිංහ නොසන්සුන් විය. ගුවන් යානයද පැමිණ දැන් විනාඩි කීපයක් ගතව ඇත. මගීන් හැම කෙනෙකුටම යානයට පැමිණ අසුන් ගන්නා ලෙස ශබ්ද වාහිනී යන්ත්‍ර මගින් දන්වන ලදී.

කාල් එදිරිසිංහ තවත් ටිකක් ඉවසුවේය. එහෙත් ඔහුගේ ඉවසීමේ සීමාව කෙළවර වූයේ ගුවන් යානය පිටත්වීම සඳහා අවසාන වශයෙන් දොරටුවද ඉවත් කරනු ලැබීමෙන් පසුවය.

එක්වරම රිවෝල්වරයක් අතට ගත් හෙතෙම එය බණ්ඩාගේ පිටට තබා පහත් හඬින් කතා කලේය.

"ජේම්ස් බණ්ඩා.... තමුසෙ හැදුවෙ අපිව උගුලක් අටවන්න නේද? නමුත් අපි තමුසෙලාගෙ උගුලේ අහුවුනේ නැහැ අයියෙ. දැන් ඉතින් ශබ්ද නොකර ගිහින් කාරෙකට නගිනව. නැත්නම් මෙතනම මරා දානව"

ඒ කටහඬ තර්ජණයකි. ඒ තර්ජණය ඒ සැටියෙන්ම ක්‍රියාත්මක කරනු ලබනවාට කිසිදු සැකයක් නැත.

බණ්ඩා අන්දුන් කුන්දුන්ව එදිරිසිංහ දෙස බැලුහ.

"මොකද මේකෙ තේරුම? මම ජේම්ස් බණ්ඩා නෙවි. හෙක්ටර් වීරකෝන්!"

"අපි තමුසෙ ගැන අහල තියනවා. ජේම්ස් මොකටද සුදුලූණු පොඩි කරන්නෙ?"

ඉන්දිකා පුදුමයට පත්වූවාක් මෙන් මේ සියල්ල දෙස බලා සිටියේය.

"ඒත් මම තමුසෙලාට කිසිම වරදක් කලේ නැහැ? තමුසෙගෙ යාලුව අපට වංචා කලා. ඒත් අපි අහුවුනේ නැහැ. ඒවා ඉමිටේෂන් ගල්. මම කෙරුවෙ පොඩි ටෙස්ට් එකක්. හ්ම්.... දැන් යනව කාරෙකට!" කාල් එදිරිසිංහ සාවඥ ස්වරයෙන් කීහ.

බණ්ඩා සන්සුන්ව රිය වෙතට ගමන් කරන විට කාල් එදිරිසිංහ පිස්තෝලය සහිත අත කබා සාක්කුවේ ලාගෙනම ගමන් කලේ, බණ්ඩා කරන්නට සූදානම් වන ඕනෑම වැඩකට සූදනම්වය.

මෝටර් රථයට ඇතුළු වෙන්නට සූදනම් වෙනවාත් සමගම බලාපොරොත්තු රහිත දෙයක් සිදුවිය.

රථයට නුදුරින් නවතා තිබූ තවත් රියක සිටි තරුණියක් ගිණිකූරක් දල්වා ගින්දර දැල්වුන ගිණිකූර විදුරු කවුළුව තුලින් පිටතට විසිකලාය. මොහොතකින් පුදුමාකාර දෙයක් සිදුවිය.



ඇවිලෙන ගිණිකූර බිමට වැටෙන්නටත් පෙර ගිණිදැල්ලක් ඇවිලිණ. එය ඇසිපිය හෙලන තරම් කාලයක් ඇතුලත කාල් එදිරිසිංහගේ රථය වටකොට රවුමක් මෙන් පැතිර ගියේය.

ගින්න කාල් එදිරිසිංහගේ රථයට නුදුරින් රවුමට ඇවිලෙත්ම එහි සිටි කිසිවෙකුටත් පිටතට පැනගත නොහැකි විත. ගින්න ඇවිලෙන විට රථයේ සිටි තරුණිය සිනාසෙමින් පසු වූවාය.

බලාපොරොත්තු නොවූ මේ සිදුවීමෙන් කාල් කෝපයෙන් ගැහෙන්නට විය. ඔහු බණ්ඩාගේ පසුව දෙසට පිස්තෝලය එල්ල කරගෙන සිටියේය.

•

බණ්ඩා සරදම් සිනාවක් පෑවේය.

"එදිරිසිංහ! තමුසෙත් එහෙනම් කොටුවුනා වගෙයි නේද?" බණ්ඩා සරදම් ලෙස ඇසිය.

කාල් එදිරිසිංහ බියසුල්ලෙක් නොවේ. බියසුල්ලන්ට සී. අයි. ඒ. සංවිධානයේ තැනක් නැත. සංවිධානයේ සාමාජිකත්වය පිරිනැමෙන්නේ භීතිය යනු කුමක් කියාවත් නොදන්නා අයටය.

කාල් එදිරිසිංහ සී. අයි. ඒ. සංවිධානයට එක්වීමට පෙර අන්තර්ජාතික හොර සංවිධානයක සාමාජිකයෙක්ව සිටියේය. පිට රටවලින් හොරෙන් හෙරොයින් සහ රත්තරන් හා මැණික් ගෙන්වීමෙන් ලක්ෂ ගණන් මුදල් ඉපැයුවේය. එදිරිසිංහ ලංකාවේ සෑම යහපත් පුරවැසියෙකුටම තර්ජණයක් වන්නට වූයෙන් පොලීසිය ඔහු ගැන සෙවීමට විශේෂ රහස් ඔත්තු සේවයේ නියුතු නිළධාරීන් කිහිප දෙනෙකු පත් කලේය.

එහෙත්, මේ නිළධාරීන්ට එදිරිසිංහගේ අභිරහස් ව්‍යාපාර මැඩලීමට කිසිසේත් නොහැකි විය. එය මැඩලීමට ගිය නිළධාරීන් කිහිප දෙනෙක්ම අබිරහස් ලෙස මරු වසඟ වූහ. තවත් කිහිප දෙනෙකු අල්ලසට යට වී කරබා සිටියහ. සී. අයි. ඒ. සංවිධානය මේ අවදියේය එදිරිසිංහ ලංකාවේ සී. අයි. ඒ. ව්‍යාපාරයේ ප්‍රබල සාමාජිකයෙකු හැටියට බඳවා ගත්තේ.

ලංකාවේ ප්‍රබල දේශපාලනඥයෙකු හා රාජ්‍ය නායකයෙකු මරා දැමීමට සී. අයි. ඒ. සංවිධානය තෝරා ගත්තේ කාල් එදිරිසිංහය. පොලිස් දෙපාර්තමේන්තුවේ උසස් නිළධාරීන් කිහිප දෙනෙක්ම තමාගේ අල්ලස් ලබන බැවින් ඔහු මේ භයානක කුමන්ත්‍රණයට ඔවුන්ගේ සහායද නොමසුරුව ලබා ගත්තේය.

මේ මිණීමැරුම අන් අතකට යොමු කිරීම සඳහා බෞද්ධ භික්‍ෂූන් කිහිප දෙනෙක්ද සහභාගි කරවා ගත්තේය. කුමන්ත්‍රණය සංවිධානය කලේ එදිරිසිංහය. එය ක්‍රියාත්මක කලේ බෞද්ධ භික්ෂුවක විසිනි.

මිණීමැරුම පිළිබඳව බෞද්ධ භික්ෂුවට නඩු පැවරුනේය. අවසානයේදී ඔහු එල්ලුම් ගස් ගියේය. ලොකු මිනිසුන් කිහිප දෙනෙක් දීර්ඝකාලීන සිර දඬුවම් ලැබූහ. එහෙත් මේ හැම දෙයක්ම හිතාමතා ප්ලෑන්කල මොලය, කාල් එදිරිසිංහ අදත් යහතින් ජීවත් වන්නේය. සමාජයේ කැපී පෙනෙන සමාජ සෝධකයකු ලෙස.

මේ රාජ්‍ය නායකයා මර දැමීමට සී. අයි. ඒ. සංවිධානයට අවශ්‍ය වුනේ මන්ද?

මහජන බලවේගය නමැති සුලිසුලඟ අතරේ ඒකාධිපති වාදය නමැති රුස්ස ගස් පවා ඇඹරී පොලවට



පතිතවන බව දත් ඒ රාජ්‍ය නායකයා මේ රටේ ආරම්භ සම්පත සූරා කරමින් සිටි විදේශිකයන්ගේ විශාල සමාගම් ජාතිය සන්තක කලේය. විදේශීය ධන කුවේරයනට අයිතිව තිබූ තෙල් ව්‍යාපාර ජනසතු කලේය.

දේශීය ධනවැද්දන් ජනතාව පීඩනයෙන් පීඩනයට පත්කොට ඔවුන් සතු හැම තඹයකින්ම තම පසුම්බි පුරවාගත් ධන නිධාන වූ ඊනියා පුද්ගලික බස් සමාගම් ජාතියේ වස්තුවක් ලෙස පොදුජන අයිතියක් ලෙස නීතිගත කලේය.

සාමාන්‍ය මිනිසාගේ මානව අයිතිවාසිකම් පිළිබඳ නවෝදයක් ඇති කලේ මේ රාජ්‍ය නායකයාය. සී. අයි. ඒ. සංවිධානයට රිස්සුම් නොදුන්නේ ඔහුගේ ඉහතකී සේවයන්ය. ජනතාව තලා පෙලා සූරා කෑමේ මං සියල් වසා දැමූ විට සී. අයි. ඒ. සංවිධානය ඔහුගේ ජීවිතය විනාශ කිරීමෙන් පලි ගත්තේය. රටේ අනාගතය අභිවෘධිය අඩපණ කලේය. රට සමාජවාදය කරා යන ගමන අඩපණ කලේය. ඔවුන් ඒ සියල්ල කිරීමට ආයුධයක් කොට ගත්තේ කාල් එදිරිසිංහය.

එදිරිසිංහ ඇවිලෙන ගිනි වලල්ල දෙස බැලීය. මෙය බණ්ඩා ඇටවූ උගුලක් බව වටහා ගත් හෙතෙම පිස්තෝලය එල්ලකොට ගෙනම පස්සෙන් පස්සට ගියේ ගිනි වලල්ලෙන් පැන පලා යාමටය. එහෙත් බණ්ඩා ඉක්මන් විය.

එදිරිසිංහ ගිනි වල්ලෙන් පිටවීමට සූදානම් වෙනවාත් සමගම බණ්ඩා හිටි හැටියේම ඉදිරියට පැන එදිරිසිංහගේ යටිබඩට පා පහරක් ගැසීය. කවදත් නොවරදින ඒ කරාටේ පහර වලකාලීමට ඔහු අපොහොසත් විය. ඔහු ගිනි වලල්ලෙන් පිටතට උඩින් විසිවී ගියේ නිමේෂයක් ගතවීමට මත්තෙනි.

බණ්ඩා පැමිණීමටත් පෙර එදිරිසිංහ පලායාමට සැරසුන නමුදු මෝටර් රථයේ සිටි තරුණිය රිවෝල්වරයක් එල්ල කර ගෙන සූදානම් වී සිටියාය.

"මිස්ටර් එදිරිසිංහ.....! කලබල නොකර දානව ඔය පිස්තෝලෙ බිමට!" ඇ චියරු හඬකින් කීවාය.

එදිරිසිංහ තිගැස්සී ඇය දෙස බැලුවේය. පලායාමට තිබූ එකම මග ඇහිරී අවසන් බව දුටු කාල් පිස්තෝලය බිම දමා දෑත් ඉහලට එසවිය.

දැන් බණ්ඩාද එතැනය. තරුණිය දෙස නෙතහ බැල්මක් හෙලූ ඔහු එදිරිසිංහගේ දෑතට මාංචු දමන ලෙස දැන්විය.

"මාරි නොහිටින්න මම මෙලහකට පරලොව" බණ්ඩා සිනාසෙමින් කිය.

එහෙත් තරුණිය ඊට සිනාසුනේ නැත. ඇ 019 දෙස හෙළුවේ තියුණු බැල්මකි.

"කොහෙද ඉතින් සිහියක්. මං බලාගෙන හිටියෙ අර ජලේන් එකට නගින්න හිටිය යුරේෂියන් කෙල්ල දිහා ගිලින්න වගේ බලා ඉන්න කොට කරන්න ආපුදේත් මතක නැති වුනානේද? මම රිපෝට් කරනව බ්‍රිගේඩියර්ට"

විනාඩි කීපයකට කලින් ගුවන් තොටුපොලේ සිටි යුරේෂියන් ජාතික තරුණිය ගැන බණ්ඩාට යලි මතක් විය. ඇය ලස්සණය. ඔහුගේ කෑදර නෙත් කීපවතාවක්ම ඇගේ මසින් පිරුණු කලවා යුග්මය දෙස ගිය බව බණ්ඩාද දැන සිටියේය. මාරි තමාගේ හැම ඉරියව්වක් ගැනම සෙවිල්ලෙන් පසුවී ඇති බව බණ්ඩා තේරුම් ගත්තේය.



"මාරි මෙතෙන්ට ආවෙ කොහොමද?"

"ඕඩර්ස්! බ්‍රිගේඩියර්ගෙ ඕඩර්ස්!!"

"දැන් ඉතින් මේ දෙන්න ගිහින් බ්‍රිගේඩියර්ට බාර දෙන්න"

"දෙන්නම වධකාමරේට යවන්නයි කියල බ්‍රිගේඩියර් කිව"

"එහෙනම් දෙන්නම අරන් යන්න. හැබැයි මේ ලස්සණ කෙල්ලට වැඩිය වද දෙන්න එපා" යි බණ්ඩා ඉන්දිකා දෙස නුරා බැල්මක් හෙලමින් කිය.

මාරි 00 අංශයේ ඔත්තුකාරියන් ලෙස සේවය කල තරුණියන් කිහිප දෙනාගෙන් එකියකි. ඕ බර්ගර් ජාතික තරුණියක් වුවද සිංහල හොඳින් ලියන්නට, කියන්නට හැකියාවක් ඇතිව සිටියාය. ඕනෑම පුරුෂයෙකුගේ මන්මත් කරවීමට තරම් රූ සපුවක් ඇයට තිබිණි. ලොකු මිනිසුන් අතර ගැවසී ඔවුන්ගේ අබිරහස් දැන ගැනීමට මෙවැනි ලස්සණ කෙල්ලන් අත්‍යාවශ්‍ය බව දැන සිටි බ්‍රිගේඩියර් 00 අංශයට ඔත්තුකාරියන් බඳවා ගනිද්දී රූමත්කම ගැන හැම විටම විශේෂ සැලකිල්ලක් දැක්වූයේය.

බණ්ඩා රූමත් ස්ත්‍රීන් කෙරෙහි ලොල් බවක් දක්වන බැවින් ඔහු සමග කිට්ටු සම්බන්ධකම් නොපවත්වන ලෙස බ්‍රිගේඩියර් මේ සෑම ඔත්තුකාරියකට උපදෙස් දී තිබිණි.

මාරි නැමැති තරුණ ඔත්තුකාරිය කාල් එදිරිසිංහ සහ ඉන්දිකා විලංගු දමා මෝටර් රියතුලට ඇතුළු කරන විට බණ්ඩා ඇගේ පුෂ්ටිමත් සට්ටම් යුවලට අත තැබීය. එහෙත් ඈ එක්වරම ඔහුගේ අත ගසා දැම්මාය.

"මම රිපෝට් කරනව බ්‍රිගේඩියර්ට....."

"මොකක්ද චාජ් එක?"

"උවමනාවෙන්ම සේවය පැහැර හැරීම"

"ඒත් මම හරියට වැඩේ කලා"

"මම වෙලාවට ඇවිත් සිටිය නිසා, නැත්නම් අපේ මුළු වැඩ පිලිවෙලම අප්සෙට්.... වධකාමරේට යන්න ලෑස්තිවෙලා ඉන්නව හොඳයි"

"සැමුයි, ටයිගරුයි මගේ යාළුවො....!"

"යාළුකම පිටදී..... වධ කාමරේට ඇතුල්කලාම ඒ දෙන්නට කවුරුත් එකයි" කී ඇය මෝටර් රථයට ඇතුළුව එය ප්‍රාණවත් කරත්ම බණ්ඩා මදක් නැඹුරුව ඇගේ කෙස්කලඹ සිම්බේය.

ඈ ඊට විරුද්ධතාවයක් නොපෑවාය. ජේම්ස් බණ්ඩාගේ උණුහුම ගැන සිහින ලොවේදී පවා සිතූ තරුණියන් දුසිම් ගණනින් එකියක් පමණි මාරී.

**** **** **** **** ****

කාල් එදිරිසිංහ වේදනාවෙන් මිරිකෙන්නට විය.

වධ කාමරය තුළ පැයක් පමණ ගතකල ඔහු දැන් හොඳටම අඩපණව ඇති බව පෙනුනේ ඔහුගේ ගෙල පහතට කඩා වැටී තිබූ හෙයිනි. කාල්ගේ ඇඟිලිවල නියපොතුවලින් තව ඉතිරිව ඇත්තේ කිහිපයක් පමණි. නියපොතු රහිත වූ ඇඟිලි තුඩුවලින් අමු ලේ ගලා යමින් තිබිණි.



වධ කාමරය බාර සැම් ඉන්ජෙක්ෂන් සිලින්ඡරයක් වැනි යමක් අතැතිව කාමරයේ පසෙකට වී බලා සිටියේය. එදිරිසිංහ ලඟම සිටියේ ටයිගර්ය. ටයිගර් අත අඬුවක් වැනි ආවුධයකි. එහි තැනින් තැන ලේ තැවරී තිබුනේය.

**** **** **** **** ****

"මේ බලනව, කාල්සන්. ඇත්ත කියනවද නැද්ද? මට ලිබර්ටි එකේ ෂෝ එකට යන්න පරක්කු වෙනව."

එදිරිසිංහ වේදනාවෙන් කෙඳිරි ගාන්නට විය.

"මට පරක්කු වෙනව!" පැවසූ ටයිගර් අඬුවක් දිගුකොට ගෙන එදිරිසිංහට තවත් ලංවිය. අඬුව එදිරිසිංහගේ ඇඟිලි තුඩුවලට ලංකරන විට ඔහු හිතියෙන් කෑ ගසන්නට විය.

"එපා. එපා. මම කියන්නම්"

"ඉක්මන් කරනව....!"

"අපේ බොස් තමයි ඕඩර්ස් දුන්නෙ"

"මොනවටද?"

"බණ්ඩ මරන්න!"

"කවුද උඹලයි බොස්?"

"ජෝන් ස්මිත්....!"

"අර ඇමෙරිකන් කාරයද?"

"ඔව්!"

"ඌ මෙහාට වෙලා කරන්නෙ මොනවද? ඌ කාටද වැඩ කරන්නෙ?"

එහෙත් ප්‍රශ්නයට පිළිතුරු දීමට එදිරිසිංහ උත්සුක වූයේ නැත. ඔහුගේ මුහුණ මේ මොහොතේ මළමිනියක් මෙන් සුදුමැලි විය. මාරයා දුටුවාක් මෙන් ඔහු භීතියට පත් වූ බව පෙණින.

ටයිගර් එක්වරම අඩුවෙන් එදිරිසිංහගේ ඇඟිල්ලක් තදකොට ගන්නා විට ඔහු මරවිලාපයක් නැගීය.

"නවත්වනව... මම කියන්නම්!"

ටයිගර් ඇඟිල්ල මුදා හැරියේය.

වේදනාවෙන් මිරිකෙන්නට වූ කාල් එදිරිසිංහ වටපිට බැලිය. යමක් කීමට මෙන් මුව විවරකල හෙතෙම එක්වරම දෙනෙත් අයා ජනේලය දෙස භූතයෙකු දුටුවාක් මෙන් බැලිය.

එකෙණෙහිම භයානක වෙඩි හඬක් නිකුත් විය. වෙඩි හඬ ඇසුනේ ජනේලය දෙසිනි. කාල් එදිරිසිංහ පපුව අල්ලා ගන පසෙකට ඇලවී ගොස් බිම ඇද වැටුනි ලේ විලක් මැද.

සැම් සහ ටයිගර් පිස්තෝල එල්ලකොට ගෙන ජනේලය දෙසට දිවගිය නමුදු ජනේලය තුලින් වෙඩි තැබූ පුද්ගලයා ඒ වන විට මහා මාවතට දුව ගොස් මෝටර් රථයකට ඇතුළු වනු පෙණින. මොහොතකින් මෝටර් රථය වේගයෙන් පලා ගියේය.



කාල් එදිරිසිංහ අවසන් හුස්ම හෙලන තුරු සැම් සහ ටයිගර් නිහඬව පසුවූහ. ඔහුගේ දේහය නිශ්චල වූවාට පසු සැම් කතා කරන්නට විය.

ඉන්දිකා මේ සියල්ල දෙස භීතියට පත්ව බලා සිටියාය.

"අපරාදේ.....! එදිරිසිංහ ඇත්ත කියන්නයි හැදුවෙ. ඊට ඉස්සෙල්ලා උන් මිනිහට වැඩේ දුන්නා" ටයිගර් කීවෙ කිසිදු අනුකම්පාවක් නැතුවය.

"දැන් අපි මේ කෙල්ලගෙන්වත් ඇත්ත දැන ගනිමු" පැවසූ සැම් ටයිගර් සමග ඉන්දිකා වෙත ගමන් කළහ.

ඈ හොඳටම බියවී සිටියාය.

"දැක්ක නේද අපි එදිරිසිංහට කරපු දේවල්. ඇත්ත නොකිව්වොත් මේ නෝනට ඊටත් වැඩිය දඬුවම් දෙනවා"

ඉන්දිකාගේ දෙතොල් වෙව්ලන්නට විය. එහෙත් මරබියෙන් පසු වූ ඈ අපහසුවෙන් නමුදු දෙතොල් විවර කලාය.

"මට බණ්ඩව ටේල් කරන්න කිව්වෙ කාල්"

"මොකටද?"

"බණ්ඩා ඔත්තු බලන්න ආ නිසා"

"මොනව සම්බන්ධවද?"

"මම දන්නෙ නැහැ. මැණික් ජාවාරමක් ගැන"

ටයිගර් කෝපයෙන් තරුණිය දෙස රවා බැලීය.

"ඉන්දිකා බොරු කියන්න ලෑස්ති වුනොත් දිව එලියට ඇදල කපනව!" ගිගුරුවේය.

"මම දන්නෙ එච්චරයි"

සෑම් ඇය ඉදිරියට ආවේය. "උස්ටිනෝව් මැරුවෙ කව්ද?"

"මොන උස්ටිනෝව්ද?" තරුණිය පුදුමයට පත් ආකාරයෙන් ඇසුවාය.

"එහෙනම් මොකුත්ම දන්නෙ නැහැ නේද?" අසමින් ටයිගර් විදුලි කම්බියක් ගෙන එය තරුණියගේ ගතෙහි ගැවෙන්නට සැලැස් විය.

විදුලි සැරය වදිත්ම තරුණිය මුර ගෑවාය. වේදනාවෙන් ඇඹරෙමින්.

"එපා! එපා! තවත් නම් එපා!"

"එහෙනම් ඇත්ත කියන්න වේවි. නැත්නම් අර බලු කුඩුවට තල්ලු කරනව.... ජැකිට දවස් දෙකකින් කටට රහට කෑමක් ලැබුණෙ නැහැ" පැවසූ ටයිගර් කාමරය කෙළවරේ තිබූ තරමක් ලොකු බලු කුඩුවක් පෙන්විය.

කුඩුව තුල තරකෙකු තරම් විශාල ඇල්සේසන් වර්ගයේ සුනඛයෙක් දිගාවී සිටියේය. දිව දොට්ට දාගෙන සිටි බල්ලාගේ තියුණු නෙත් සහල යොමුවී තිබුනේ මිය ගිය එදිරිසිංහ වෙතය. ගලා යමින් තිබූ රුධිරය දකින බල්ලා වරින්වර තොල කට ලෙවකු දිස්විය.



"කාල් තමයි ලොක්කා. කා[illegible] ඉන්නවනම් ඒ ගැන මම කිසිම දෙයක් දන්නෙ නැහැ. මට හැම දෙයක්ම බාරදුන්නෙ කාල් තමයි" ඈ යාන්තමින් පැවසුවාය.

සෑම් සහ ටයිගර් එකිනෙකාගේ මුහුණු බලා ගත්හ. සතුරු ඔත්තුකරුවන් කතා කරවීමෙන් ලත් දීර්ඝ පළපුරුද්දක් ඔවුන් සතුව ඇත. සතුරු ඔත්තුකරුවන් බොරු කියන විට එය ඉවකින් මෙන් ඔවුන්ට දැනෙයි. එහෙත් තරුණිය කීවේ ඇත්තක් බව මොවුනට ඒත්තු ගිය නිසා විය හැක එකිනෙකා දෙස බලා සිටියේය.

"හොඳයි නෝනට අපි හෙට වෙනකම් කල් දෙනව. සම්පූර්ණ පාපෝච්චාරණයක් කරන්න!" යි පැවසූ සෑම් ටයිගර් සමග වධකාමරයෙන් පිටවිය.

## 6 වන පරිච්ඡේදය

ජිමී කොරයා කඳුකරයට වී ඒකාකාරී. ජීවිතයක් ගත කලේය. මෙහි පැමිණියාට පසු ඔහු සී. අයි. ඒ. සංවිධානය වෙනුවෙන් සැලකිය යුතු පුද්ගලයන් කීපදෙනෙකු පරලොව යැව්වේය.

පරලොව ගිය පළමුවැනි තැනැත්තා රුසියන් ජාතික විලැඩිමීර් උස්විනෝවිය. අනෙත් කිහිපදෙනා අතුරෙන් කෙනෙක් ඇමතිවරයෙකි. අනෙකා වෘත්තිය සමිති නායකයෙකි. අනෙක් පුද්ගලයා ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ උසස් නිළධාරියෙකි.

මේ හැම කෙනෙක්ම ඉතා සූක්‍ෂම ලෙස වෙඩි තබා මරා දමා තිබුණි. එහෙත් මිනීමරුවා කවරෙක්දැයි යන්න මේ වනතුරු කිසිම කෙනෙකුට දැනගත නොහැකිවිණ.

අදිසි බලවේගයක් විසින් මේ මිනීමැරුම් කර ඇති බව කව්රුත් සැලකලහ.

මේ මිනිසුන් මරා දැමීමෙන් කොරයා ලක්‍ෂ ගණනක මුදල් ලබා ගත්තේය. එවායින් ඔහුගේ බැංකු අරමුදල තර කලේය. සති දෙකකින් පමණ ඔහුට සී. අයි. ඒ. ආයතනයේ මෙහෙයක් නොලැබුණෙන් ඔහු අලසව කාලය ගෙවන්නට විය.



පාළුව දරාගත නොහැකි අවස්ථාවල කොරයා නුවරඑලිය නගරයට පැමිණ එහි උසස්ම සමාජ ශාලාවක් කරා යයි.

ධූම පානයෙන් හා මත්පැනින් වැලකී සිටි ඔහු පාළුව මග හැරීමට කලේ කාඩ් ගැසීමය.

මෙසේ කාඩ් ගසමින් සිටින අතර එක් දිනක් ඔහුට සුපුරුදු මුහුණු දෙකක් සමාජ ශාලාවට ඇතුළු වනු පෙණිත. ඔවුන් දුටු මොහොතේ කොරයාගේ ගතපුරා නුහුරු ප්‍රීතියක් පැතිර යන්නට විණ.

සමාජ ශාලාවේ ඈත මැත බැලූ පුද්ගලයන් දෙදෙන කාඩ් ගසමින් සිටි කොරයා වෙත ලඟා වූහ.

කොරයා කාඩ් අත පසෙක දමා නැගිට්ටේය. ඔවුන් සමග වැඩිපුර මිනිසුන් නැති මේසයක් කරා ගියේය.

"මොකද මේ පැත්තෙ? කාවද මරන්න වරෙන්තුව ලියාගෙන ආවෙ"

අජිත් සහ මාර්ෂල් සැලකිලිමත්ව වටපිටා බැලූහ. අසලක කිසිවෙක් නැත.

"මිස්ටර් කොරයාට මේ පාර ලක්‍ෂ දෙකක කොන්ත්‍රාත් එකක්." අජිත් කීය.

"ලක්‍ෂ දෙකක්....?" කොරයා පුදුමයෙන් ඇසිය.

"ඔව් සල්ලිත් ගෙනාවා...." ඒ මාෂල්ය.

"එහෙනම් ලොකුම මිනිහෙක් වෙන්න ඇති"

"ඔව් විස්තර කියන්නද?" අජිත් ඇසීය.

ජිම් කොරයා උපැස් යුවල යටින් සමාජ ශාලාව විනිවිද යන බැල්මක් හෙලීය.

"හ්.....ම්.....!"

"මිනිහ රතු චීනෙ, ලී චියැං!"

"අර ඊයෙ ලංකාවට ආපු කොමියුනිස්ට් නායකයද?" කොරයා මුව අයා ගත්තේය.

"ඔව්!"

"කොහේද නැවතිලා ඉන්නෙ?"

"මිස්ටර් කොරයා අපට ලැබිල තියන රහස් ඔත්තු නිවැරදි නම් දැනට මිනිහ ඉන්නෙ මේ පලාතෙමයි. නුවරඑළියෙ ඉදල හැතැප්ම තුනක් ඈතින් තියෙන විශාල බංගලාවකයි"

"මොකද මිනිහ ආපු හැටියෙ නුවරඑළියට වෙලා කරන්නෙ?"

"මිනිහට ඊයෙම අසනීප වෙලා තියනවා. වෛද්‍යවරු නියම කරල තියෙන්නෙ සීතල පලාතක ඉදල වෛද්‍යාධාර කරන්නය කියලා"

"ඒත් මම ලෙඩෙක් මරන්නෙ කොහොමද?"

"ලී චියැං හොදට සනීප වෙනතුරු ආපහු යන්නෙ නෑ. මිස්ටර්ට පුළුවනි මිනිහා සනීප වෙනතුරු ඉන්න"



"මම තවත් කල්පනා කරල වැඩේ බාර ගන්නම්"

"එහෙම බැහැ. අපේ බොස් ස්මිත් කියනව මේක එයාට කරන පෞද්ගලික උපකාරයක් හැටියට ඉටු කරන්නය කියලා"

කොරයා බර සිතිවිල්ලකට වැටුනේය. විශ්‍රාම ලැබීමෙන් පසු තමා මේ භයානක කර්තව්‍යයන්හි යෙදෙන්නේ මුදල් ඉපයීමේ පරමාර්ථයෙන්ම නොව කුසීතකම මහ හරවා ගැනීමටය. එසේත් නැතිනම් තමාගේ හැකියාවන් මොට වී යා නොදී රැක ගැනීමටය. අතපය හිරිවැටී යා නොදී පවත්වා ගැනීමටය.

නොබෝ වේලාවකින් පසු ඔහු සී. අයි. ඒ. නියෝජිතයන් දෙදෙනා දෙස බැලීය.

"ලී චියැං ඉන්න තැන හුහක් ගාඩ් කරල ඇති"

"ඔව්! මුලු රහස් පොලිසියම ඇති. ඒ හැරෙන්නට චීනෙන් ආපු ආරක්‍ෂක භටයිනුත් රැකවල් කරනවා"

"එහෙනම් වැඩේ ටිකක් අවදානම්. පිටස්තර කිසිම කෙනෙකුට ඒ පලාතටවත් යන්න තහනම් කරල ඇති"

"මිස්ටර් කොරයට උවමනා නම් එතැනට පියඹලා උනත් යන්න පුලුවන්"

"මම ඒතරම් දක්‍ෂද?" කොරයා තරමක් බර හඬකින් විමසීය.

"දක්‍ෂකම නිසා තමයි මෙච්චර බලසම්පන්න මිනිස්සු කිසිම හෝඩුවාවක් නොතියා මැරී වැටුනෙ?"

"මට වැඩේ කරන්න පුලුවන්ද බැරිද කියල හොයල බලන්නම්"

"අපි බොස්ට ඒ විදියට කියනව!"

"හොඳයි!"

අජිත් සහ මාර්ෂල් පිටව් ගියහ. ජිමී කොරයා නැවතත් කාඩ් සෙල්ලමේ යෙදෙන්නට විය.

මේ අතර යුරෝපීය ඇඳුම් පැළඳුමෙන් සැරසුන කඩවසම් ජවසම්පන්න පුරුෂයෙක්ද සමාජ ශාලාවට ඇතුලු විය. ඔහු කෙලින්ම බාර් එක කරා ගොස් විස්කි වීදුරුවක් ගිලදමා අසුනක් කරා ගොස් වාඩි විය.

ඔහු ජේම්ස් බණ්ඩාය!

ඔහුගේ නෙත් සමාජ ශාලාවේ සිටි මිනිසුන් කරා යැවින. ඈත කෙළවරේ වාඩිවී කාඩ් පතක් දෙස බලමින් සිටි තලතුනා වියේ පසු වූ මිනිසෙකු දැක තළල රැලිකර ගත්තේය.

"මොනව වෙන්න බැහැ ජිමී මෙහේ?" ඔහු තමාටම තොල් මතුලා ගත්තේය.

ජිමී කොරයා 00 අංශයෙන් විශ්‍රාම ලැබූ බවත් දැනට ඔහු බ්‍රිගේඩියර් සමග කිසිදු සම්බන්ධයක් නැති බවද ඔහු දැන සිටියේය.

කෙසේ වෙතත් තලතුනා මිනිසා තම හිතවත් ජිමී කොරයාමදැයි නිශ්චය කර ගැනීමට සිතූ බණ්ඩා අසුනෙන් නැගිට ඒ තැනැත්තා වෙත ගියේය.



ඔහුගේ සැකය නිවැරදිය.

"ඒ ජිමී කොරයාම තමා"

පැරණි හිතවතෙකු හදිසියේ මුණ ගැසීමෙන් ඇති වූ සතුට නිසා බණ්ඩා එක්වරම කොරයාගේ උරහිසට අත තබමින් කතා කලේය.

"ජිමී! කාලෙකින් දකින්න ලැබිච්ච එක කොයි තරම් සතුටක්ද?"

කොරයා තිගැස්සුනේය. හැරී බැලූ ඔහුට දකින්නට ලැබුනේ බණ්ඩාගේ සිනාමුසු මුහුණය.

"හෝ..! දෙවියනේ මේ ජේම්ස් නේද?" අසමින් වහා නැගිට සිටි කොරයා ජේම්ස්ගේ අතට අත දුන්නේය.

"දෙවියනේ...! නාකි ජිමී මේ හිතල පලාතට වෙලා මොකද කරන්නෙ? දෙවියන්ගෙ නාමෙන් මේ පැත්තෙන් යන්න. නාකි මිනිස්සු හිතල පලාත්වල ඉන්න එක වැඩිය හොඳ නැහැ" ජේම්ස් බණ්ඩා තම හිතවතාට පොඩි විහිලුවක් කලේය.

"ජේම්ස්!" යි කොරයා සන්සුන්ව කතා කරන්නට විය. "මම දැන් පැත්ෂන් ගිය මිනිහෙක්. මම දැන් මේ පාලු පිටිසරට වෙලා නිස්කලංක ජීවිතයක් ගත කරනවා"

"ඔව්. ඒකත් හොඳයි...!" කොරයා, බණ්ඩා දෙස ප්‍රශ්නාර්තයෙන් බැලීය.

"මම මේ අහන්නෙ නිකමට. ජේම්ස් මොකද මේ පැත්තෙ?"

"මම සුමානයක් දෙකක් නිවාඩු ගන්න ආව. දන්නෙ නැද්ද ඉතින් බ්‍රිගේඩියර්ගෙන් නිවාඩුවක් ලබා ගන්න තියෙන අමාරුව"

බණ්ඩා වේටර් වරයකුට සන්කොට විස්කි ගෙණෙන ලෙස දැන්විය.

"මම මත්පැන් බොන්නෙ නැහැ ජේම්ස්"

"හෝ මට ඒකත් අමතක වුනා!"

"දැන් බ්‍රිගේඩියර්ගෙ සැප සනීප කොහොමද?"

"වරදක් නැහැ. වෙඩි උණ්ඩ මැද ජීවත් වෙනවා. ඒක නොවෙයි කොහොමද අපේ පරණ වැඩ කටයුතු එහෙම. කොරයා, බ්‍රිගේඩියර්ට ලොකු වැඩ කිපයක්ම කලාය කියල මට දැන ගන්න ලැබුණා"

"ඒව ඔක්කොම පහුගිය දේවල්. ජේම්ස් මගේ කාලේ මම ලොකු වැඩ කලා තමයි. ඒත් දැන් මම නාකියෙක්. මට දැන් ඕන කරන්නෙ නිස්කලංකව ඉඳල මැරිල යන්න!" යි පැවසූ කොරයා අහිංසක ලෙස සිනාසුනේය.

"දැන් කොහෙද ජිමී පදිංචිවෙලා ඉන්නෙ?"

කොරයා සාක්කුවෙන් කාඩ්පතක් එලියට ඇද ගත්තේය.

"මේ තියෙන්නෙ මගේ ඇඩ්‍රෙස් එක. නිකම් ඉන්න වෙලාවක ඒ පැත්තෙ ඇවිත් යන්න එන්න. මට ආසයි ඉස්සර වගේ ජේම්ස් එක්ක කතා කර කර ඉන්න"



"හොදයි ජිමී! මට ඉඩක් ලැබුණ හැටියෙම එන්න බලන්නම්"

දසතින් අඳුර ලහාවන්නට වූයෙන් ජිමී කොරයා බණ්ඩාගෙන් සමුගෙන සමාජ ශාලාවෙන් පිටවිය. ජිමී පිටවී යන ආකාරය බණ්ඩා කල්පනාකාරීව බලා සිටියේය.

ජිමී හොඳ මිනිහ. මට පුදුම මිනිහ පැන්ෂන් යන්න තරම් කල් ජීවත් වුන එක ගැන. බණ්ඩා තමාටම කියාගෙන ආපසු හැරුනේය.

එහෙත් බණ්ඩාගේ හැම ඉරියව්වක් ගැනම සෙවිල්ලෙන් පසු වූ දෙදෙනෙක් පාරේ නවතා තිබූ මෝටර් රියක් තුළ සිටියහ.

"කොහොමද වැඩේ. අරූ ඇවිත් ඉන්නෙ හොඳකට නෙවෙයි. ජිමී ගැන ඉව වැටිලා වත්ද දන්නෙ නැහැ." එකෙක් කීය.

"මම හිතන්නෙ නැහැ ඌ ජිමීව සැක කරනවා කියලා. දැක්කෙ නැද්ද උන් දෙන්න කතා කල හැටි"

"බණ්ඩා කරන කියන කිසිම දෙයක් විශ්වාස කරන්න බැහැ. කොයි එකටත් අපි සෙවිල්ලෙන් ඉදිමු. අන්න බණ්ඩා ක්ලබ් එකෙන් එලියට එනව" යි පැවසූ දාමරිකයන් දෙදෙනා සූදනම් වූහ.

ජේම්ස් බණ්ඩා සිතුවිලි වලියක වෙලෙමින් පියවර ඉදිරියට තබන්නට විය. ඔහු නැවති සිටියේ සමාජ ශාලාවට නුදුරු ඉහළ පෙලේ හෝටලයකය. රාත්‍රි අඳුර එතරම් බලවත් නොවූ බැවින් ඔහු සෙමින් සෙමින් පියවර ඉදිරියට තැබීය.

"ජිමීට මේ වැඩේ කරන්න පුලුවන්. ඒ වුනත් මම කොහොමද මිනිහගෙන් අහන්නෙ." ඒ බණ්ඩාගේ සිතිවිලිය.

බණ්ඩා මෙසේ සිතමින් ගමන් කරන අතර හදිසියේම පසුපසින් වේගයෙන් පැමිණි මෝටර් රථයක් ඔහු යටකර යාමට පැමිණියෙන් එක්වරම පදික වේදිකාව කරා පැන්නේය. ඔහු ජීවිතය බේරා ගත්තේ යන්තමිනි.

ඔහු පදික වේදිකාවට පනින්ම මෝටර් රථයේ තිරිංග තදවිය. රියතුලින් එලියට පැනගත් දාමරිකයන් දෙදෙනෙක් බණ්ඩා වෙත පැන පහර දෙන්නට පටන් ගත්හ.

එහෙත් දාමරිකයන් දෙදෙනාගෙන් කෙනෙකු පසු පසින් ගැසූ බලාපොරොත්තු රහිත මරු පහරකින් බණ්ඩා සිහිසුන්ව බිම ඇද වැටුනේය.

"මූව සර්ච් කරනව"

දාමරිකයන් දෙදෙනාගෙන් එකෙක් බණ්ඩාගේ කලිසම් හා කබා සාක්කු තුලට අත දමා යමක් සෙවීය. එහෙත් ඔහු ලඟ කිසිවක් නොමැති බව දැක අනෙකාට කතා කලේය.

"ඒයි... මූ ලඟ මොන කෙහෙල්මලක්වත් නැහැ!" ඔහු බලාපොරොත්තු කඩ වූ හඬකින් කීය.

"අන්න වාහනයක ලයිට් එළියක්. මෙතනින් ඉක්මණින් පැන ගමු. දැන් පොලීසියෙන් එන්න පුළුවන්" යි අනික් මැරවරයා මද කලබලයකින් කීය.

නැවතත් වහා මෝටර් රථයට ඇතුළු වූ දාමරිකයන් දෙදෙනා පවනට බඳු වේගයෙන් පලා ගියහ.



ජේම්ස් බණ්ඩාට ප්‍රකෘති සිහිය ලැබුනේ විනාඩි දහයක් පමණ ගතවූවාට පසුවය. ඔහුගේ ඇඟපත රිදෙන්නට විය.

"මූන් මා පස්සෙ ආවෙ මොකටද?" ඔහු කල්පනා කලේය.

ඔහු සාක්කු තුලට අතදමා බැලිය. කිසිවක් අඩුනැති වුවද තමා සෝදිසි කර ඇති බව ඔහු වටහා ගත්තේය. බණ්ඩා යලි ගමනාරම්භ කලේය. කල්පනා කරමින්....

"මූන් කොහොමද මා පස්සෙ ආවෙ? මාව ඇඳින ගත්තෙ?"

මෙයට එකම පිලිතුර ඔහුට පසුව වැටහින. සමාජ ශාලාව තුලදී ඔහුට ජිමී කොරයා මුණ ගැසුනි. ජිමී ගැන සෙවිල්ලෙන් සිටි ඔහු කවුද යන්න දැන සිටි මිනිසුන් දෙදෙනෙක් තමා ගැන සැක සිතන්නට ඇත.

මෙය කෙසේ හෝ විසඳා ගතයුතු වැදගත් ප්‍රශ්නයක් බැවින් මේ රාත්‍රියේදීම ජිමී කොරයා මුණ ගැසීමට යාමට ඔහු තීරණය කලේය. හෝටලය කරා ගිය හෙතෙම මඩ තැවරුණු ඇඳුම් කට්ටලය ඉවත් කොට අලුත් ඇඳුමෙන් සැරසී මෝටර් රථය ප්‍රාණවත් කර ගත්තේය.

මෙවිට වේලාව රාත්‍රි අටහමාරට පමණ ඇති. "රෑ බෝ වුනත් වැඩියි. ඒ වුනත් ජිමී ඉස්සර වගේ හුඟක් රෑ බෝ වෙනකල් නින්දට යන්නෙ නැතුව ඇති" යි සිතමින් ඔහු රථයේ වේගය වැඩි කලේය.

අඩපැයක් පමණ රිය ධාවනය කිරිමෙන් පසු බණ්ඩා නිහඬ ගම්මානයට පැමිණියේය.

ලිපිනය ලඟ තිබූ බැවින් කුඩා කඳුගැටය මැද්දේ තිබූ කොරයාගේ නිවස සොයා ගැනීම දුෂ්කර නොවීය. බණ්ඩා වසා තිබූ දොරට තට්ටු කලේය.

දොර විවරකල ජිම් කොරයා සැකමුසුව එබිකම් කොට බැලිය. බණ්ඩා දුටුවිට ඔහු මදක් පුදුම විය.

"ජේම්ස් මොකද මේ කලබලයෙන්ම. මොකක් හරි කරදරයක්වත්ද?" යමක් ඉවවැටුනාක් මෙන් කොරයා විනාලේය.

"කරදර මට අළුත් දෙයක් නොවෙයි ජිම්. ඒත් මට ජිම්ට කියන්න කාරණාවක් තියනවා." බණ්ඩා පැයකට පමණ කලින් තමාට විඳින්නට සිදුව අතවරය කොරයාට විස්තර කලේය. "ඒක වුනේ මම ජිමිත් එක්ක කතා කරල පාරට බැස්ස හැටියෙමයි"

"ජිම් කවුද කියල කවුරුහරි හඳුනා ගත්තාවත්ද?" බණ්ඩා සැකමුසුව ඇසීය.

"සමහරවිට එහෙම හිතන්නත් පුළුවන්. මම අවුරුදු ගණනාවක්ම අර රස්සාව කලානේ. මාව අඳුන ගත්ත කෙනෙකුට යම් යම් දේ හිතෙන්න ඉඩ තියනවා. ඒත් ජේම්ස්ට හිරිහැර කරන්න හේතුව මොකද?"

"මට මෙහෙම හිතනවා. ජිම් තවම පැන්ෂන් ගිහිල්ල නැතෙයි කියලවත් උන් හිතුවාවත්ද? ජිමීත් මාත් එකතුවෙලා මොනවහරි කරන්න යනව කියල උන් හිතන්න ඇති"

"මේක හරිම භයානක රස්සාවක් ජේම්ස්. එහෙමනේද? මට දැන් ඇත්තම කියන්න ජේම්ස්. මෙහාට ආවෙ බ්‍රිගේඩියර්ගෙ වැඩක් නිසා නේද?"



ජිම් කොරයා මිත්‍ර ලීලාවෙන් ඇසීය.

ජේම්ස් බණ්ඩා මද වේලාවක් නිහඬව සිටියේය. ඔහුගේ සිතුවිලි එකට පැටලි ඇත. තීරණයක් ගැනීමට නොහැකි තත්වයක පසුවිණ.

"මොකද ජේම්ස් මේ පලාතට ආපු කාරණේ අමතක වුනාද?" ජිමී කොරයා සිනාමුසුව යලි මතක් කලේය.

බණ්ඩා තීරණයකට එලඹියේය. මේ පුද්ගලයා සැකකල නොහැක. මොහුද තමා මෙන්ම 00 අංශයේ සේවය කල තැනැත්තෙකි. බ්‍රිගේඩියර් ලඟින් ඇසුරුකල කෙනෙකු වශයෙන් මොහු කෙරෙහි විශ්වාසය තැබිය හැක. එබැවින් තමා මේ ප්‍රදේශයට පැමිණි හේතුව විස්තර කිරීමට තීරණය කලේය.

"හරිම පුදුම වැඩක් ජිමී. පහුගිය මාස කීපය ඇතුලත අබිරහස් මරණ කීපයක් සිදුවුනා. ඔක්කොම මිනීමැරුම් හැම කෙනෙක්ම පාහේ ලොකු සමාජයේ කැපී පෙණෙන උදවිය. මේ එකම මරණයක් ගැනවත් අපට තීරණයක් ගැනීමට බැරිවුනා. අපේ එම්ට හරිම ප්‍රශ්නයක් වෙලා තියෙන්නෙ ඒකයි".

ජිම් කොරයා සත්සුන්ව කතාවට සවන් යොමා සිටියේය. "ඒ කියන්නෙ මේ මිනීමැරුම් එකකදීවත් හෝඩුවාවක් ලැබනෙ නැද්ද? එහෙමත් නැතිනම් විග්‍රහයක් කලේවත් නැද්ද?"

"ඒ කිසිම දෙයක් නැහැ ජිමී. හරියට අවතාරයක් වගේයි. කාව හරි මරණව අතුරුදහන් වෙනවා. මේක අපේ සංවිධානයටත් ලොකු ප්‍රෙහෙලිකාවක්. ජිමීට මොකද මේ ගැන කියන්න තියෙන්නෙ?"

කොරයා දිග ඇනුමක් ඇරියේය. නොසැලකිලිමත්ව පිලිතුරු දුන්නේය.

"මම දැන් පැන්ෂන් ගිය නාකියෙක් ලමයා! මන් ඔව ගැන හිතන්නෙත් නැහැ. මට හිතන්න උවමනාවකුත් නැහැ. කරපු හරිය හොඳටම ඇති"

"ජිම් ඒ අතින් හරි වාසනාවන්තයි. කොහොම වුනත් මේ සම්බන්ධව මොනව හරි අළුත් අදහසක් ඇති වුනොත් හරි. එහෙම නැතිනම් අර දාමරිකයන්ගෙන් කරදරයක් වුනොත් "**බ්ලූ රිබන්**" එකට ටෙලිෆෝන් කරන්න. ගුඩ් නයිට්"

"ගුඩ් නයිට් ජේම්ස්!"

බණ්ඩාගේ මෝටර් රථයේ හඬ නැසී යත්ම ජිම් කොරයා අඩ සිනාවකින් මුව සරසා ගත්තේය.

"විශ්වාස කරන්නත් අමාරුයි. මගේ පරණ සංවිධානය මේ මිනීමැරුම් ගැන මේ තරම් හොයද්දීත් බ්‍රිගේඩියර්ට මාව තවමත් අවිස්වාස වෙලා නැහැ" යැයි තමාටම පවසාගත් කොරයා යලි සිනාසෙන්නට විය.

නොබෝ වේලාවකින් ඔහු ගෙතුලට ගොස් කිසියම් තම්මරු...ට ටෙලිෆෝන් කලේය.

ඔහු නැවත අසුන කරා ගොස් යමෙකුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියේය.

පැය බාගයක පමණ ඇවෑමෙන් කලු දිග කබා හැඳගත් පුද්ගලයන් දෙදෙනෙක් අන්ධකාරයේම කොරයාගේ නිවස කරා පැමිණියේය.



ඔවුන් ගෙට ගොඩවදින්ම කොරයා කෝපයෙන් කතා කරන්නට විය.

"තමුසෙල අලි ගොන්නු. මාර්කස් තමුසෙල අර ඔත්තුකාරයට අඩම්තේට්ටම් කරපු එකෙන් තව ටිකෙන් අමාරුවේ වැටෙන්නෙ මම"

"අපි එහෙම හිතුවෙ නැහැ. අඩන්තේට්ටම් කලහම මිනිහ බයේම වෙන පලාතකට යයි කියලයි අපි හිතුවේ" මාර්ක්ස් නැමති උස තැනැත්තා පැවසීය.

"කෙහෙල්මල, තමුසෙලා කරපු ඒ වැඩේ නිසා තමයි මිනිහ කෙලින්ම මාව සොයාගෙන ආවෙ. තමුසෙලා තවම දන්නෙ නැහැ බ්‍රිගේඩියර්ගෙ ඔත්තු කාරයින්ගෙ හැටි. විශේෂයෙන්ම බණ්ඩා වගෙ ඔත්තුකාරයෙක් ගැන"

"කොයිහැටි වුනත් අපි බණ්ඩව මහඅරවන්න ඕන. බණ්ඩ මේ පැත්තෙ ඉව අල්ලන එක ඒ තරම් සුබ නැහැ. අපේ බොස් බාර දුන්න වැඩේ කරල ඉවර වෙනකල්" අනෙක් තැනැත්තා ඒකමතිකව කීය.

"මන් හිතාගෙන උන්නෙ තමුසෙ කොමියුනිස්ට් පිලත් එක්ක හවුල් ඇතෙයි කියල" කොරයා සන්සුන්ව පැවසුවේය.

"මම ඉස්සර කොමියුනිස්ට් කාරයෙක්. ඒ වුනත් කොමියුනිස්ට් කාරයො අපි වගේ මිනිසුන්ට තිකරුනේ මුදල් ගෙවන්නේ නැහැ. ඒ නිසා දේශපාලන මත අත් ඇරල සී. අයි. ඒ. එකට බැඳුන"

"ලී වියෑං මරාදැම්මම තමුසෙලාට ඇතිවන සෙත මොකක්ද?" ජිම් විතාලේය.

"මිනිහ මැරුණොත් ලෝක මහා යුද්ධයක් ඇති වෙනවාමයි. ලී චියෑං රතු චීනයෙ ආරක්ෂක ඇමතිවරයා. යුද්ධයක් ඇතිවුනොත් වාසි වෙන්නෙ ඇමෙරිකාවට"

"ඒ කොහොමද?"

"දැන් ඇමෙරිකාව අවශ්‍ය ප්‍රමාණයටත් වැඩිය යුද්ධායුධ නිපදවල තියෙනවා. ලෝකෙ කොයි මුල්ලක හරි යුද්ධයක් ඇති වුනොත් ඇමෙරිකාවට යුද්ධ ආයුධ විකුණ ගන්න වෙළඳ පොලක් ඇති වෙනවා. අන්න ඒ හේතුව නිසයි ඇමරිකාව හැම රටකම පාලනයට ඇඟිලි ගහන්නෙ"

"එහෙමද? එහෙනම් ලී චියෑංගෙ මරණය ගැන මුළුමහත් ලෝකයේම ලොකු උද්ඝෝෂණයක් ඇති වෙන්න පුලුවන්"

"මේක මිස්ටර් කොරයාගේ දක්ෂකම උරගා බලන්නත් හොඳම අවස්ථාව!"

කොරයා මද වේලාවක් නිහඬව පසු වුනේය. අණකුරුව හිස සැලුවේය.

"මම වැඩේ කරන්න බාර ගන්නවා"

"බණ්ඩා ගැන ඒ තරම් කලබල වෙන්න එපා. අපි මිනිහ ගැන බලා ගන්නම්"

"එපා! එපා! මොළේ පාවිච්චි කරල වැඩ කරනව. තමුසෙලාට පුලුවන්ද මට මිනිස්සු තුන් හතර දෙනෙක් දෙන්න. හැබැයි ඒ ගොල්ලන් මැරුණට පාඩුවක් නොවෙනවනම් විතරයි"



"තුන් හතර දෙනෙක් නොවෙයි සිය ගණනක් උනත් දෙන්නම්. සී. අයි. ඒ. එකට ඕව වැඩ නෙවී. තමන්ගෙ වැඩේ හරියට කෙරෙනව නම්"

"එහෙනම් මිනිසුන් තුන් හතර දෙනෙක් හෙට අනිද්දා මට ගෙන්නල දෙනව"

සී. අයි. ඒ. සාමාජිකයන් දෙදෙනා පිට වී ගියහ. ජිමී කොරයා දොරවල් තදකොට වසා දමා යහන කරා ඇදුනේ සැහැල්ලු සිතිනි.

ඇඳට වැටී විනාඩි කීපයකින් ඔහු සැපවත් නින්දකට වැටුනේය. මෙවැනි මිනිසුන්ටත් නින්ද යන එක පුදුමයක් නොවේද?

## 7 වන පරිච්ඡේදය

**බ**ණ්ඩා කාමරයේ දොර ජනෙල් සියල්ල හොඳින් වසා දමා දොර හා ජනෙල් රෙදිද මනාව ආවරණය වන සේ සකස් කලේය.

මොහොතක් නිහඬව යමකට සවන් යොමා සිටි හෙතෙම අණතුරුව පසෙක තිබූ ඔහුගේ ඇඳුම් බෑගය විවෘත කලේය. විවෘත කල බෑගයේ වූයේ මනාව නැත්පත් කල ඔහුගේ ඇඳුම් පැළඳුම්ය. ඇඳුම් යටවූ කුඩා බොත්තමක් තදකල සැණෙකින්ම බෑගයෙන් තවත් තට්ටුවක් විවෘත විය.

ඒ තට්ටුවේ තිබූ මෙවලම් කීපයක් අතුරින් කුඩා මයික්‍රපෝනයක් මුවට ලංකල ඔහු කතා කරන්නට විය.

"රිපෝටිං 019...... රිපෝටිං...... 019....."

"රිසීවිං...... කතා කරන්න..... මේ බ්‍රිගේඩියර් එම්"

"සර් මත් හිතන අන්දමට දැන් මට පොඩි පොටක් පැදිලයි තියෙන්නෙ. කවුරු හරි මගේ පැමිණීම ගැන බයවෙල වගෙයි කියල පෙනෙනව. ඒත් මේක සැකයක් පමණයි"



"සැකයක් නම් ඒ අනුව වැඩපිළිවෙලක් යොදන්න අමාරුයි..... ඊළඟට......"

"තවම මොකුත් නැහැ. නමුත් අද මට හදිසියේම වාගේ ජිම් කොරයා මුණ ගැහුනා. මිනිහ පදිංචි වෙලා ඉන්නෙ මේ කිට්ටුව"

"හොඳ මිනිහ. ජිම් මා ලඟ නැති එක ලොකු පාඩුවක්. ඒ වුනත් අපි අපේ වැඩ බලා ගන්න ඕන නේද? ඒක නෙවෙයි තවත් වැදගත් කාරණයක් කියන්න තියනවා"

"කියන්න..... මත් අහගෙනයි ඉන්නෙ"

"මේ කොමියුනිස්ට් නායකයගේ ජීවිතේ ආරක්‍ෂා කිරීම ඉතාම වැදගත්. එමෙන්ම මේක මුළු ලෝකෙටම බලපාන ප්‍රශ්නයක්. මම නුවරඑලියෙ ඉන්න සිකියුරිටි චීෆ්ට ටෙලිෆෝන් කරල කිව්ව ජේම්ස්ට ලී වියැංගෙ ආරක්‍ෂාව සම්බන්ධව කටයුතු පැවරුවයි කියල. ඒ නිසා ජේම්ස්, ලී වියැං නැවතිලා ඉන්න බංගලාව පැත්තෙ කවර් එකේ ඉන්න ඕන. තේරුණාද?"

"හොඳයි සර්"

"පොඩ්ඩක් ගැස්සිලා ගියොත් අපි කීපදෙනෙකුටම ගෙදර යන්නයි වෙන්නෙ. ගෙදර නෙමෙයි මහ ගෙදර. විශේෂයෙන්ම බණ්ඩට ජීවතුන් අතර ඉන්නත් ලැබෙන එකක් නැහැ"

"බොහොම හොඳයි සර්..... ලී වියැං ආරක්‍ෂා කරන්න මට පුළුවන් හැම දෙයක්ම මම කරනවා"

"බ්‍රිගේඩියර් ස්ටොප් කෝලිං......"

"019..... ස්ටොප් කෝලිං.....!"

මයික්‍රෆෝනය යලි යට තට්ටුවෙම තැන්පත් කල බණ්ඩා සූට් කේසය වසා දැම්මේය. එය ඇඳුම් බෑගයක් විනා මෙවැනි අරුම පුදුම මෙවලම් ඇති ආයුධ පෙට්ටියක් බව කිසිවෙකු නිකමටවත් නොසිතනු ඇත.

බණ්ඩා මොහොතක් සයනයට වී කල්පනා කරන්නට විය.

"අර දාමරිකයෝ දෙන්නා මට පහර දුන්නෙ ඇයි? උන් මාව ඉක්මණට එලව ගන්න හදන්නෙ මොකද? මෙතන මොකක් හරි ලොකු රහසක් තියෙන්න ඕන" යි සිතමින් බණ්ඩා මහත් ආයාසයකින් පසු නිදිදෙවිඳුව වැළඳ ගත්තේය. එහෙත් මධ්‍යම රාත්‍රියේ ඔහු කිසියම් ශබ්දයකින් තිගැස්සී නැගී සිටියේය.

එය සිහිනයක් නොවන බව ඔහුට දැනුනේ තමාගේ පපුවට එල්ල කරගෙන තිබූ පිස්තෝලය දුටුවිටය.

"කෑගහන්න එපා මිස්ටර්!"

කලු ලේන්සුවකින් මුහුණ වසාගත් තැනැත්තෙක් පහත් හඬින් විධානය කලේය.

"තමුසෙල ආවෙ වැරදි කාමරේට වෙන්න ඇති" බණ්ඩා කීය.

"අපිට වැරදෙන්නෙ නැහැ. මේතාක් කල් වැරදිලත් නැහැ." පිස්තෝලකාරයා පැවසීය.

"හොඳයි තමුසෙලාට මොනවද ඕන... සල්ලිද?"



"අපට සල්ලි ඕන. තවත් තියෙන්නෙ මොනවාද කියල අපිම බලාගන්නම්"

එවිටම ද්වාරය දෙසින් ශබ්දයක් නිකුත් විණ. පිස්තෝලකාරයා ඔහු සමග සිටි අනෙක් තැනැත්තා දෙසට හැරුණේය.

"ඒයි බලාපන් ඒ සද්දෙ"

එකෙනෙහිම ද්වාරය විවර විය. දොරින් ඇතුල් වූ තැනැත්තා කතා කරමින්ම ඉදිරියට ආවේය.

"ජේම්ස්ගේ නින්ද කැඩුවට මට සමාවෙන්න"

ඒ තැනැත්තා ජිමී කොරයාය. එහෙත් කලු ලේන්සුවලින් මුහුණු වසාගත් දෙදෙනා ඔහු දෙසට පිස්තෝල එල්ල කළහ.

"ඒයි කෑගැහුවොත් මරා දමනව"

ජේම්ස් බණ්ඩා විශ්මිතව මේ සියල්ල දෙස බලා සිටියේය. අණතුරුව ජිමීට කතා කරන්නට විය.

"මේ මොකද ජිමී. මේ මිනිස්සු මගේ කාමරේට කඩා වැදිලා මට තර්ජනය කරන්නයි සූදානම"

"ඒයි කට වහගනින් මිනිහො. තව වචනයක් හරි කිව්වොත් ඔලුව හිල් කරනව"

ජිමී සන්සුන් ලෙස සිනාසුනේය. ඔහු කිසිවෙකුටත් නොපෙනෙන්නට අතේ එල්ලා ගෙන තිබූ බෑගයේ බොත්තමක් තදකලා පමණි. වෙඩි හඬක් නිකුත් විණ.

පිස්තෝලය එල්ල කරගෙන සිටි දාමරිකයා මරහඩ නගමින් බිම ඇද වැටුනේ ලේ පෙරමිනි.

තම සගයා ලේ පෙරමින් බිම ඇද වැටෙනු දුටු අනෙකා හිතියට පත්ව වෙඩි උණ්ඩය ආවේ කොහෙන්දැයි බැලුවේ පිස්තෝලය බණ්ඩා දෙසට එල්ල කරගෙනමය.

"මේ තියෙන්නෙ බඩුව මෙන්න මේකෙන් තමා" යැයි කියමින් ජිම් දෙවන වෙඩිල්ල ඉතිරි දාමරිකයාගේ පපුවට එල්ල කලේය.

මොහොතකින් ඔහුද මුලින් ඉදිරූ ගසක් මෙන් බිම පතිත විණ.

දාමරිකයන් දෙදෙනා මරණීය වේදනාවෙන් ඒ මේ අත දඟලන අතර ජිම් සිනාමුසු මුහුණින් බණ්ඩා වෙත පැමිණියේය.

"මම හිතුව මොකක් හරි කළබලයක් ඇතිවේය කියල. ඒකයි මේ මහ රෑම එන්න හිතුනෙ"

"ආපු එක මගේ වාසනාව. ජිම් ඔය අතේ තියෙන බෑග් එක හරි පුදුම ගැජට් එකක් නේ? ඔය වගේ කියුරියස් බඩුවක් මම දැක්ක පළමු වතාව. කොයිහැටි වුනත් ඕක ගෙනාපු එක හොදයි"

"මේක මගේම නිෂ්පාදනයක්. මේක මම යන හැමතැනම ගෙනියනවා"

බණ්ඩා ක්ෂණික තීරණයකට එළඹියේය.

"මේ බලන්න ජිම්. මට ජිම් පොඩි උපකාරයක්



කරන්න ඕන. මේක කරන්න පුළුවන් එකම මිනිහත් ජිම් විතරයි. මේක ඉතාම වැදගත් ලොකු රහසක්"

"මොන වගේ උපකාරයක්ද ජේම්ස්? මම මේ නිදිමරාගෙන ආවෙත් ජේම්ස්ව උදව්වෙන්න. මංගෙන් යම්කිසි උපකාරයක් ඇත්නම් කියන්න" මහලු මිනිසා පුදුමයට පත් වූ ආකාරයෙන් ඉල්ලීය.

ජේම්ස් බණ්ඩා කතා කලේ සහෘදයකු අමතන විලාශයෙනි.

"ඇත්තම කියනව නම් ජිම් දැක්කට පස්සෙ මට අපි ගත කරපු පැරණි ජීවිතේ මතක් වුනා. ඒ වගේ කාලයක් ආයෙමත් ගත කරන්න ලැබෙනව නම් කොච්චර හොදදැයි කල්පනා කලා"

"ඒක අගෙයි. මම පැන්පත් ගිය එක ඇත්ත. ඒත් ජේම්ස් කියනවා නම් ඕනෑම වැඩක් කරන්න ලෑස්තියි. කියන්න. කියන්න"

බණ්ඩා බ්‍රිගේඩියර් විසින් ලි වියෑං නමැති චීන ජාතික රාජ්‍ය අමාත්‍යවරයා ආරක්ෂා කිරීමට ඔහුට දී තිබුණු උපදෙස් සියල්ල ජිම් කොරයාට නොවලහා විස්තර කර දුන්නේය.

"දැන් ඉතින් අපි මේ රතු චීන නායකයගෙ ජීවිතේ ආරක්ෂා කරන්න ඕන. බැරි වෙලාවත් මිනිහගෙ ජීවිතේට යම්කිසි හානියක් සිද්ධ වුනොත් තිකරුනේ මටත් මැරෙන්නයි වෙන්නෙ"

"මොකද ජේම්ස් ඔය රතු චීන මරා දමන්න එහෙම පිරිසක් ලෑස්තිවෙලා ඉන්නවද?"

"එහෙම වෙන්න පුලුවන්. නැත්නම් බ්‍රිගේඩියර් මෙවැනි ඕඩර්ස් එවන්නෙ නැහැ"

"මට තේරෙනව බ්‍රිගේඩියර් හැම දෙයක් ගැනම කල්තියා කල්පනා කරනවා"

"සුදනම් ශරීරේ කියන පිලිවෙත තමයි අනුගමනය කරන්නෙ"

"දැන් ඉතින් මුන් දෙන්නගෙ මළමිනීවලට මොකද කරන්නෙ?"

"ඒ ගැන කරදර වෙන්න එපා. මම පොලීසියට ටෙලිෆෝන් කරල කියන්නම් පොලිසියෙන් ඇවිත් මිනී දෙකම උස්සාගෙන යාවි"

"ඉතින් ජේම්ස් කියන්නෙ ඔය වින ආරක්‍ෂා කරන්න මටත් එන්න කියලද?"

"ඔව් ජිමී උදේම අපි ඒ බංගලාව පැත්තෙ ගිහින් කවර් එකේ ඉන්න ඕන"

පසුදිනට පහන් විය. ජම්ස් බණ්ඩා තම හිතවත් ජිමී කොරයාත් කැටුව මෝටර් රථයට නැංගේ ලි වියැංනමැති වින ජන නායකයා විවේක සුවයෙන් පසුවන ගම්මානය බලා පිටත්වීම සඳහාය. කඳු අතරින් ලහිරු කිරණ විහිදුන නමුදු කඳු සිඛර වැසීගිය මිහිදුම් පටලය තවමත් දිය වී නොගොස් තිබිණ.

මෝටර් රථය පැදවූයේ බණ්ඩාය. වංගු සහිත කඳු මැදින් රථය පදවන අතර බණ්ඩාට පරිසරයේ රමණීයත්වය පෙණින.



ඒ සමගම එහි භයානක කමද ඔහුට නොපෙනුනා නොවේ.

"මුලු ලංකාවෙන්ම ලස්සණ පලාත මේක. ඒත් ඒ තරමටම භයානකයි කියලත් මට හිතෙනවා"

"ජේම්ස් එහෙම කිව්වෙ මොකද?" ජිමී විමසීය.

"ඕනැම කෙනෙක් මරන්න කියාපු පලාත. මේ කන්දකට මුවාවෙලා හිටියම කාටවත් ඉලක්කෙ වරදින්නෙ නෑ. මේ බලන්න ජිමී. මරල මේ හෙලකට තල්ලු කලාම සක්කරයටවත් හොයන්න බැහැ"

"කොයි හැටි වුනත් හරිම සැපදායක පලාත. මැරෙනකල්ම මම ඉන්නෙ මේකෙ තමා"

බණ්ඩා බර සිතුවිල්ලකය. එහෙත් ඒ කුමක්දැයි කීමට ඔහු පවා අපොහොසත්ය. එහෙත් පටු වංගුවකින් රථය හරවත්ම පාර හරහා මුරපොලක් යොදා තිබෙනු දුටුවෙන් බණ්ඩා රිය නතර කලේය.

සිවිල් ඇඳුමෙන් සැරසුන රහස් පොලිස් නිළධාරීන් දෙදෙනෙක් රථය කරා පැමිණ කෝපයෙන් කතා කලේය.

"කොහෙද තමුසෙල යන්නෙ. මේ පැත්තට ඇතුළුවෙන්න තහනම් බව දන්නෙ නැද්ද?" නිළධාරියා තරමක උස් හඬින් බණ්ඩාගෙන් ඇසීය.

බණ්ඩා මද වේලාවක් ආරක්‍ෂක නිළධාරියා දෙස බලා සිට සාක්කුවෙන් කාඩ්පතක් ගෙන නිළධාරියා වෙත දිගු කලේය. මොහොතකින් නිළධාරියා බයාදු බැල්මක් හෙලීය.

"සොරි කැප්ටන්. අපට ඕඩර්ස් ආව කැප්ටන් ජේම්ස් බණ්ඩාට සෙකියුරිටි ඩිවිෂන් එක බාර කලා කියල. කැප්ටන්ට යන්න පුලුවන්. රෙඩ් මිනිස්ටර් ඉන්නව තව හැතැප්ම බාගයක් ඈතින්" පොලිස් නිළධාරියා සැලකිලිමත්ව පැවසීය.

"ඕ. කේ. ඔෆිසර්. පාස් නැති කිසිම කෙනෙකුට ඇතුල් වෙන්න දෙන්න එපා"

"තැන්ක්යූ සර්....!"

මෝටර් රථය මුරපොල පසුකර යලි ගමනාරම්භ කලේය.

"මේ වතාවෙ නම් ඩිෆෙන්ස් මිනිස්ට්‍රි එකෙන් ම් රතු විනව ෆුල් ගාඩ් කරනව වගෙයි. මෙහෙම ගාඩ් කරණකොට ඔය රෙඩ් මිනිස්ටර් මරන්න යන මෝඩයා කවුද?"

"මිනීමරුවන්ට දිවැස් තියනවා ජිමී. උවමනාවක් තියනවනම් කොහොම යන්න බැරි?"

"ඒකනම් ඇත්ත තමා" ජිමී තොල් මතුලේ කල්පනා කාරීවය.

තවත් මුරපොලවල් දෙකකදී ඔවුන්ට රහස් පොලිස් නිළධාරීන්ට පිලිතුරු දීමට සිදුවිය. රහස් පොලිස් නිළධාරීන් සමග විනෙත් පැමිණි ආරක්ෂක භටයින්ද සිටිනු පෙණිනි.

"විත්නු මහා පුදුම ජාතියක්. උන් කිසිවෙකුට බය නැහැ" ජිමී සඳහන් කලේය.



"උන්ගෙ ජාතිය විශාලයි. අප්ත දියුණු වෙච්ච ජාතියක්. දැන් මුලු ලෝකෙම බලවත් රටවල් වලටත් අභියෝග කරන තරමට උන් දරුණුයි"

"දැක්ක නේද අර විත සිකියුරිටි ගාඩ්ස්ල අපේ භාදයොත් එක්ක වැඩ කරන හැටි. උන්ගෙ දෑස් නිතරම තිබුනෙ අපි දෙන්න දිහාමයි"

"විත කිසිම කෙනෙක් විශ්වාස කරන්නෙ නැහැ"

ලී වියෑං නැවති සිටි බංගලාව පිහිටා තිබුනේ තරමක කඳු කිහිපයකින් වට වූ පහත් තැනිතලාවකය. මේ කඳුවැටි ඔහු සිටිතැන ආරක්ෂාවට තැනූ කොටුපවුරක් වැන්න.

බණ්ඩා රථය නවතා එයින් බැස්සේය.

ජිමී ඔහු අනුගමණය කලේය.

"මේක ජිමී තියා ගන්න. අපි අර කන්ද අයිනට ගිහින් බංගලාව කවර් කරමු. සැක ඇති කවුරුවුනත් කමක් නැහැ මැරෙන්නම වෙඩි තියන්න" බණ්ඩා නියෝග කලේය.

ඔහුට එසේ කිරීමට බලය ඇත. රටට ජාතියට විණ කරන රාජද්‍රෝහීන් අමු අමුවේ මරා දැමීමට ඔහුට නීතියෙන් විශේෂ වරප්‍රසාද දී ඇත. එය ඔහු හඳුන්වන **019** පට්ටමය.

රාජද්‍රෝහියෙකු මරා දැමීමෙන් ඔහු උසාවි යන්නේ නැත. නඩු නැත. එහෙත් එය රාජ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රශංසා ලැබෙන ක්‍රියාවකි.

"හොඳයි ජේම්ස්. සැක කටයුතු කවුරු වුනත් කමක් නැහැ. බංගලාව දිහාට ගියොත් මම වෙඩි තියනව. ඊට පස්සෙ වෙන දෙයක් බණ්ඩ බලා ගන්නවනේ"

"සුවර්....! ජිමී...සුවර්....!"

"මම කාලෙකින් රයිෆල් එකක් ඇල්ලුවෙත් නැහැ. ඒ වුනාට ඉලක්කෙ වරදින එකක් නෑ"

ඔවුන් මහ මාවතෙන් ඉවත් වී ගස් කොළන් අතුරෙන් බංගලාව හොඳට පෙණෙන නොපෙණෙන තරමට ලං වූහ.

"අර බංගලාව හොඳට පේන්නෙ? මිනිස්ටර් ඉන්නෙ අර කෙළවරේ කාමරේ"

"මගේ අම්මෝ....! රහස් පොලිසියෙන් හැම තැනම අර අර විත්නුත් තැනින් තැන තුවක්කු අතේ තියාගෙන ගාඩ් කරනව"

"ඒගොල්ලො ඕනැම දේකට සූදනම්වයි ඉන්නෙ. අපි අපේ ඩියුටිය හරියට කරල මේ මිනිහ නිරුපද්‍රිතව රටෙන් පිටත් කරල යවමු"

ජිමී හිස වැනීය.

කඳුවැටිය අසළ වූ ගල්කුළක් මත වාඩි වූ ඔවුන් සුපරීක්ෂාවෙන් බලා සිටියහ. පැයක් පමණ වේලා අමුත්තක් නැතිව ගෙවී ගියේය.

එහෙත් බංගලාව මුරකල ආරක්ෂක භටයින් හිටිහැටියේම හරිබරි ගැසෙමින් සූදනම් වනු දකින්ම බණ්ඩා ඒ පිලිබඳව සැලකිලිමත් විය.



"මොකද ජිමී. ගාඩ්ල එටෙන්ෂන් වුනේ"

"සමහරවිට මිනිස්ටර් එළියට එන්න වගෙයි සිහිල් සුළඟ වදින්න"

බණ්ඩා මදක් ඉදිරියට ආවේය.

"හරියට හරි. මිනිස්ටර් ඇක්සයිස් ගන්න සූදනම් වෙනාව. අර.... අර....!"

බංගලාව තුලින් එළියට පැමිණි විත ජාතිකයා අත් පා දිග හරින අන්දම ඔවුන් සිටි තැනට මැනවින් පෙණින.

බණ්ඩා ඉතා සුපරීක්ෂාකාරීව බංගලාව අවට කිසිවෙක් සැඟවී ඇද්දැයි බලන අතර සීතල යමක් ඔහුගේ පිටට තදවිය.

බණ්ඩා වහා ආපසු හැරී බැලීය.

"මොකද මේ.....?"

"මට බොහොම කණගාටුයි ජේම්ස්. මෙහෙම කරන්න සිද්ධ වුනාට" ජිමී කොරයා සාවඥ සිනාවක් පෑවේය.

බණ්ඩා ඉක්මන් නොවීය. උගුල ඇටවුන බව ඔහු දැන සිටියේය.

"ජිමී...... තමුසෙ? මම තමුසෙ මෙහෙම කරාවිය කියල තිකමටවත් සැක හිතුවෙ නැහැ" ඔහු පුදුමයට පත් වූ ලෙස කීය.

"නැහැ ජේම්ස්. මම රක්‍ෂාවටයි මේක කරන්නෙ. මෙච්චර වෙලා මම තමුසෙට උදව් කලා. ඒත් දැන් මම මගේ රස්සාවට බහිනව"

"රස්සාව....! රෙඩ් මිනිස්ටර් මරන්න?" බණ්ඩා විශ්මයෙන් ඇසිය.

"ඔව් ජේම්ස්. තමුසෙට ඒක තේරුම් නොගිය එක පුදුමයි. මේ මිනිහ මරා දමන්න මගේ දක්‍ෂකම ඕනවෙලා තියනවා"

"කාටද?"

"සී. අයි. ඒ. එකට. ඒකෙ ජෝන් ස්මිත්ට"

"තමුසෙට මේ මිනිහ මරා දැමීමෙන් ඇති පලේ මොකද?"

"නිකම් නොවෙයි. මහන්සියටත් වැඩිය සල්ලි ලැබෙනවා"

"කොච්චරද?"

"රුපියල් ලක්‍ෂ දෙකක්....!"

"එහෙනම් අර රුසියන්කාරය මරා දැම්මෙත් තමුසෙද?"

"එහෙම වැඩක් කරන්න මේ රටේ වෙන කෙනෙක් ඉන්නවද ජේම්ස්?"

බණ්ඩා සිනාසුනේය.



"ජිමී තමුසෙ විහිළු කරනවද? ඔන්න ඔය පිස්සු අදහස අත්හැර දානව"

"මම විහිලු කරන මිනිහෙක් නොවෙයි. තමුසෙගෙ පාස්පෝට් එකෙන් මම මේ පැත්තට රිංගා ගත්තා. දැන් ඉතින් ඉතුරු හරිය බොහොමත්ම ලේසියි"

"එහෙමනම් අර අනිත් මිනිසුන්ගෙත් මාරය තමුසෙ"

"ඔව්... අර හෝටලේදි තමුසෙ මරන්න ආපු දෙන්නත් එච්චෙ මම"

"පුදුමයි. එහෙනම් තමුසෙ උන්ට වෙඩිතියල මරා දැම්මෙ?"

"උන් මම අඳුරන්නෙ නැහැ. එච්චෙ සී. අයි. ඒ. එකෙන් බිල්ලට. මගේ බිල්ලට"

"තමුසෙ හරි මෝඩයෙක් ජිමී. තමුසෙ බ්‍රිගේඩියර්ගෙ මිනිහෙක්. 00 සෙක්ෂන් ඔෆිසර් කෙනෙක්. කෝ තමුසෙගෙ පක්‍ෂපාතීත්වය. කෝ අපේ මිත්‍රකම? මේ මිනිහ මැරුණොත් මාත් ඉවරයි"

"වැඩේ අවසානයක් කළායින් පස්සෙ මොනව වුනත් කමක් නැහැ. ඒව මට උවමනාවක් නැහැ. මිනීමැරීම රක්‍ෂාව වශයෙන් කරන මිනිහෙකුට මොන පක්‍ෂපාතීත්වයක්ද? මොන යාලු කමක්ද?" යි ජිමි සරදම් ස්වරයෙන් ඇසිය.

ජිමී කොරයා විහිළු නොකරන බව වටහා ගත් බණ්ඩා කල් යල් බලා ඔහු වෙත පැන්නේ කොටියෙකු

ගොදුරක් කරා පතිත්තාක් මෙනි. එහෙත් ජිමී කොරයා එය බලාපොරොත්තුව සිටියේය.

බණ්ඩා ඉදිරියට පතිතවාත් සමග ජිමී තුවක්කුව උස්සා බණ්ඩාගේ හිසට වේගවත් පහරක් දුන්නේය.

බණ්ඩා හිස බදාගෙන බිම වැතිරිණි.

"අයියෝ....!" ඔහු කෙඳිරිගාන්නට විය.

"තමුසෙ හරි මෝඩයෙක් බණ්ඩා!" යි පවසමින් තලතුනා මිනිසා වහා ක්‍රියාකාරී විය. ක්‍රමාණුකූලව සාක්කුවෙන් ලනුවක් අතට ගත් ඔහු බණ්ඩාගේ දෑත් පිටුපසට එක්කොට තරයේ බැඳ ගැටය තද කලේය.

"මෙහෙම කරන්න සිද්ධවුනාට මම කණගාටු වෙනවා ජේම්ස්. ඒත් මම තමුසෙව මරන්නෙ නැහැ. එහෙම කරන්නෙ මට මෙතැනින් පැනල යන්න ඕන හින්දයි"

ඉන්පසු ජිමී රයිෆලය අතට ගෙන පහල බංගලාව ඉදිරියේ සිසිල් පවන් සුව විඳිමින් පසු වූ රතු ඇමතියා වෙත ඉලක්කය එල්ල කලේය. ඔහු රයිෆලය වම් බාහුවට යටින් තබා කොකා ගැස්සීමට සූදානම් විය.

"ආ....! ඔන්න මිනිහ ටිකක් ඉස්සරහට ආව. දැන්නම් හොඳ එල්ලෙ. එක පාරින්ම මම වැඩේ දෙන්නම්"

පවසමින් ජිමී ඇඟිලි තුඩෙන් කොකා තද කිරීමට සූදානම් වූවා පමණි. එකම එක වෙඩි හඬක් නිකුත් විය. එහෙත් එය නොපැහැදිලි අව්‍යක්ත ශබ්දයකි. ජිමී කොරයා එක්වරම රයිෆලය අතහැර පපුව බදාගත්තේ මරණීය වේදනාවෙනි.



නුදුරින් වූ පඳුරක් අස්සේ සැඟවී සිටි බ්‍රිගේඩියර් එම් කුඩා රිවෝල්වරයක් අතැතිව සන්සුන්ව ජිමී කොරයා දෙසට ගමන් කරන්නට විය. බ්‍රිගේඩියර්ගේ රුව දකිත්ම කොරයා දෙනෙත් අයාගෙන විශ්මිතව ඔහු දෙසම බලා සිටියේ වේදනාව මොහොතකට අමතක කලාක් මෙනි.

බ්‍රිගේඩියර් කොරයා ලඟට පැමිණියේ මඳ සිනා රැල්ලක් මුව රඳවාගෙනය.

"සර්..... මෙහේ.....?" කොරයාගේ මුවින් ඉබේම නිකුත් විය.

බ්‍රිගේඩියර් එම් සන්සුන්ව පිළිතුරු දුන්නේය.

"මේක මගේ පොඩි ටෙස්ට් එකක් විතරයි. ජිමී මම දිගින් දිගටම කල්පනා කලා. අන්තිමේදී මට කල්පනා වුනා පහුගිය දවස් ටිකේ සිදුවුන මිනීමැරුම් කරන්න මේ රටේ ඉන්න එකම දක්ෂයා මගේ මිත්‍ර ජිමී කොරයාම විතරක් බව. ඒ දක්ෂකම තියෙන්නෙ එකම තැනැත්තෙකුට බව මට කල්පනා වුනා"

"සර්...!" ජිමී වේදනාවෙන් ඇඹරෙන්නට විය.

"ඔව් ජිමී! ඒ කල්පනාව ඇති වූ නිසා තමයි මම බණ්ඩා නුවර එළියට එව්වෙ. මම දැන ගත්තා බණ්ඩාට නොවරදවාම ජිමී මුණ ගැහෙන බව. එතකොට තමුසෙගෙ නියම ප්ලෑන වැඩ කරන බවත් මම දැන හිටියා. ජිමී තමුසෙ අන්තිම මොහොතෙත් දක්ෂ අන්දමින් මිනිහෙක් මරන්නයි සූදනම් වුනේ. ඒත් මේකට නම් මට ප්‍රසංශා කරන්න බැරි විත්තිය තමුසෙ දන්නව නේ" බ්‍රිගේඩියර් තමා අත වූ ගිණිඅවිය බිම වැතිරි මරණීය වේදනාවෙන් සිටි ජිමීගේ මුහුනට එල්ල කරගෙනම සන්සුන්ව විමසීය.

"ඔව් සර්! මම දන්නව. දැන් ඉතින් සර් මට කරන්නෙ මොකද?"

"ජිමී දන්නවානේ අපේ නීතියෙ හැටි. ඇසට ඇසක්. උණ්ඩයට උණ්ඩයක්. රතු වින නායකයා මරා දැමීමට සූදනම් වීම ගැන ජිමීට නඩු පවරලා උසාවි ගෙනියන්න බැරිබව ජිමී හොඳටම දන්නවානේ. එතකොට අපි කරපු පරණ දේවල් කියන්න සිද්ධ වෙනවා. එහෙම නේද?"

ජිමී කොරයා සුසුමක් හෙලිය. වේදනාව අමතක කල ඔහු කෙටි සිනාවක් මුවගට නගා ගත්තේය.

"මට තේරෙනවා සර්. සර් කැමති විදියටම මම මැරෙන්න කැමතියි. උසාවි යනවාට වඩා ඒ විදියට මම කැමතියි" ඔහු කිය.

බ්‍රිගේඩියර් රයිෆලය ඔසවා ජිමී කොරයාගේ පපුවට එල්ල කලේය. ජිමී දෙනෙත් පියාගෙන සන්සුන්ව සිටියේය.

එකම වෙඩි හඬක් නිකුත් විය. බ්‍රිගේඩියර්ගේ 00 අංශයේ අති දක්ෂ මිනිමරුවා වශයෙන්ද, ගිජුළිහිණියා යන විරුදාවලියෙන් හඳුන්වනු ලැබූ ජිමී කොරයා පපුව බදාගෙන අවසන් හුස්ම හෙලිය.

බ්‍රිගේඩියර් මොහොතක් ජිමී කොරයාගේ මළමිනිය දෙස බලා සිටියේය.

අණතුරුව බ්‍රිගේඩියර් බණ්ඩා වෙත හැරුණේය.

"ජේම්ස් ඉක්මන් කරනව. පරක්කු වෙන්න කාලයක් නැහැ. වෙඩි ශබ්දෙ ඇහිල ගාඩ්ල ඉක්මණට මේ පැත්තට එන්න ඉඩ තියෙනවා"



ජේම්ස් බණ්ඩා තවමත් මෙහි සිදු වූ කිසිවක් තේරුම් ගත නොහැකිවාක් මෙනි. ඔහු අන්දුන්කුන්දුන්ව බ්‍රිගේඩියර් දෙස බැලීය.

"සර් එහෙම නම් මේ හැම දෙයක්ම ප්ලෑන් කරලයි මාව එව්වෙ?"

"ජේම්ස් මම දැන ගත්තා කොරයා පැන්ෂන් ගියාට නිකම් නොඉන්න වග. ඒක කොරයාගෙ වරදක් නෙවී. මිනිහගෙ මුළු ජීවිතේම ගතවුනේ මිනී මරන්න. මිනිමරපු මිනිහට ඒක විනෝදයක්. මුදල්වලටත් වඩා ත්‍රාසය නිසයි ජිමී මිනී මැරුවෙ. ඒත් මිනිහගෙ මරණෙ ගැන මම කණගාටු වෙනව. මේ වගේ මිනිහෙක් පුරුදුකරල ගන්න මට තව අවුරුදු ගණනක්ම ගතවේවි"

වෙඩි ශබ්දයෙන් තිගැස්සුණු ආරක්ෂක භටයන් කිහිප දෙනෙක් ඔවුන් සිටි දෙසට කලබලයෙන් යුතුව එන බව දුටු බ්‍රිගේඩියර් අවසාන වශයෙන් බණ්ඩාට ක්ෂණිකව උපදෙස් දුන්නේය.

"දැන් සිකියුරිටි ගාඩ්ස්ල ආපුවම කියන්න ඕන රෙඩ් මිනිස්ටර් මරන්න ආවේ ජිමී කොරයා බව. ඒ නිසා ජේම්ස් මිනිහව මරා දැම්ම බවත් කියන්න. හැබැයි මගේ නම විතරක් මේවට නිකමටවත් සඳහන් කරන්න එපා...තේරුනා නේද?" යි පවසමින් බ්‍රිගේඩියර් එහි පැමිණියාක් මෙන්ම පදුරු අතරේ සැඟවී අවතාරයක් මෙන් අතුරුදහන්ව ගියේය.

බණ්ඩා තනි විය. රයිෆලය අතට ගෙන ඔහු තමන් කරා තුවක්කු එල්ල කොට ගෙන ලඟාවන ආරක්ෂක භටයන් දෙස බලා සිටියේය. ජිමී කොරයාගේ මළමිනිය දෙස බැලූ ඔහු තමාටම තොල් මතුලා ගන්නට විය.

"මගේ සැකය හරි. ජිමී මේ හැම මිනීමැරුමක්ම සිදුකල බව මට නිකමට වගේ ඒත්තු ගියා. ඒත් මට ඒ ගැන මිනිහගෙන් අහන්න තරම් ශක්තියක් තිබුනෙ නැහැ. මම ඊයෙ රෑ මිනිහ හොයාගෙන ගියෙත් ඒ හින්දයි"

ආරක්ෂක භටයින් ජේම්ස් බණ්ඩා ඉදිරියට පැමිණ වෙඩි හඬ ගැන ප්‍රශ්ණ කල විට ඔහු මැරී වැටී සිටි ජිමී කොරයා දෙසට ඇඟිල්ල දිගු කලේය.

"තමුසෙලාගෙ ලොක්කා මරන්න ප්ලෑන් කරපු මිනීමරුවා තමයි ඔය ඉන්නෙ. දැන් මිනිස්ටර්ට බයක් නැතිව ලංකාවෙ ඕන තැනකට යන්න පුළුවන්" යි ඉන්පසු බණ්ඩා සන්සුන්ව සදහන් කලේය.

ආරක්ෂක භටයින්ගේ නෙත් මද වේලාවක් මේ අති දක්ෂ මිනීමරුවාගේ මෘත දේහයට දෙසට යොමුවී තිබිණි. ජිමී කොරයා ඔහුගේ වෘතියෙන් සදහටම විශ්‍රාම ලැබීය. ඔහු මිනීමැරීම සඳහා ජීවත් වුවද, අපරාධකාරයෙක් වශයෙන් හංවඩු නොගසනු ඇත. ඔහුගේ අභ්‍යන්තරය දැන සිටියේ 00 අංශයේ බ්‍රිගේඩියර් එම් ඇතුළු එහි නිළධාරීන් පමණි.



## 8 වන පරිච්ඡේදය

මේසය කෙළවර වාඩිවී සිටියේ පුංචි බණ්ඩාර ඇල්ලේපොලය. ඔහුගේ මුවග ඉස්තරම් වර්ගයේ දුම් වැටියකි. මේසය වටා අසුන්වල තවත් පස්දෙනෙක් වාඩි වී සිටියහ. ඔවුන් හැම කෙනෙක්ම ඉතා අගනා යුරෝපීය ඇඳුම් ආයිත්තම් වලින් සැරසී සිටියහ. මේ අතර ඇල්ලේපොල ඉදිරියේ වූ යම්කිසි මෙවලමකින් සිහින් "බර්... බර්.... බර්" යන හඬක් නිකුත් විණි.

"එන්න ඇතුලට" ඇල්ලේපොල යන්ත්‍රයට මුහුණ ලංකර කිවේ එහි වූ බොත්තමක් තද කරන අතරය.

කාමරයේ දොර විවෘත විය. ජෝන් ස්මිත් කාමරය තුලට ඇතුල් කළ හැඩි දැඩි පුරුෂයා යලි දොර වසා දමනු ලැබීය. ඇල්ලේපොල හිස්ව තිබූ අසුනක් ස්මිත්ට පෙන්නූ විට ඔහු ඉදිරියට පැමිණ අසුන් ගත්තේය.

මද වේලාවක නිහැඬියාවක් පැවතිණි. ඇල්ලේපොල අසුනින් නැගිට මේසය වටා රැස්ව සිටියවුන් දෙස තියුණු බැල්මක් හෙලීය.

"මහත්වරුනි...." යි ඇල්ලෙපොල අනතුරුව කතාව ඇරඹීය.

"අද අපිට ප්‍රීතිමත් දවසක්. ඒ වගේම විශේෂ වැදගත් දවසක්. මම එහෙම කියන්නෙ මොකද කියල ඔබලට තවම වටහා ගන්න බැරුව ඇති. ඔව්, මම දැන් තෝරල දෙන්නම්" යි පැවසූ ඔහු මේසය කෙළවරේ අසුන් ගත් ජෝන් ස්මිත් දෙසට හැරුනේය.

"නොම්බර හයේ ආසනයේ වාඩිවෙලා ඉන්න මිස්ටර් ජෝන් ස්මිත්ව මේ මහත්වරු කවුරුත් අඳුනනව ඇති. අපේ සර්ව බලධාරී සී. අයි. ඒ. සංවිධානයට ඇමරිකා එක්සත් ජනපදයෙන් එව්ව නායකයා මේ. තමුන්නාන්සේලා ස්මිත් දැක්ක පළමු අවස්ථාව මේක වුනත් එයා ගැන නාහපු කෙනෙක් අපි අතරෙ ඉන්නවා ඇති කියල මම නම් සැක කරන්නෙ නැහැ" යි පවසත්ම හැම සාමාජිකයෙකුගේම නෙත් ස්මිත් කරා යොමු විය.

"මහත්වරුනි, ජෝන් ස්මිත් මහතා ශ්‍රී ලංකාවේ පාතාල ලෝකයේ බලවත් නායකයෙක් බව විස්තර කිරීම අනවශ්‍යයි. බ්‍රිගේඩියර් එම්ට මෙතෙක් විනාශ කල නොහැකිව තිබුනෙ සී. අයි. ඒ. එකත්, මේ ස්මිත්ගේ ක්‍රයිම් සින්ඩිකේට් එකත් පමණයි. බ්‍රිගේඩියර්ගෙ ඇස්වලට වැලි ගසමින් තමන්ගේ අන්තර්ජාතික අභිරහස් ව්‍යාපාර ඉතාමත් සාර්ථක අන්දමට පවත්වාගෙන යාමට තරම් දක්ෂ කමක් ස්මිත්ට තියනවා. ඒ දක්ෂකම ගැන සී. අයි. ඒ. එක හොඳටම පැහැදිලි කරගත් නිසා තමයි එයා ඇමරිකාවෙන් ශ්‍රී ලංකාවට එවන්න තීරණය කලේ. ඒ නිසා අපි අපේ සංවිධානය වෙනුවෙන් ජෝන් ස්මිත් මහතාව අපේ හර්ද වලින්ම අගේ කරමු" යි පවසත්ම සාමාජිකයන් හැම දෙනෙක්ම එකවර අසුන් වලින් නැගී සිට අමුතුම ක්‍රමයකට ආචාර කොට නැවතත් අසුන් ගත්හ.

ඇල්ලේපොල අතර මග නැවතූ කතාව යලි ආරම්භ කලේ ගාම්භීර ලෙසටය.



"මහත්වරුනි පසුගිය හය මාසය ඇතුලත අපි ඉතාමත් සාර්ථක වැඩ කටයුතු කිපයක් ඉටු කර ගත්තා. සී. අයි. ඒ. එකට විරුද්ධ ප්‍රධාන පෙලේ දේශපාලන නායකයන් කිප දෙනෙක්ම මරා දැම්මා. මහා පරිමාණයේ බැංකු මංකොල්ල දෙකක් ක්‍රියාත්මක කලා. රට හැම තැනම කලකෝලාහල, වැඩ වර්ජණ ඇති කලා. අපේ සාමාජිකයන් හැම දෙනෙක්ම ඒ හැම ක්‍රියාවටම ඉතා උනන්දුවෙන් සහයෝගය දුන්නා. ඔවුන් හැමටම මම සී. අයි. ඒ. සංවිධානය වෙනුවෙන් කෘතඥ වෙනවා!" යි පැවසූ ඇල්ලේපොල මොහොතක් හිස පහලට නැමුරු කොට ගෙන නිහඬව පසුවිය.

"තවත් කාරණයක් මහත්වරුනි. අපේ වැඩ පිලිවෙල සාර්ථක වීමට ප්‍රධාන වූ පුද්ගලයා කවුද කියන එක තවමත් මේ මහත්වරුන්ට රහසක් බව මම දන්නවා. ඒ පුද්ගලයා ...... ඒ විශේෂඥයා දැන් මළවුන් අතරට ගිහින් නිසා මම ඒ නම හෙලි කිරීමේ වරදක් නැහැ. ඒ පුදුමාකාර විශේෂඥයාගේ නම තමයි ජිම් කොරයා. ඔහුට ගිජු ලිහිණියා කියලත් කියනවා. සී. අයි. ඒ. එකට විරුද්ධව කටයුතු කල කොමියුනිස්ට් නායකයන් ඉතාමත් රහසිගත අන්දමින් මේ ලෝකෙන් තුරන් කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ මට නොවෙයි. ඒ ගිජු ලිහිණියා නොහොත් ජිම් කොරයාටයි" යි ඔහු සාඩම්බර ලීලාවෙන් පැවසීය.

"ජිම් කොරයා ගැන මට විශේෂයෙන් යමක් සඳහන් කරන්න තියනවා. ඔහු මුලින්ම වැඩ කලේ බ්‍රිගේඩියර් එම්ගෙ රාජ්‍ය රහස් සංවිධානයට" යි පවසත්ම කාගේත් මුහුණුවල සැක සහිත බැල්මක් ඇති විය.

"ගිජු ලිහිණියා ඉස්සර 00 සෙක්ෂන් එකට වැඩ කලා. ඔහු පැන්ෂන් ගියාට පස්සෙ ඒ දක්ෂකම් වලින් ප්‍රයෝජන ගන්න ඕන බව මම හිතා ගත්තා. ඒ වගේම

මම පසුගිය හය මාසය ඇතුලත ජිමීගෙ දක්ෂ කමින් උපරිම ප්‍රයෝජන ගත්තා. ඒත් මහත්වරුනි.......... මට කණගාටුයි කියන්න.......!" යි පවසමින් ඇල්ලේපොල මේසය මත දමා තිබූ බස්තම අතට ගත්තේය.

"ජිමීගෙ ඒ අකල් මරණෙ සිදුවුනේ අපේම සාමාජිකයෙකුගෙ නොසැලකිලිමත් කම නින්දයි!" යි පවසත්ම මේසය වටා වාඩි වී සිටි සාමාජිකයෝ නොසන්සුන් වනු පෙණිනි.

"ජේම්ස් බණ්ඩා, ජිමී කොරයා ලඟින් ආශ්‍රය කරන බව දැනගත් හැටියෙම ඔහු මරා දාන්න මම නියෝග කලා. ඒත් අපේ සාමාජිකයෙක් මගේ ඉල්ලීම ඉටු නොකල නිසා ජිමීට වෙඩි කාලා මැරෙන්න සිද්ද වුනා. එහෙම නේද මිස්ටර් ස්මිත්?"

ඇල්ලේපොලගේ අවසාන වචන දෙක තරමක් උස් හඬින් නික්මිණි. ජෝන් ස්මිත් ඉබේම අසුනෙන් නැගිට්ටේය.

"චීෆ්.....! ජේම්ස් බණ්ඩව මරන්න මම මගේ හොඳම ගෝලයො යෙදෙව්වා. උන් ඒ වැඩේ අජසෙට් කලා" ඔහු නිදහසට කරුණු දැක්විය.

"නමුත් මිස්ටර් ස්මිත්, ජිමීගෙ මරණෙ ගැන වගකීම තමන් බාර ගන්න ඕනෙ. මම වැඩේ බාර දුන්නෙ තමුන්ටයි" ඇල්ලේපොල සාවදානව කිය.

"ම.... මට සමාවෙන්න චීෆ්.........!"

ඇල්ලේපොල සිනාසුනේය. "දුබලයන්ට සී. අයි. ඒ. සංවිධානය ඇතුලෙ තැනක් නැති බව මිස්ටර් දන්නවා නේද?" ඔහු මතක් කර දුන්නේය.



ජෝන් ස්මිත් මොහොතකට වෙව්ලන්නට විය. මේසය වටේ අසුන් ගෙන සිටි අනික් සාමාජිකයන්ගේ මුහුණුවල භීතිය පැතිර යනවා පෙණින.

"මට බොහොම කණගාටුයි මිස්ටර් ස්මිත්. අපි වෙන ලෝකෙකදි මුණ ගැහෙමු!" ඇල්ලේපොල සිහින් හඬින් පවසත්ම ඔහුගේ අතේ ඇඟිල්ලක් සැරයටියේ තිබූ බොත්තමක් කරා ගියේය. ඒ සමගම ජෝන් ස්මිත්ද ක්ෂණිකව තම කබා සාක්කුවට අත දමා රිවෝල්වරයක් එලියට ඇද ගත්තේය.

එහෙත් ස්මිත්ගේ ස්වයංක්‍රීය රිවෝල්වරය එලියට ඒමට පෙර ඇල්ලෙපොලගෙ සැරයටිය තුලින් විහිදුනේ තියුණු මුවහත් ඇති වානේ පිහිතලයකි. එය වේගයෙන් ගොස් ජෝන් ස්මිත්ගේ පපුව තුලට කිඳා බැස්සේය.

කවුරුත් භීතියට පත්ව බලා සිටියා විනා, වචනයකුදු නොදෙඩූහ. දෙඩීමේ වරප්‍රසාදය ලබා සිටියේ ඇල්ලේපොල පමණි. කාගේත් ඇස් ඉදිරිපිටම ප්‍රබල සී. අයි. ඒ. නායකයෙක්ව සිටි ජෝන් සමිත්ට අයත් වූ ඉරණම කාහටත් පාඩමක් විය.

පිහිතලය පපුව තුලට කිඳා බසිත්ම සමිත් බිහිසුණු හඬක් නැගීය. ඔහු පපුව දැතින් බදාගෙන සෙමින් පුටුවත් පෙරලාගෙන බිමට ඇලවී ගියේය. ඉන්පසු සදහටම නොහරින සේ නෙත් පියා ගත්තේය.

ජෝන් ස්මිත්ට ක්ෂණික මරණයක් අත්කර දීමට හේතු වූයේ සැරයටිය තුල වූ පිහිතලයට උග්‍ර විෂක් පොවා තබීමය. ඒ විෂ ශරීර ගතවූවාට පසු තත්පර ගණනක් තුලදී ඕනෑම ශක්තිමත් පුරුෂයෙක් පවා ජීවිතක්ෂයට පත් කරනවා ඇත.

මළ මිනිසාගේ ලෙයින් බුමුතුරුණ තෙත්වන අතර ඇල්ලේපොල තම අවසන් නොවූ දේශණයේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්නට විය.

"සාමාජික මහත්වරුනි, ජෝන් ස්මිත්ගේ මරණෙ අපි කොයි කවුරුත් පාඩමකට ගන්න ඕනෙ. සේවය පැහැර හරින කොයි කාටත් පොදුවෙ ලැබෙන දඬුවම තමයි මරණය. ඒක මට කියල විශේෂයක් නැහැ. ස්මිත් අදක්‍ෂ නොවුනා නම් මෙලහකට මුළු ශ්‍රී ලංකාවෙම පාලන බලය අපි අතට අරන් ඉවරයි. ජිමී කොරයා ලව්වා රටේ වාමාංශික නායකයින් මරවලා පාලන බලය ලෙහෙසියෙන්ම සී. අයි. ඒ. එකට අල්ල ගන්න ඉඩ තිබුණු අවස්ථාව අවාසනාවන්ත ලෙස නැතිව ගියා. අන්න ඒ නිසයි ජෝන් ස්මිත්ට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිදුවුනේ" යි පැවසූ ඇල්ලේපොල මදක් නිහඬව බලා සිටියේය.

අනතුරුව වැදගත් යමක් පැවසීමට සැරසෙන්නාක් මෙන් දබරැඟිල්ල දිගු කොට නළල්තලය රැලි කලේය. එවිටම, එක් පසෙක තිබූ යකඩ දැල් ගැසූ බලු කූඩුවක් සැනෙකින් විවෘත වෙන්ම දැවැන්ත බලු තඩියෙක් එලියට පැන ඇල්ලේපොලගේ දෙපා ලෙව කන්නට පටන් ගත්තේය. ඔහු බල්ලාත් කැටුව මල මිනිසා වෙතට පිය නැඟුවේය.

බල්ලාට මිනිස් ලේ ඉව වැටිනි. අධික සාගින්නෙන් වෙලී සිටියෙකු මෙන් මල මිනිසාගෙන් ගලා ගිය ලේ දහර ලෙව කන්නට වූ අතර ඇල්ලේපොල ඌට නොපැහැදිලි බසකින් යමක් කීය.

බල්ලා මහත් ආයාසයෙන් මළමිනියේ එක් අතක් කට තුල රුවාගෙන මළ සිරුර ඇදගෙන යන්නට විය. ඇල්ලේපොල ඉස්සරහින් ගමන් ගත්තේ මග පෙන්වන්නා මෙනි. සාමාජිකයින්ද, ඔහු අනුගමණය කිරීමට වූහ.



ගොඩනැගිල්ලේ පිටිපස කෙළවර විශාල දිය තටාකයකි. යටින් සවිකල නල මගින් තටාකයට මුහුදු ජලය සැපයෙයි. තිල් කැටයක් වැනි ජලය වරින් වර කැළඹුනේ තටාකය තුල සිටි විශාල මසුන් දෙදෙනෙකුගේ පොරකෑම් නිසා විය හැක. ඇල්ලේපොල තම සාමාජිකයින් සමග තටාකය කෙළවරේ නැවතුනේය.

බල්ලාද මළමිණිය ඇදීම නවතා හති දමමින් හාම්පුතා දෙස බැලීය. තටාකය දෙස බැල්මක් හෙලූ ඇල්ලේපොල අනතුරුව මළමිණිය ඔසොවා එක්වරම තටාකය තුලට දැමීය. මොහොතකින් දැවැන්ත මිනි මෝරෙක් මළ කඳේ දකුණු අත ඩැහැගෙන අනෙකා ලඟා වීමට පෙර පසෙකට පිහිනා ගියේය. ඉතිරි මෝරා මළමිණියේ හිස වටා කරකැවී මිනි මස් බුදින්නට විය.

පැය කාලක් වැනි සුළු කාලයක් තුලදී ජෝන් ස්මිත්ගේ මළමිණියේ ඇටසැකිල්ල පමණක් දිය යටට කිඳා බැස ගිය නමුදු මිනී මෝරුන් දෙදෙනා වරින් වර ඒ කරා ගොස් එකිනෙකා පොරකමින් ඉව අල්ලමින් සිටින අන්දම පෙණුන.

මොහොතක් මේ බියකරු දර්ශණය දෙස මහත් උද්යෝගයකින් බලා සිටි පුංචි බණ්ඩාර ඇල්ලේපොල බල්ලාට අතින් සංඥා කරමින් ආපසු හැරුනේ ඉතාමත් තෘප්තිමත් ස්වභාවයකිනි. මිනිස් ලේ දකින විට, මරණීය වේදනාවෙන් මිරිකෙන අවසන් හුස්ම හෙලන්නට උත්සාහ දරන මිනිසුන් දකින විට ඇල්ලේපොලගේ ගතට නව ජීවනයක් ඇතුළු වෙයි. නව යෞවනයෙකු මෙන් එඩිතර භාවයක් නිතැතින්ම සිතට තුරුළු වෙයි. ඒ ඔහු තුල මිනිස් ලේ හැලීමට, මිනිස් ඝාතනයට තිබූ දැඩි ඇල්ම නිසාය.

## *9 වන පරිච්ඡේදය*

**ජේ**ම්ස් බණ්ඩා සැහැල්ලු ගමනින් පැමිණ විමසීම් පුවරුවේ සිටි රූමත් තරුණිය වෙත ලඟා විය. ඇය දෙස ප්‍රේමාන්විත බැල්මක් හෙලූ හෙතෙම "සුභ උදාසනක්!" යි ඇයට සුභ පැතීය.

තරුණිය බණ්ඩාගේ කටහඬින් තිගැස්සී හිස ඔසවා බැලුවාය. ඔහු කවරෙක්දැයි හඳුනා ගනිත්ම ඇගේ මුහුණේ සොම්නස් සහගත පෙණුමක් ඇති විය.

"හලෝ ජේම්ස් ගුඩ් මෝනින්. මම බ්‍රිගේඩියර්ට ඔබ ආ බව කියන්නම්"

"තෑන්ක් යූ!" කියමින් ජේම්ස් බණ්ඩා විදුලි සෝපානයට ඇතුළු වූ මොහොතේම දොර වැසී යනු පෙණිනි. විනාඩියක් ගතවීමට ප්‍රථම ඔහු විසිඑක්වෙනි මහලේ පිහිටි බ්‍රිගේඩියර් එම්ගේ මැදිරිය තුලට ඇතුල් විය.

බ්‍රිගේඩියර් එම් කැරකෙන පුටුවේ වාඩි වී චෙරූට් සුරුට්ටුවක් උරමින් පසුවනු පෙණිනි. බණ්ඩාගේ රුව දකිත්ම ඔහු දෙවරක් හිස සැලීය.

"ජේම්ස් නියම වෙලාවට ආවෙ! කොහොමද නිවාඩුව හොඳින් ගත කලාද?"



"එහෙමයි සර්.... මම ජිමී කොරයගෙ මළ ගමටත් සහභාගි වුනා" බණ්ඩා පිලිවදන් දිනි.

"ජිමී ගැන මට කණගාටුයි. කොහේද මිනිහගෙ ආදාහන උත්සවය තිබුනෙ?"

"මිනිහගෙම ඉඩමෙ පුංචි කඳු ගැටයක් උඩ ජිමීව මිහිදන් කලා. මළ ගමට මමයි සෙක්ෂන් ඔෆිසර්ස්ලා හතර දෙනෙකුයි විතරයි හිටියෙ. ගිජුලිහිණියා අප්‍රසිද්ධියේ ජීවත් වුනා වගේම අප්‍රසිද්ධියේම මළවුන් අතරට ගියා"

"ජිමී කොරයගෙ අවසානය ඒ විදියටම සිද්ධ වෙන්න ඕනෙ. වෙන කිසිම පිලියමක් නැහැ!" බ්‍රිගේඩියර් එම් බිත්තියේ එල්ලා තිබූ ලංකාවේ විශාල සිතියම දෙස නෙත් හෙලමින් මද වේලාවක් කල්පනාවේ නියැලී සිට කීය.

බ්‍රිගේඩියර් ලංකා සිතියම දෙස බලන්නේ ඉතා කලාතුරකිනි. බණ්ඩා එය සිත්හි සනිටුහන් කොට ගෙන බොහෝ කල්ය. ලංකා සිතියම දෙස බැල්මක් හෙලුවහොත් බ්‍රිගේඩියර් අධික සිත් තැවුලකින් පසුවන බව බණ්ඩා තේරුම් ගනියි. රටට ජාතියට විනාශයක්, උපද්‍රවයක් ලංවන විට පමණි බ්‍රිගේඩියර් එම්. ශ්‍රී ලංකා සිතියම දෙස බැල්මක් හෙලන්නේ.

ඉන්පසු බ්‍රිගේඩියර් මේසය මත වූ මෙවලමක බොත්තමක් තද කරත්ම බිත්තියේ තිබූ විශ්මයජනක රහස් දොරක් විවෘත විණ. ඒ අතරින් තරමක් ලොකු රාක්කයක් දිස්විණ. රාක්කය මත තැන්පත් කර තිබුනේ අලංකාර පුෂ්පයන්ගෙන් සාදන ලද මල්වඩමකි. බණ්ඩා දෙනෙත් මහත් කොට ගත්තේය.

"කාටද සර් මේ මල්වඩම?"

"වෙන කාටද ජේම්ස් මේ මට මිසක්!"

බණ්ඩාට එය විශ්වාස ගත නොහැකි විය. බ්‍රිගේඩියර් තමාට විහිළුවක් කරන්නේදැයි වරෙක ඔහුට සිතිණි.

"සර් මට විහිළු කරනවද?"

"නැහැ ජේම්ස් මම සීරියස්" කියමින් අසුනෙන් නැගිට ගත් හෙතෙම මල්වඩම තිබූ රාක්කය වෙත ගොස් බණ්ඩාටද එහි ලඟා වනසේ සන් කලේය. මල්වඩමට අමුණා තිබූ කාඩ්පත දෙස ඇඟිල්ලක් දිගුකල හෙතෙම අනතුරුව බණ්ඩාගේ විශ්මිත මුහුණ දෙස බැලීය.

"පේනව නේද? බ්‍රිගේඩියර්ට නිවන් සැප ලැබේවා කියලා මේ මල්වඩම එවල තියෙන්නෙ සී. අයි. ඒ. සංවිධානයෙන්" යි බ්‍රිගේඩියර් එම් අඩ සිනාවක් පාමින් කීය.

"සර් මොකද්ද මේ ගැන කරන්න අදහස් කරන්නෙ?"

"මට රහස් ඔත්තුවක් ලැබුණා. පෙරේදා උසස් සී. අයි. ඒ. සාමාජිකයන්ගේ ටොප් සීක්‍රට් සාකච්ඡාවක් පවත්වලා තියනවා. ඒ සාකච්ඡාවෙදි සම්මත වෙලා තියනවා මාව මරා දමන්න. මේ අතර ජෝන් ස්මිත්ගෙ දුර්වල කම නිසා ජිම් කොරයා සී. අයි. ඒ. එකට අහිමි වුන නිසා සංවිධානෙ නායකයා කිසිම අනුකම්පාවක් නැතිව ජෝන් ස්මිත්ව මරා දැම්මලු"

"ඒක ඇත්ත! ජෝන් ස්මිත් ඒ,කටයුත්ත බාරදීලා තිබුණෙ වෙන ගෝලයො කිහිප දෙනෙකුටයි. උන් හරියට වැඩේ කලේ නැහැ!"



"මේ කොන්ෆරන්ස් එක තිබුණෙ අගනුවර තට්ටු පහලොවක් උස ගොඩනැගිල්ලක අවසාන තට්ටුවෙ. මේ තට්ටුවට නගින්න පඩිපෙලක් නැහැ"

"පුදුමයි.....! එහෙනම් කොහොමද ඒ තට්ටුවට නගින්නෙ?"

"ලිෆ්ට් එකකින්. ඒ ලිෆ්ට් එක වැඩකරන්නෙ ඒ තට්ටුවට විතරයි. ඒක තියෙන්නෙ රහසිගත තැනක. ඒකෙ යන්න පුළුවන් සී. අයි. ඒ. සාමාජිකයන්ට පමණයි"

"මේ සිද්ධියට ඔය ලිෆ්ට් එක ගැන සර් මට මෙච්චර කරුණු දක්වන්නෙ ඇයි?"

"ඒකට හේතුවක් තියනවා ජේම්ස්. අපි අල්ල ගත්ත කාල් එදිරිසිංහගෙ, ඉන්දිකා කියන සී. අයි. ඒ. ඒජන්ට්ව කතා කරවන්න ඩන්ජන් එකේ සැම් නුගේරා සහ ටයිගර් සමත් වුනා. සී. අයි. ඒ. කාරයනගේ රහස් මූලස්ථානය තියන තැන ගැන සියළුම විස්තර ඒ ගෑනි ඔවුන්ට හෙලි කරල තියනව" යි බ්‍රිගේඩියර් නිවුන සුරුට්ටුව යලිත් ගිණියම් කර ගත්තේය. ඉන්පසු තීරණාත්මක ගැඹුරු හඩකින් යලිත් කතා කරන්නට විය.

"මේ සතිය ඉවර වෙන්න කලින් ජේම්ස් මේ සී. අයි. ඒ. කාරයො එකෙක් නැර විනාශ කරන්න ඕනේ. දැනට ලංකාවෙ ඉන්න සී. අයි. ඒ. කාරයින්ගෙ ලැයිස්තුවක් වහාම එවන හැටියට ජනාධිපති මට ඕඩර් එකක් එවලා තියනවා. මම ඩන්ජන් එකේ කැප්ටන් සැම් නුගේරට දැන්ම කෝල් එකක් දෙනවා බණ්ඩා එහෙ එන බව දන්වලා. අවශ්‍ය විස්තර සැම්ගෙන් දැන ගන්න. ඒ යන ගමන් අපේ ප්‍රොෆෙසර් "Q" මුණ ගැහෙන්න. එයා ලඟ අළුත් ගැජට් කිපයක් තියනවා ජේම්ස්ට අත්හදා බලන්න දෙන්න"

ජේම්ස් බණ්ඩා බ්‍රිගේඩියර්ගෙන් සමුගෙන 00 අංශයේ පාතාල සිරගෙයට පිවිසෙන දොරටුව වෙත ළඟා විය. එය පිහිටා තිබුණේ ගොඩනැගිල්ලේ බිම් මහලේ රහස් ශාලාවක් තුලය. පාතාල සිරගෙය බාර කැප්ටන් සෑම් නුගේරා බණ්ඩා දුටු හැටියේම දොර විවෘත කලේය.

"බ්‍රිගේඩියර් මට මේ දැන් ටෙලිෆෝන් කලා බණ්ඩට උදව් කරන්න කියලා" සෑම් පැවසීය.

"තෑන්ක් යූ කැප්ටන්!" පවසමින් බණ්ඩා අඳුරු ගුබ්බෑයමේ කෙළවරේ අසුන් ගෙන සිටි සෑම් වෙත ගමන් කරන්නට විය.

"ජේම්ස් දන්නවද කොළඹ කොටුවෙ කොඩි ගහ ළඟ තියන තට්ටු පහලොවේ ගොඩනැගිල්ල. අන්න එතන තමා සී. එයි. ඒ. මධ්‍යස්ථානය තියෙන්නෙ. හැබැයි එතනට යාම එච්චර ලේසි නැහැ"

"ඒ මොකද?"

"හැම දොරටුවකම ඉන්නවා මිනීමරන්න පුහුණු කරපු ආරක්ෂක හමුදාවක්. පිටස්තර කිසිම කෙනෙකුට, විශේෂයෙන්ම, අවිශ්වාසයි කියල හිතන කිසිම කෙනෙකුට ඒ පලාතකටවත් යන්න ලැබෙන්නෙ නැහැ"

"කවුද සී. අයි. ඒ. එකේ නායකයා?"

"පුංචි බණ්ඩාර ඇල්ලේපොල කියලා ලොකු බිස්නස් කාරයෙක්. නමුත් මිනිහා කවදාවත් ඒ ගොඩනැගිල්ලට ඇවිත් නැහැ. හැම ඕඩර් එකක්ම දෙන්නෙ ට්‍රාන්ස්මීටර් එකෙන්. පුංචි බණ්ඩාර ඇල්ලේපොල හරි භයානක මිනිහෙක් බවටයි ආරංචිය"



"මුළු සංවිධානයම ඔය ගොඩනැගිල්ලට හැමදාම එක් වෙනවද?"

"නැහැ! ඔවුන් හැම සිකුරාදාම රාත්‍රී නමයට එකතුවෙලා පැයක රැස්වීමක් පවත්වනවා සියලුම ආරක්ෂා විධිවිධාන යොදලා"

"සී. අයි. ඒ. මෙම්බර්ස්ලා පහලොස්වෙනි තට්ටුවට ඇතුල් වෙන්නෙ හරියටම අටයි පනස් පහට. ඊට පස්සෙ ලිෆ්ට් එක ලොක් කරල තියන්නයි ඕඩර්ස් දීලා තියෙන්නෙ නමුත් අපි ලිෆ්ට් එක ක්‍රියාකරවන්නාට විශාල අල්ලස් මුදලක් දීල අපේ පැත්තට හරව ගත්ත. මිනිහ අන්තිම සාමාජිකය ඇතුලට ගිය හැටියෙම ලිෆ්ට් එක පහළට යන බොත්තම තද කරාවි"

"එතකොට විශාල ආරක්ෂක වළල්ලක් බිල්ඩිම වටේ රැකවලට දාල තියෙද්දි කොහොමද මම පහළ තට්ටුවෙන් යන්නෙ?"

"තවත් විශේෂ රහස් කාරණයක් තියනව ජේම්ස්! ඔය ගොඩනැගිල්ලට පිටිපස්සෙ තියන අනික් ගොඩනැගිල්ලෙ කෙළවරේ තට්ටු දාහතරක් උසට නගින්න පුළුවන් යකඩ ඉණිමගක් තියෙනව. ඒ ඉණිමගෙන් උඩට නැගල අනික් බිල්ඩිමේ දාහතර වෙනි තට්ටුවෙ බැල්කනියට කොහොම හරි පැන ගන්න ඕන. ඊට පස්සෙ අපේ ඕඩර්ස් අනුව ලිෆ්ට් එක දාහතර වෙනි තට්ටුවෙ නවත්වනව. එතකොට මිනිහ ජේම්ස්ව පහළොස්වෙනි තට්ටුවට අරන් යාවි" සෑම් නුගේරා පැහැදිළි කරමින් කීය.

බණ්ඩා මොහොතක් කල්පනා කලේය. "මිනිහ හොඳටම විශ්වාසද? ඔහු විදුලි සෝපානයට අගුල් ලෑවොත් මාව දාහතරවනවන මාලයෙදි කොටු වෙන්න පුලුවන්"

සිකුරාදා රාත්‍රියේ කොළඹ වරාය අසලින් වැටී ඇති මාවතේ තැනින් තැන දැල්වෙන විදුලි පහන් ආලෝකය නිසා මාවත පුරා පහන් ආලෝකය පැතිරී තිබිණි. මේ මාවතේ කෙළවරේ පිහිටි තට්ටු පහලොවකින් සමන්විත ගොඩනැගිල්ලේ ඉහළම තට්ටුවේ පමණක් විදුලි පහණ් දැල්වුන නමුදු අනෙක් තට්ටු ඝණ අඳුරේ ගිලී තිබුණි. එපිත් වර ගොඩනැගිල්ල ඉදිරිපිට නැවැත් වූ දැකුම් කළු මෝටර් රථවලින් බැසගත් මිනිසුන් කිහිප දෙනෙක් ඇතුලට ගමන් කරනවා අඳුරේ සැඟවී සිටි ජේම්ස් බණ්ඩා දුටුවේය. ඔහු අඳුර තුලින් ගොඩනැගිල්ලේ පසුපසට ගමන් කොට ඊට යාබද ගොඩනැගිල්ල අයිනේ සැඟවී තම විමසිලිමත් දෑස් අඳුර සිසාරා විහිදිය. එම ගොඩනැගිල්ලේ ඉහළ මාලය තෙක් සවිකර තිබූ යකඩ ඉණිමග වෙත සීරුවෙන් ගමන් කල ඔහු ඉණිමග දිගේ ඉහළට නගින්නට විය.

අටයි පනහ වන විට ගොඩනැගිල්ල ඉදිරිපිට නැවතුනේ ඉතා අගනා බී. එම්. ඩබ්ලිව් වර්ගයේ මෝටර් රථයකි. සුදු යුනිෆෝමයකින් සැරසුන රියදුරෙකු විසින් පදවා ගෙන එනු ලැබූ මේ රථයේ පසුපස අසුනේ වාඩි වී සිටියේ ප්‍රමාණයෙන් කුඩා මිනිසෙකි. රත්තරන් විල්ලුවක් සවිකොට තිබූ සැරයටිය ඉදිරියට දිගු කර රථයෙන් බැසගත් ඔහු බිමට මුහුණ නැඹුරු කොට ගෙනම විදුලි සෝපානය කරා ගමන් කලේය. මොහොතක් ගත වීමට පෙර විදුලි සෝපානය ඇල්ලේපොල පහළොස්වන මහල කරා රැගෙන ගියේය. ඔහු කඩිනමින් ඔසොවිවෙන් පිටතට ගමන් කරනවාත් සමගම ඔසොවිව විදුලි වේගයෙන් පහළ මහල කරා බසින්නට විය.

ලිෆ්ට් යන්ත්‍රය ක්‍රියාත්මක කල සේවකයාගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඔසොවිව දාහතරවන මහලේ නතරව, ස්වයංක්‍රීය දොර විවර වූ සැනෙකින් කලු ඇඳුමෙන් සැරසුණු ජේම්ස් බණ්ඩා එතුලට පැන ගත්තේය.



තත්පර කීපයකින් විදුලි සෝපානය පහළොස්වන මාලයේ නතර විණ. දොර විවෘතවන්ම බණ්ඩා මුල්ලකට වී සැඟවී ගත් අතර ලිෆ්ට් ක්‍රියාකරු එකවරම භීතියෙන් දෙනෙත් අයා ගත්තේය.

පුංචි බණ්ඩාර ඇල්ලේපොල රිවෝල්වරයක් අතැතිව විදුලි සෝපානයේ දොරටුව අසලට වී බලා සිටියේය.

"සැම්සන්! උඹ ලිෆ්ට් එක දාහතර වන තට්ටුවේ නතර කලේ මොකද?" ඇල්ලේපොල වියරු හඬින් ගුගුලේය.

"බොස්....! මට ඉබේටම බටින් එක තද වුනා. ඒක නොදැනුවත් කමින් වුන දෙයක්" සැම්සන් නැමැත්තා බියගුළු හඬින් කිය.

"බොරු කියන්න එපා මිනිහෝ! උඹ අපේ සංවිධානෙට ද්‍රෝහි වෙන්නයි නේද සූදනම. සාමාජිකයෙක් අපට ද්‍රෝහි වෙන්න සූදනම් වෙනකොට මට ඉවකින් වගේ ඒක දැනෙනවා. උඹ කල වරදට මගෙන් කිසිම සමාවක් බලාපොරොත්තු වෙන්න එපා. සී. අයි. ඒ. එකේ කිසිම අනුකම්පාවක් නැහැ!" යි පවසමින් ඇල්ලේපොල අත වූ රිවෝල්වරයේ ලිවරය තද කිරිමට සූදනම් විය.

ඒ සැනින් ජේම්ස් බණ්ඩා තම කමිසයේ උඩ සාක්කුවේ තිබූ කුඩා ලයිටරය සැනකින් අතට ගත්තේය. ඉන්පසු ලිෆ්ට් ක්‍රියා කරු පසෙකට ඇද දමමින් ඔසොවිවේ දොරකඩ පෙරමුණට පැමිණියේය.

පුංචි බණ්ඩාර ඇල්ලේපොලගේ දෙනෙත් පුදුමයෙන් ඉලිප්පී ගියේය. ඒ නෙත් යුවළ දුටු ජේම්ස් බණ්ඩාද මොහොතකට වංචලව යනවා පෙණිත.

"හහ්.. හහ්.. හා..! විශේෂ නීති ආරක්‍ෂක' ජේම්ස් බණ්ඩා. ඔන කරන මිනිහ මගේ ලඟටම ආව එහෙනම්. තමුසෙට සී. අයි. ඒ. එකේ කිසිම අනුකම්පාවක් නැහැ. සංවිධානේ අනුකම්පාවක් ලැබුනත් මගෙන් නම් කොහෙත්ම සමාවක් නැහැ. හම් දැන් ඉතින් දෙවියන් සිහි කරගන්නව!" යි කී ඇල්ලේපොල අත වූ සයිලන්සරයක් සවි කර තිබූ රිවෝල්වරයේ ලීවරය තද කිරීමට සූදානම් විය.

එහෙත් බණ්ඩා තම කමිසයේ උඩ සාක්කුවෙන් ගෙන අතේ සඟවාගෙන සිටි කුඩා ලයිටරය එකවරම ඇල්ලේපොල දෙසට එල්ල කොට එය ක්‍රියාත්මක කරවන කුඩා බොත්තම දබරැඟිල්ලෙන් වරක් තද කළේය. එයින් නික්මුනු කහ පැහැති පරමාණු ගිණිසිළුව සී. අයි. ඒ. නායක පුංචි බණ්ඩාර ඇල්ලේපොලගේ ශරීරය වටා වෙලී ගියේය. ඔහු මහා විලාපයක් නංවත්ම, මොහොතකින් ඒ ගිණි වළල්ල මහා ගිණිජාලාවක් බවට පත්ව බිහිසුණු මිනිසා අළු ගොඩක් බවට පත් කර දැම්මේය.

ඉන්පසු ජේම්ස් බණ්ඩා තම කිහිල්ල යට සඟවා ගෙන තිබූ කෙටි මැෂින් තුවක්කුව ඉදිරියට එල්ල කර ගනිමින් ශාලාවේ දොර දෙසට දිව ගියේය.

හදිසියේ දැල්වුනු මහා ගිණි ජාලාවෙන් දැවියන ඇල්ලේපොලගේ මහා විලාපයේ ශබ්දය ශ්‍රවණය වූ සී. අයි. ඒ. සාමාජිකයින් තම තමන්ගේ ගිණිඅවි එල්ල කොට ගෙනම ඉදිරියට දිව එත්ම බණ්ඩා තම මැෂින් තුවක්කුව වේගයෙන් ක්‍රියාත්මක කරන්නට විය.

වෙඩි ප්‍රහාර වැදුණු සී. අයි. ඒ. මිනිමරුවන් කිහිප දෙනෙක්ම ලේ වගුරුවමින් මිය යනු පෙණුන. එවිටම ජේම්ස් බණ්ඩා ඔසොවිව තුලින් පසෙකට පැන විශේෂ ලයිටරය නැවතත් සූදනම් කර ගත්තේය.



ඉතිරි සී. අයි. ඒ. මැරවරයන්ද වෙඩි තැබීම ආරම්භ කලහ. එවිටම බණ්ඩා අත තිබූ කුඩා මෙවලම තුලින් යලිත් කහපාට පරමාණු ගිනි ජාලාවක් විහිදෙන්නට විය. ඒ ආලෝක ධාරාව සී. අයි. ඒ. මිනිමරුවන් වෙත එල්ල වෙත්ම ඔවුන් සියලු දෙනාගේම සිරුරු වල දැවටුන ගිනි ජාලාව ඔවුන් දවාලමින් මුලින් ඉදිරූ ගස් පේලියක් මෙන් බිම හෙලනු පෙණුන.

මොහොතක් ගත වීමට පෙර ඔවුන්ගේ සිරුරු තිබූ තැන්වල දක්නට ලැබුණේ දුම් දමන අළු ගොඩවල් කීපයක් පමණි.

ජේම්ස් බණ්ඩා පුදුමයෙන් යුතුව ඒ දෙස බලා සිටියේය. මුලු රටටම මහත් විනාශයක් කිරීමට කුමන්ත්‍රණ කළ බිහිසුණු සී. අයි. ඒ. අපරාධ සංවිධානයට මරු ප්‍රහාරයක් එල්ල වීම ගැන ඔහු මහත් සේ අභිමානයට පත් විය.

ඉන්පසු ජේම්ස් බණ්ඩා වහා තම අත තිබූ භයානක මෙවලමක් වූ අරුම පුදුම පරමාණු ලයිටරය සාක්කුවේ ලා ගත්තේ නැවත වරක් එය පාවිච්චි කිරීම අනවශ්‍ය බව මෙනෙහි කරමිනි.

**- අවසානය -**

**"*ගිජුලිහිණියා* " භයජනක නවකතාව කියවා රසවිඳි ඔබට අපගේ ස්තූතිය.**
**ත්‍රාස ප්‍රකාශකයෝ.**

# ගිජුලිහිණියා

# ජේම්ස් බොන්ඩ් - 2

ත්‍රාස - 07



[illegible]

මිල: 225/-

ISBN 955821706-0

ත්‍රාස ප්‍රකාශකයෝ

"ත්‍රාස" ප්‍රකාශකයෝ 149-A [illegible] නිවාස හෝකන්දර උතුර හෝකන්දර දුරකථනය: 2744818

Scanned by CamScanner